


+ කිර්තිසිරි ප්‍රනාන්දු

අතිගරු කිර්තිසිරි ප්‍රනාන්දු රදගුරු හිමිතුමන් දිර්ඝ එඬේර සේවයේ අත්දැකිම් සමග ලංකා සභා කුරුණෑගල දියෝකිසියේ වර්තමාන රදගුරුතුමා ලෙස ක්‍රියා කරයි. එසේම ලංකා දේවධර්ම විද්‍යාලයේ ගුරු සේවයේ අත්දැකිම් ඇතිව වර්තමාන විදුහල්පති ලෙස ද ක්‍රියා කරයි. අධ්‍යාපන කෙෂ්ත්‍රයේ හසල දැණුමක් ඇති මෙතුමා සමාජ විද්‍යාත්මකව බොහෝ දේ විග්‍රහ කරයි.



මහේෂ් හේමචන්ද්‍ර

මහේෂ් හේමචන්ද්‍ර පියනම ලංකා සභා කුරුණෑගල දියෝකිසියේ එඬේර සේවකත්වයේ 2004 සිට මේ දක්වාම අත්දැකිම් ලබමින් සේවය කරයි. තම මව් ප්‍රදේශය වන පොල්ගහවෙලින් ප්‍රාථමික අධ්‍යාපනය ලබා ද්විතික අධ්‍යාපනය කෑගල්ලෙන් ද ලබා ලංකා දේව ධර්ම ශාස්ත්‍රාලයේ කිතුණු අධ්‍යාපනය පිළිබඳ සහ මනෝවිද්‍යා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාධාරියකි. ලංකා දේව ධර්ම ශාස්ත්‍රාලයේ ශාස්ත්‍රවේදී උපාධිය ද කැළණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය ලබා දර්ශනපති උපාධිය කරමින් සිටි. එඬේර සේවය මෙන්ම එඬේර සේවයේ එක් පැතිකඩක් වන  අධ්‍යාපන කෂෙත්‍රයේ ද කටයුතු කරමින් සිටියි.

වර්තමාන එඬේර සේවය කරන්නට සිදුව ඇත්තේ නව විද්‍යා තාක්ෂණ දියුණුවත්, ගෝලියකරණය වු ආර්ථික ක්‍රියාවලියත්, සන්නිවේදනය හා ප්‍රවහන කෙෂ්ත්‍රයේ සිදුව ඇති විප්ලවාත්මක ප්‍රසාරණයත්, ජාතික ආගමික මෙන්ම දේශපාලනික අස්ථාවර භාවයන් සමඟ එඬේර සේවයේදී මුහුණ දිමට ඇති අභියෝග බොහෝය. කිතුණුවන් ලෙස ගත කරන දෛනික ජීවිතය, කිතුණු ප්‍රතිපදාව, ආගමික හැසිරීම් රටාව සෙසු කිතුණුවන් සමග මෙන්ම අනිත් ආගමිකයින් සමගද සම්බන්දතාවය තිරණය වන්නේ ආකල්ප මතය. සිහියෙන් යුතුව තැන නොතැන තෝරා බේරාගෙන වැඩදායි ලෙස එඬේර සේවයේ පදනම යෙදිමට මෙම පොත් පිංච වැදගත් වේ.



# එඬේර සේවයේ පදනම

කීර්තිසිරි ප්‍රනාන්දු
මහේෂ් හේමචන්ද්‍ර

**එඬේර සේවයේ පදනම**


@ කීර්තිසිරි ප්‍රනාන්දු
@ මහේෂ් හේමචන්ද්‍ර



frkeerth@gmail.com
revmsjh@gmail.com



<u>පළමු ප්‍රකාශනය 2019</u>
ලංකා දේව ධර්ම ශාස්ත්‍රාලයේ ප්‍රකාශනයකි.

මුද්‍රණය.
ක්‍රියේටිව් මුද්‍රණාලය
අංක. 159/6/බී, උඩුමුල්ල, ජයන්ති පාර,
හල්ඔලුව.




## පිදුම

මා සමඟ අවුරුදු 30 තිස්සේ

එඬේර සේවය ගැන හදාරන සහ

එඬේර සේවයේ යෙදෙන

මගේ ආදර ආලීන්ට.

## පෙරවදන

මා මේ පොත රචනා කිරීම ආරම්භ කළේ 2001 සිට 2005 දක්වා කැන්ටබරියේ අගරදගුරු වසමේ සේවය කරමින් කෙන්ට් සරසවියේ පශ්චාත් උපාධියක් හදාරණ අවධියේය. මේ සමයේ මාගේ පවුලේ කටයුතු නිසා, මා හට වැඩකටයතු අධික වුවත් මාගේ මානසික සුවය සඳහා මේ ග්‍රන්ථය රචනා කළ යුතුයැයි තිරණය කළෙමි. එහෙත් වෙනත් පොත් ගණනාවක් ලිවිමට මාගේ කාලය යොමු කළ නිසා මේ ග්‍රන්ථය එළිදැක්වීම වසරින් වසර ප්‍රමාද විය. 2019 වසරේ මගේ ශිෂ්‍යය මහේෂ් හේමචන්ද්‍ර පියනමගේ ද පොත පතේ හා සේවයේ අත්දැකිම් සමග "එඬේර සේවයේ පදනම" යන පොත සම්පූර්ණ කිරිමෙන් පසු ලංකා දේවධර්ම ශාස්ත්‍රාලය මගින් ප්‍රකාශයට පත් කිරීමට ලැබීම මහත් භාග්‍යයකි.

මේ ග්‍රන්ථයේ අන්තර්ගතය මා පතපොතින් ලත් දැනුම මාගේ අත්දැකීම් සහ දශක එකහමාරක් මේ විෂය පිළිමතලාවේ ලංකා දේව ධර්ම ශාස්ත්‍රාලයේ ඉගැන්වීමෙදී සිසු සිසුවියන්ගෙන් මා ලත් දැනුමේ සංකලනයකි. මෙම පොතෙන් මා බලාපොරොත්තු වන්නේ ශාස්ත්‍රිය අරමුණකට වඩා ප්‍රායෝගයකි ප්‍රතිඵලයකි. එනම් විශේෂයෙන් ලංකාවේ දහම් සේවා වැඩකටයුතු කරන එඬේර සේවකත්වයට අවශ්‍ය මූලික දැනුම ලබාදීමට යම් ආකාරයකින් දායකවීමයි. මෙහිදි මේ සඳහා අවශ්‍යය බයිබලිය දේවධර්මානුකුල සහ සමාජීය කරුණු මාගේ දැනුමේ ප්‍රමාණයෙන් සාකච්ජා කිරිමට උත්සහා කෙළෙමි.

සිංහල භාෂාව මට සිලිටු කළ මාගේ ඥාති දියණිය මෙලනි (ජෙනි) ට ද විශ්‍රාමලත් නියොජ්‍යය විදුහල්පතිනි නයනා සන්ද්‍යා මිච්චියාගම ගුරුතුමිය, දේවානම්පියතිස්ස මහා විද්‍යාලයේ - අනුරාධපුර සේවය කරන මනොජා ගුණසේකර, ඩිනාලි රාජපක්ෂ ගුරුතුමියන්ලාටත්, පොතේ පිට කවරය අඳිමින් කටයුතු කළ මගේ දියණිය සෙත්සරාටත්, ප්‍රකාශනයට අවසර ලැබීම මෙන්ම මුල්‍යය දායකත්වය ලබා දිම පිළිබඳ ලංකා දේව ධර්ම ශාස්ත්‍රාලයටත් මේ පොත ප්‍රකාශනය හා මුද්‍රණය දක්වා කටයුතු කළ රසික අබේසිංහ පියනමටත් මාගේ ස්තුතිය පුද කරමි. ටයිප් සෙටින් කළ දඹුල්ල - ප්‍රින්ට් හවුස් ආයතනයට මාගේ ස්තුතිය. එසේ තව දුරටත් ටයිප් සෙටින් හා මුද්‍රණය කල criative printers ආයතනයට ස්තුතිය පුද කරමි.

මේ පොත රචනා කිරිම සඳහා කාලය ලබා ගැනිමට මට උපකාර වු මගේ භාර්යාව ආලින්ට සහ දරුවන් දෙදෙනා වන සෙත්ලත්ට හා සෙත්සරාට මාගේ ප්‍රණාමය පුද කරමි.

මේ පොත් පිංච ශිෂ්‍යයන්ට, එඬේර සේවකත්වයට සහ මේ පිළිබද උනන්දුවක් ඇති සැමට අත්වැලක් වේවායි මා ප්‍රාර්ථනා කරමි.

+ කිර්තිසිරි ප්‍රනාන්දු

ලංකා සභා කුරුණෑගල දියෝකිසිය

2019 මැයි 01

1 පරිච්ඡේදය

කිතුණු සංඝයේ දේවධර්මානුකූල සහ සමාජ විද්‍යාත්මක පදනම සහ එහි විකාශනය හැඳින්වීම

1. 1. කිතුණු සංඝයේ දේවධර්මානුකූල පදනම හා විකාශනය
1.1.1. ආබ්‍රහම්ගේ කැඳවීම
1.1.2. වහල්කමෙන් විමුක්තියට
1.2. කානාන් දේශය උරුම කර ගැනීමේ සිට ජේසුස්වහන්සේගේ කාලය දක්වා
1.3. ජේසුස්වහන්සේ සහ කිතුණු සංඝය
1.4. කිතුණු සංඝයේ රූපක
1.4.1. කිතුණු සංඝය ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය ලෙස
1.4.2. කිතුණු සංඝය ගිව්සුම් ජන සමූහයක් ලෙස
1.4.3. කිතුණු සංඝය දෙවියන්වහන්සේගේ ගෘහයේ ජනතාව ලෙස
1.5 . කිතුණු සංඝයේ සංක්ෂිප්ත සමාජ විද්‍යාත්මක හා විකාශනය
1.5 .1. ශ්‍රී ලංකාව තුල කිතුණු සංඝයේ සංක්ෂිප්ත සමාජ ඉතිහාසාත්මක වර්ධනය හා විකාශනය

2 පරිච්ඡේදය

එඬේර සේවයේ සංදර්භය

2.1. සමාජ විවිධත්වය
2.2. ආර්ථික විවිධත්වය
2.2.1. ධනවාදි ආර්ථිකය
2.2.2. විවෘත ආර්ථිකය - ගෝලීයකරණය

2.3. දේශපාලනික විවිධත්වය
2.3.1. යටත් විජිත යුගය සහ දේශපාලන අස්ථිරත්වය
2.3.2. පසු යටත් විජිතවාදී යුගය
2.3.3. වර්තමාන යුගය - ජනවාර්ගික සිවිල් යුද්ධයෙන් පසු යුගය
2.4. ජේසුස්වහන්සේගේ එඬේර දර්ශනය





3 පරිච්ඡේදය

එඬේරාගේ ජීවිතය හා කාර්යභාරය

3.1. එඬේර සේවය කුමකට ද?
3.2. එඬේරාගේ ජීවිතය
3.3. එඬේරාගේ පුද්ගලික විනය
3.4. එඬේරාගේ පවුල සහ සේවය
3.5 . එඬේරාගේ වගකීම් සහ කාර්යභාරයන්
3.5 .1. අධ්‍යාපන කාර්යභාරය
3.5 .2. ධර්මදූත කාර්යභාරය
3.5 .3. නායකත්වයේ කාර්යභාරය
3.6 . සශ්‍රීකත්වයේ දේව ධර්මය සහ එඬේරා

4 පරිච්ඡේදය

එඬේර සේවය විවිධ දෘෂ්ඨිකෝණයන්ගෙන්

4.1. බයිබලීය දෘෂ්ඨිකෝණය
4.2. දේවධර්මානුකූල දෘෂ්ඨිකෝණය
4.3. සමාජ විද්‍යාත්මක දෘෂ්ඨිකෝණය

5 වන පරිච්ඡේදය

එඬේර රැක බලාගැනීම හා උපදේශනය

**5.1. එඬේර රැක බලාගැනීම හා උපදේශන පිළිබඳ බයිබලීය පසුබිම**
5.1.1. Good Shepherd යහපත් එඬේරා
5.1.1.1. **In O.T.- (3 chief ways)** පරණ ගිවිසුමේ - (තෙවැදෑරුම් ලෙස)
5.1.1.2. **In N.T.- (2 chief ways)** නව ගිවිසුමේ - (දෙවදෑරුම් ලෙස)
5.2. THE WORK OF THE SHEPHERD එඬේරාගේ කාරයභාරය
5.3. GOOD SHEPHERD යහපත් එඬේරා
5.4. MODEL OF THE EARLY CHURCH ආදී සභාවේ ආකෘතිය
5.5. FALSE PROPHETS & WORTHLESS SHEPHERDS - ව්‍යාජ දිවැසිවරු සහ නොවටිනා එඬේරු
5.6. PATTERN SET BY JESUS ‍යේසුස්වහන්සේගේ ක්‍රම වේදය
5.7. උපදේශකත්වය සහ උපදේශනය

6 පරිච්ඡේදය
අධ්‍යයනය සහ ධර්මදේශනා
6.1. ජේසුස්වහන්සේගේ ඉගැන්වීම් ක්‍රම
JESUS TEACHING METHODS
6.3. ශ්‍රාවකයන් පුහුණු කිරීම
6.4. ධර්ම දේශනා

7 පරිච්ඡේදය
සමාජ නීරෝගීතාවය
7.1. කාන්තාවන්, පුරුෂයන් හා ස්වභාව ධර්මය අතර මෙහෙවර
7.2. දරුවන් අතර මෙහෙවර
7.3. තරුණයන් අතර මෙහෙවර
7.4. වැඩිහිටියන් අතර මෙහෙවර
7.5. සහෝදරත්වය හා සහභාගිකත්වය
7.6. නමස්කාරය තුල නායකත්වය

8 පරිච්ඡේදය
සමගි කිරීමේ සේවය සහ සමාජ පරිවර්තනය
8.1. විවිධ කිතුණු නිකායන් අතර සමගිය
8.2. විවිධ ආගම් සහ සංස්කෘතීන් කෙරෙහි කිතුණු ආකල්පය
8.2.1. ආගමික සහජීවනය
8.3. සමාජ සංදර්භය තුල ආගමක් ලෙස කිතු දහමේ සමාජීය කාර්යභාරය

ග්‍රන්ථ නාමාවලිය




# 1. පරිච්ඡේදය

## කිතුණු සංඝයේ දේවධර්මානුකූල සහ සමාජ විද්‍යාත්මක පදනම සහ එහි විකාශනය

### හැඳින්වීම

එඬේරෙකු තම සේවය තුල කිතුණු සංඝයේ ස්වභාවය වටහා ගැනීම ඉතා වැදගත් වේ. මන්ද එඬේරාගේ සේවයේ කේන්ද්‍රය වන්නේ මෙම සංඝයේ ස්වභාවය හා ක්‍රියාකාරිත්වයයි. මෙම ස්වභාවයට මූලික වන්නේ බයිබලීය ධර්මතාවයන්ය. එඬේරාගේ ක්‍රියාකාරිත්වයේ මූලික ආකල්ප, සාරධර්ම සහ වටිනාකම් පදනම් විය යුත්තේ බයිබලීය ධර්මතාවයන් මතය. එසේ නොවුවහොත් සමහර විට එඬේරා තවත් හුදු සමාජ සේවකයෙකු විය හැකිය. සමාජ සේවය එඬේර සේවයේ ඉතා වැදගත් අත්‍යාවශ්‍ය සේවාවක් වුවත් එඬේරෙකු සමාජ සේවය හා එඬේර සේවය අතර සමානකම් හා වෙනස්කම් සමග මෙම සේවාවන් දෙක එකට සංකලනය වී ඇති ආකාරය හරියාකාරව අවබෝධ කර ගැනීම ඉතා වැදගත්ය. පැහැදිලි දේවධර්මානුකූල පදනමක් මත ගොඩ නැගුනු එඬේර සේවය, එඬේරාගේ සමාජ සේවය වටහා ගැනීමට මහගු රුකුලක් වන අතර, තමන්ගේ සීමාවන් හා පරාසය අවබෝධ කර ගැනීමට පිටිවහලක් වෙයි. මේ සඳහා සෑම එඬේරෙක්ම කිතුණු සංඝයේ ස්වභාවය දේවධර්මානුකූලව සහ සමාජ විද්‍යාත්මකව වටහා ගැනීම ඉතා වැදගත් වෙයි. එසේම මෙම බයිබලීය ධර්මතාවයන් සහ සංඝයේ දේවධර්මානුකූල පදනම අවුරුදු දෙදහසක් තුල අද දක්වා ලෝකයේ නොයෙකුත් සන්දර්භයන් තුල ක්‍රියාත්මක වූ ආකාරයද අවබෝධ කර ගැනීම එඬේරාගේ සේවය තුල ඉතා වැදගත් වෙයි.



මෙය වටහා ගැනීමට එඬේරාට දේශපාලනමය, ආර්ථික සහ සංස්කෘතික වැනි සමාජීය යථාර්ත ගැන ගුණාත්මක අවබෝධයක් ලබා ගැනීම අත්‍යාවශ්‍යය. මෙහිදී තමාගේ සමීප පසුබිම ගැන දැනුවත්වීම අවශ්‍යවන්නාසේම විශ්වීය යථාර්ථයන්ගේ සන්දර්භයන් ක්‍රියාත්මකවන ආකාරය විමර්ශනය කිරීම එඬේරාගේ අර්ථවත් ක්‍රියාකාරිත්වයට පිටුවහලක් වෙයි. අද පවතින අන්තර්ජාලය සහ ඊ මේල් වැනි නවීන සන්නිවේදන මාධ්‍යයන්ගේ ක්‍රියාකාරිත්වයත් සමග මෙම යථාර්තයේ අවශ්‍යතාවය වර්ධනය වෙමින් පවතී.

## 1.1. කිතුණු සංඝයේ දේවධර්මානුකූල පදනම හා විකාශනය

ප්‍රාථමිකව කිතුණු සංඝය ගොඩනැගිල්ලක් හෝ සංස්ථාගත සංවිධානයකට සීමා නොවේ. එයට ප්‍රධාන හේතුව වන්නේ ජේසුස්වහන්සේ දියත් කළ ක්‍රියාකාරිත්වය මෙවැනි ස්වභාවයන් තුල සීමා නොවි ක්‍රියාත්මක වීම යි. එම නිසා කිතුණු සංඝය මූලිකව ක්‍රියාකාරි ජන සමූහයකි. මේ නිසා වර්තමාන කිතුණු සංඝයන් සංස්ථාගත වි ගොඩනැගිලිවල ක්‍රියාත්මක වුවත්, මෙම තත්ත්වයන් සංඝයේ පැවැත්ම සඳහා අනිවාර්ය්‍යය අංගයන් නොවේ. එම නිසා මූලික කිතුණු පදනම මත යම් ස්ථානයක දෙදෙනෙකු රැස් වුවහොත් එය ප්‍රාථමික කිතුණු සංඝයක් ලෙස හැඳින්විය හැකිය. කිතුණු සංඝයේ මෙම පදනම ආරම්භ වන්නේ බයිබලයේ රචනා වි ඇති ජේසුස්වහන්සේගේ කාලයට පෙර පුරාණ ගිවිසුම් යුගයෙනි. “දේවජනතාව” යන වචනය සංඝය විස්තර කිරිමට යොදාගත් බයිබල් ව්‍යවහාරයකි. මන්ද නව ගිවිසුම මූලාරම්භය ඇත්තේ පුරාණ ගිවිසුමෙහිය. මෙහිදී බයිබලයේ පුරාණ ගිවිසුමේ වෘත්තාන්ත දෙකක් මෙම ස්වභාවයට මූලිකව පාදක වී තිබේ.

### 1.1.1. ආබ්‍රහම්ගේ කැඳවීම

ප්‍රථමයෙන් බයිබලය තුල රචනා වී ඇති ආබ්‍රහම් නමැති පුද්ගලයගේ කැඳවීම මෙම ජන සමාජයේ ආරම්භයට පදනම වේ. ආබ්‍රහම්ගේ කැඳවීම තුළ ඔහු සහ ඔහුගේ පවුල ඔහුගේ පියාගේ ඇදහිලිවලින් වෙන්වී එකම දෙවියන් ඇදහීම ආරම්භ කළ අතර නොදන්නා ප්‍රදේශයකට සංක්‍රමණය විය. ඔහු මේ එකම දෙවියන් නොහොත් පරම යථාර්ථතය ඇදහීමට තීරණය කරන අවස්ථාවේදී ලෞකික වශයෙන් ඔහුට අනාගතය ගැන පරම්පරාව ඉදිරියට ගෙන යෑමට දරුවෙකු නොසිටි අතර, ඔහුගේ භාර්යාව වඳ යැයි සිතුහ.

මෙවන් පසුබිමක් තුල ආබ්‍රහම් පියාගේ උරුමය අතහැර සශ්‍රික ආරක්ෂාකාරි දේශයක සිට සශ්‍රිත්වයෙන් ඌන නැදෑ හිත මිත්‍රාදීන්ගේ ආරක්ෂාව නොමැති දේශයකට සංක්‍රමණය වීම ඔහු ඇදහීමට තීරණය කල එකම දෙවිඳුන් කෙරෙහි ඔහු තැබූ විශ්වාසය මනාව විදහා දක්වයි.

ඊශ්‍රායෙල් දෙස බලන විට ඔවුන් ජනතාවක් ලෙස පත් කිරිම මුල් සාධකය වුයේ අබ්‍රහම්ගෙන් පැවතගෙන එන පරපුරක් වීමයි. එකම දෙවිඳුන් නොහොත් පරම යථාර්ථය කෙරෙහි විශ්වාසය තබමින් ආබ්‍රහම් මෙසේ ශාරීරික, මානසික හා ආධ්‍යාත්මිකව සංක්‍රමණය වීම බයිබලීය ලියවිලිවලට අනුව මනුෂ්‍ය සංහතියේ ප්‍රධාන සංසිද්ධියක් විය. අද දක්වා මැද පෙරදිගින් ආරම්භ වූ ලෝකයේ ප්‍රධාන ලබ්දීන් තුනක් ආබ්‍රහම් තම පූර්ව පියා ලෙස සලකනු ලබයි. මෙම ලබ්දීන් ජුදෙව්, ඉස්ලාම් සහ කිතුණු ලෙස වර්තමාන ලෝකයේ හඳුන්වනු ලැබේ. මේ නිසා අබ්‍රහම් සහ ඔහුගේ පවුල නව මගකට යොමුවි එකම දෙවිඳුන් නම් පරම සත්‍යය තුල නව ජනකොටසක සහ සමාජයක ආරම්භය විය.



බයිබලීය ඉතිහාසය තුළ මෙම ආරම්භය තුලින් දේව පරමාර්ථ ඉදිරියට ගෙන යෑමේ කාර්යභාරය මේ ජනතාවට පැවරෙන ලදි.

ජනතාව යනු සමූහයක් නොවේ. ජනතාව යනු ඔවුන් ඔවුන් අතර කිසිදු සබඳතාවයක් නොමැති පුද්ගලයන් රැසකි. මෙසේ ආබ්‍රහම් නැමැති පුද්ගලයාව තෝරා ගන්නා ලද්දේ ඔහු විශේෂ ජාතියකට හෝ ආගමකට අයත් වූ නිසා නොවේ. ඔහුගේ කැඳවීම පවතින සෑම යථාර්ථයකටම හේතු සාධක වන පරම සත්‍ය වන දෙවියන්වහන්සේ එක් සාමාන්‍ය පුද්ගලයෙකු තුලින් මුළු මිනිස් සංහතියට එතුමාගේ පරමාර්ථ විදහා දැක්වීමකි. මෙම කැඳවීම තුල ආබ්‍රහම්ට විශේෂ ආශිර්වාදයන් හිමිවූයේ වගකීම් සමගය. එසේම අබ්‍රහම් ගෙන් පැවත ගෙන එන අය පොදු පැවැත්මට වඩා ඔවුන් එක් කල දේ වුයේ දේව අභිමතයයි. එය ආධ්‍යාත්මික බැඳිමකි.

### 1.1.2. වහල්කමෙන් විමුක්තියට

කිතුණු සංඝයේ පදනමට පාදක වන දෙවන සිද්ධිය වන්නේ නික්මයාම. දෙවියන්වහන්සේ ඊජිප්තුවේ පාරාවෝ රජවරු යටතේ වහල්කමේ සිටි ජනකොටසක් කැඳවා ආබ්‍රම්හට දෙන ලද පොරොන්දු ස්ථිර කරමින්, ඒ ජන කොටස වහල් කමින් විමුක්තිය කරා ගෙන යමින් නව දේශයක් තුල දෙවියන්වහන්සේගේ පරමාර්ථ ඉදිරියට ගෙන යෑමට ඔවුන් තොරා ගන්නා ලදි. මෙහිදී කිසිම අයිතිවාසිකමක් නොතිබුණු වහල් ජනතාවක් එකම දෙවිඳුන් නම් පරම සත්‍ය තුල ඒකරාශි වී වර්ධනය විය.

මෙම ජනතාව වහල් කමේ සිටින කාලයේ ඔවුන්ට කිසිම අයිතිවාසිකමක් නොවිය. මේ තත්වය තුල වහල්කමෙන් විමුක්තිය ලබා ගැනීමට ඔවුන්ට කිසිම බලාපොරොත්තුවක් නොවිය.

මෙවන් පසුබිමක් තුළ වහල්ව සිටි ජනතාවගේ බලාපොරොත්තු අලුත් වූයේ මෝසෙස් නම් විමුක්තිදායකයාගේ ක්‍රියාකාරිත්වයත් සමගය. මේ විමුක්තිදායකයා වහල් මවකගෙන් ජනිත වුවත් හැදුනේ වැඩුනේ පාරාවෝගේ මාළිගාව තුලය. මේ ද්විත්ව අනන්‍යතාවය තුල පොරබැදූ මෝසෙස් මිනිමරුවෙකුව තම ජනතාවගෙන් සහ රජ මාළිගාවෙන් ඈත්ව දුර දේශයකට සංක්‍රමණය විය. මේ හුදකලාවීමේ අත්දැකීම තුල ඔහු ඇදහූ පරම සත්‍ය වහල්කමින් ඔහුගේ ජනතාව මුදවා ගැනීමට ඔහුව දැවෙන පඳුරක් තුලින් තෝරාගෙන කැඳවූ බව ඔහුගේ අත්දැකීම විය.

“තෝරා ගැනිම” පුරාණ ගිවිසුමට අනුව යම් සේවාවක් සහා කාර්යයක් සඳහා බවයි. තෝරා ගැනිමේ වලංගු භාවය රදවා ගැනීමට හැකි වනුයේ සේවාව හා කාර්ය ඉටු කිරිමෙන්ය. මොසෙස්ගේ නායකත්වය තුල මේ ජනතාව ජාතියක් ලෙස ඒක රාශී වෙමින් තමන්ගේම දේශයක් උරුමකර ගැනීමට යොමුවන ලදි. මෝසෙස්ට මෙම පොරොන්දු වූ දේශයට ඇතුල්වීමට නොහැකි වුවත් මෝසෙස්ගේ

අභාවයෙන් පසු ජොෂුවාගේ නායකත්වය යටතේ ඊශ්‍රායෙල් ජනතාව තමන්ට දෙවියන්වහන්සේ විසින් පොරොන්දු වූ දේශය අත්පත් කර ගන්නා ලදි.



## 1.2. කානාන් දේශය උරුම කර ගැනීමේ සිට ජේසුස්වහන්සේගේ කාලය දක්වා

මෙසේ ඉශ්‍රායෙල් ජනතාව නිවහල් ජන සමාජයක් හැටියට කානාන් දේශයේ ජීවත්වීම ආරම්භ කිරීමත් සමග ප්‍රථමයෙන් තම නිවෙස් වල නමස්කාර කරන ලදි. සලමොන් රජතුමා දේවමාළිගාව ගොඩනැගීමෙන් පසු ප්‍රධාන නමස්කාරයන් එම දේවමාළිගාවේ පවත්වන ලදි.

මෙසේ ක්‍රමානුකූලව දෙවිඳුන් දේවමාළිගාවේ වැඩ වසන බවත් එතුමන් නැමදීමට දෙව් මැඳුරට යා යුතු බවත් ඊශ්‍රායෙල් ජනතාවගේ වැටහීම විය. මේ වැටහීමත් සමග බබිලෝනියේ විප්‍රවාසයේ සිටි ඊශ්‍රායෙල් ජනතාව නිතරම ප්‍රාර්ථනා කළේ නැවත ජෙරුසලමේ දෙව්මැදුරට ගොස් දෙවිඳුන් නැමැදීමයි. එහෙත් මේ තත්ත්වය තුල ඔවුන් දෙවිඳුන් අවබෝධ කරගත් ආකාරයේ පරිවර්තනයක් සිදුවිය. ඔවුන්ගේ දෙවිඳුන් ජෙරුසලමේ දේවමාළිගාවට සීමාවන ඊශ්‍රායෙල්වරුන්ට පමණක් අයත් වන ගෝත්‍රික දෙවියන්වහන්සේ කෙනෙක් නොව එතුමා විශ්විය බව ඔවුන් වටහා ගන්නා ලදි. මෙම දෙවිඳුන් සම්බන්ධ විශ්විය සංකල්පයත් සමග බබිලෝනියාවේ ඔවුන් ජිවත් වූ ස්ථානවල සිනගෝග බිහිවීම ආරම්භ විය. ජේසුස්වහන්සේගේ කාලයේ ජන සංඝයන් එදිනෙදා ඉගෙන ගැනීමේ කටයුතු හා නමස්කාරයන් කලේ සිනගෝග වලය. ප්‍රධාන නමස්කාරය ජෙරුසලමේ දේව මාළිගාවේ පවත්වන ලදි.

ඉන් අනතුරුව පර්සියානු සහ ග්‍රීක අධිරාජ්‍යයන් යටතේ පාලනය වූ දේව ජනතාව ජේසුස්වහන්සේගේ කාලයේ රෝම අධිරාජ්‍යයේ යටත් විජිතයක ජනතාව බවට පත්වී තිබිණි. මේ පසුබිම තුල දේව ජනතාව ගැලවුම් කරුවෙක් නොහොත් මෙසායා (ක්‍රිස්තුස්) තුලින් දෙවියන්වහන්සේ තම රාජ්‍ය මෙලොව ස්ථාපිත කිරීම බලාපොරොත්තු විය. දේවජනතාව අතර නොයෙකුත් ජනකොටස් මේ ගැලවුම්කරු විවිධ කාර්යයන් ඉටුකරන තෙක් බලාපොරොත්තුවෙන් ජීවත් විය. මේ අතර මූලිකව ඔවුන් මේ මෙසායා රෝම අධිරාජ්‍යය සමග සටන් වැද දේව ජනතාවට නිදහස ලබාදීම බලාපොරොත්තු විය.



## 1. 3. ජේසුස්වහන්සේ සහ කිතුණු සංඝය

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තමන් ප්‍රකාශ කළ දේව රාජ්‍යයේ ආකල්ප, සාරධර්ම සහ වටිනාකම් මේ මිහිපිට ක්‍රියාත්මක කිරීමට ජන සමූහයක් අතරින් ජනතාවක් ගොඩ නගන ලදි. එය නව ගිවිසුමේ දේව ජනතාවක් එසේත් නැත්නම් කිතුණු සංඝයක් ලෙස හඳුනාගනි.

මෙය එතුමා ශ්‍රාවකයන්ට ඉගැන්වූ යැදුමේ "ඔබගේ රාජ්‍ය ඒවා, ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් මේ මිහිපිට ඉටු වේවා." යි කියා ප්‍රකාශ කිරීමට ඉගැන්වීමෙන් පැහැදිලි වේ. මෙම ජන සමාජයේ න්‍යෂ්ඨිය වූයේ එතුමාගේ ශ්‍රාවකයන්ය. මේ නිසා ජේසුස්වහන්සේගේ ශ්‍රාවකයන් නව ඉශ්‍රායෙල් ලෙස හඳුන්වා තිබේ. විසිර ගිය ජනතාව නික්මයාම තුළ එකම ජාතියකට ඒකරාශි කළා සේ ක්‍රිස්තුස් වහන්සේ නැවත සියලු ජනයා නව ජනතාවක් නව ඊශ්‍රායලයක් ගොඩ නැගුහ. පාවුල්තුමා යුදෙව් ග්‍රීක වහල් කියා භේදයක් නොමැත යන්න පෙන්වයි. ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ කිතුණු සංඝය ගැන සලකා බැලීමේදී මූලිකව කරුණු කිහිපයක් සලකා බැලිය යුතු වෙයි.

1 කොරෙන්ති 12: 1 අනුව අදහස් තුනක් ඉදිරිපත් කරයි.

01. උත්ථාන වූ මහිමයට පත් ක්‍රිස්තුස්වහන්සේ.

02. බෞතිස්මය හා විශ්වාසය තුළ සිටින කිතුණුවන්.

03. ක්‍රිස්තුස් වහන්සේ හා කිතුණුවන් අතර ඇති සබඳතාවයයි.

එමෙන්ම 1 කොරෙන්ති 1: 18 ජේසුස්වහන්සේ සංඝය නැමැති ශරීරයේ හිසය. හිස ලෙස පෙන්වන්නේ ජේසුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වයයි. මෙහිදී මූලික කරුණ වන්නේ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙම සංඝය ආරම්භ කළාද යනුයි.

එතුමා සංඝයේ පළමු වැන්නා නොව එතුමා සමග නව පිවනය ලැබූ සැමගේ අරම්භයයි. බයිබලයේ සුභාරංචි පොත් වලට අනුව ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සුභාරංචිය වූයේ දේව රාජ්‍ය ප්‍රකාශ කිරීමයි. ජේසුස්වහන්සේ තම ජීවිතයෙන් සහ ඉගැන්වීම් වලින් මෙම රාජ්‍යයේ වර්ධනය සඳහා ක්‍රියා කරන ලදි. මේ ක්‍රියාකාරිත්වයේ න්‍යෂ්ටිය ලෙස ජේසුස්වහන්සේ ගේ ශ්‍රාවකයින් 12 දෙනෙක් තෝරා පත් කර ගන්නා ලදි.

දේව රජ්‍යය මගින් මුළු විශ්වය ගලවාගන්නා වූ අය ලෙස තොරාපත් කර ගන්නා ලදි. මෙසේ තම වයස අවුරුදු 30 සිට 33 දක්වා පමණ ජේසුස්වහන්සේ මෙම කාර්යය භාරයේ නිරත විය. 33 වැනි වියේදී පමණ ජේසුස්වහන්සේට විරුද්ධ වූ එතුමාගේ ජාතියේ, එනම් ජුදෙව් ජාතික නායකයන් එදා පැවති අධිරාජ්‍යය පාලකයන් වූ රෝමවරුන් ලවා එතුමාව කුරුසි පත් කර මරා දමන ලදි.

ජේසුස්වහන්සේගේ උත්ථානයෙන් සහ ස්වර්ගාරෝහනයෙන් පසු මුල් ශත වර්ෂ දෙක තුල කිතුනුවෝ බොහෝ විට තම නිවෙස් වල නමස්කාර කරන ලදි. මුල් ශතවර්ෂ තුන තුල රෝම අධිරාජ්‍යයෙන් පීඩා පැමිණෙන විට කිතුණුවෝ මිය ගියවුන් තැම්පත් කල ගුහාවල නමස්කාර කරන ලදි. මේ කාලයේදි සංඝය සහභාගිකත්වය වැනි කිතුණු සංඝයේ වටිනාකම් හා ගුණාංග ගැන විනා විශේෂ ගොඩනැගිලි ගැන උනන්දු වූ බවක් නොපෙනේ. ඉහත පසුබිම තුල කිතුණු සංඝයේ අභ්‍යයන්තර ස්වරූපය විදහා දැක්විම සඳහා නොයෙකුත් රූපක යොදා ගත් බව නව ගිවිසුමේ ලියැවිලි වලින් පැහැදිලි වේ.



## 1.4. කිතුණු සංඝයේ රූපක

මේ රූපක අතර රූපක 3 ක් ඉතා වැදගත් වේ. මෙයට මූලික හේතුව වන්නේ තමන්ගේ මූලික පදනම් මත සැම කිතුනු නිකායක්ම පාහේ මේ රූපක 3න් එකක් අනෙක් ඒවාට වඩා අවධාරණය කිරිමයි. අද සමාජය තුල කිතුණු සංඝයන් කුමන නිකායකට අයත් වුවත් මේ රූපක තුනෙන්ම ක්‍රියාකාරි ජීවයක් ලබාගත හැකිය.

### 1.4.1. කිතුණු සංඝය ක්‍රිස්තුස්වහන්සේගේ ශරිරය ලෙස

ක්‍රිස්තුස්වහන්සේගේ ශරිරය ලෙස කිතුණු සංඝය විස්තර කිරිම සාන්ත පාවුලුතුමාගේ අත්දැකීමෙන් පැන නැගුණු නිමැවුමක් බව එතුමාගේ ලියැවිලි වලින් පැහැදිලි වේ. මෙය එතුමාගේ ජීවිත පරිවර්තන සිද්ධිය තුල ගැබ් වි ඇති බව අනුමාන කළ හැකිය.

එම සිද්ධියට අනුව දමස්කයට යන මාර්ගයේදී එතුමාට මුණ ගැසුණු ක්‍රිස්තුස් වහන්සේ ඇසූ ප්‍රශ්නය නම් “ඔබ මට පීඩා කරන්නේ මන්ද යනුයි.” ඒ වන විට පාවුලුතුමා පීඩා කරමින් සිටියේ කිතුණු සංඝයට විනා ශාරිරිකව ජීවමානව සිටි ක්‍රිස්තුස් වහන්සේට නොවේ. මෙහිදී පාවුලුතුමා නොඅනුමානව කිතුණු සංඝය ලෝකය තුල ක්‍රිස්තුස් වහන්සේගේ ජීවමාන ශාරිරය ලෙස නිර්ණය කළ බව පෙනේ. පාවුලු තුමා මේ රූපකය තුල එකිනෙක හා බැදුන කිතුණු සංඝයේ ගුණාංග 3 ක් ගෙනහැර දක්වයි.



පළමුව එතුමා කිතුණු සංඝයේ සමාජිකයන්ගේ විවිධත්වය දෙමින් එය ශරීරයේ ඇති විවිධ අවයවයන්ට උපමා කර තිබේ. මෙහිදි එතුමා ඇස සහ කන වැනි ශරීරයේ විවිධ අවයව බාහිර පෙනුමෙන් සහ අභ්‍යන්තර ක්‍රියාකාරිත්වයෙන් වෙනස්වන ආකාරය පෙන්වා දෙයි.

මෙසේ කිතුණු සංඝයේද ජනතාව බාහිර පෙනුමෙන් සහ අභ්‍යන්තර ක්‍රියාකාරිත්වයෙන් විවිධ වන අතර එය සංඝයේ ස්වරූපයක් බව පෙන්වා දෙයි. මෙම ස්වභාවය තුළ එතුමා පෙන්වා දෙන්නේ විවිධ සංස්කෘතීන්ට සහ ජාතීන්ට අයත් ජනතාව ඔවුන්ගේ විවිධත්වයන් සමග කිතුණු සංඝයට අයත්වන බවයි.

දෙවනුව මෙම අවයවයන් විවිධ වුවත් ඒවා එකම ශරීරයේ අවයවයන් බව පෙන්වා දෙමින් ඒ නිසා මේ විවිධ අවයවයන් එකිනෙක මත යැපෙන ආකාරය පෙන්වා දෙයි. උදාහරණයක් වශයෙන් අතින් යමක් ඇල්ලීමට ශරිරය පාදයෙන් ගමන් කළ යුතු අතර ඇසින් එය දැකිය යුතුය. මෙසේ පෙනුමෙන් සහ ක්‍රියාකාරිත්වයෙන් වෙනස්වන අත් ද , පාද ද සහ ඇස් ද එකට ක්‍රියා කිරීමෙන් මේ කාර්යය මනාව සිදුවේ. මෙසේ කිතුණු සංඝයේ ජනතාව විවිධ වුවත් ඔවුන් ක්‍රියාකාරිත්වයේ දි එකිනෙකා මත යැපෙන බව පාවුලුතුමා පෙන්වා දෙයි.

තෙවනුව මෙසේ විවිධ අවයව එකිනෙකා මත යැපෙමින් ක්‍රියාත්මක වන්නේ හිසෙන් බව පෙන්වා දෙමින් සංඝයේ හිස ජේසුස්වහන්සේ බව ගෙනහැර දක්වයි.

1 කොරෙන්ති 12:13 ට අනුව ක්‍රිස්තුස්වහන්සේ හා කිතුණුවන් අතර ඇති ඒකාබද්ධතාවය හා කිතුණුවන් කිතුණුවන් අතර ඇති ඒකාබද්ධතාව පෙන්වා දෙයි. මෙයින් පාවුලුතුමා කිතුණු සංඝය ඒකකයක් නොව ඒකත්වයක් බව අවධාරණයෙන් පෙන්වා දෙයි. සංඝයේ විවිධත්වය, විවිධත්වය තුල ඒකත්වය සහ ක්‍රිස්තුස් වහන්සේ තුල ක්‍රියාකාරිත්වය මෙහිදි වැදගත් වන මූලික කරුණු ලෙස ඉදිරිපත් කළ හැකිය. ප්‍රධාන වශයෙන් රෝමානු කතෝලික සහ ලංකා සභා වැනි නිකායන් මේ රූපකය සංඝයේ ස්වරූපය විස්තර කිරිමට බොහෝවිට භාවිතා කර තිබේ. මෙම රූපකය අවධාරනය කරන නිකායන්වල බොහෝ විට සංකීර්ණ සංවිධානාත්මක රටාවක් ඇති බව දැකිය හැකිය.

### 1.4.2. කිතුණු සංඝය ගිවිසුම් ජන සමූහයක් ලෙස.

මෙය බයිබලය මුල සිට අග දක්වා විටින් විට හමුවන රූපකයකි. මෙහිදී පරම සත්‍ය වන දෙවිඳුන් සහ ජනතාව අතර සම්මුතියක් ඇතිවන අතර පරම සත්‍ය ගිවිසුම සැමවිටම කඩ නොකොට ඉෂ්ට කරන අතර ජනතාව වරින්වර මෙය කඩ කරමින් සත්‍යයෙන් ඉවතට ගමන් කරයි. එහෙත් පරම සත්‍ය වන දෙවිඳුන් හැමවිටම මනුෂ්‍යයන් ඔවුන්ගේ අධර්මිෂ්ඨ ක්‍රියා ගැන මනස්ථාප වූ විට නැවත ගිවිසුමට ඇතුලත් විමට ජනතාවට අවකාශ දෙන සේක.

ගිවිසුම විස්තර කිරීමේදී බයිබලය තුල පැහැදිලි වැදගත් ගිවිසුම් පහක් (5) හඳුනා ගත හැකිය. සමහර විශාරදයන්ගේ මතය අනුව බයිබලීය දේව සංඝයේ පුවත මේ ගිවිසුම් පහ මත රඳා පවතී. මෙම ගිවිසුම් පහ කිතුණු සංඝයේ විකාශනය තුල ඉතා වැදගත් කොට සැලකිය හැකිය.

❖ <u>නෝවා සමඟ ගිවිසුම</u>

මේ වෘත්තාන්තයට අනුව මිනිස් සංහතිය ඉතා අධර්මිෂ්ඨ වූ විට දෙවිඳුන් නෝවා නැමැති පුද්ගලයෙක් කැඳවා නැවක් සෑදීමට අණ කළ සේක. නෝවා සහ නෝවාගේ පවුලේ අයත් සෑම සතුන්ගෙන් ජෝඩුව බැගින් නැවට ඇතුලත් කොට වසනු ලැබූ පසු මහා ජල ගැල්මක් ඇති වී මුළු මහ පොළොව සහ සියලු ජීවීන් විනාශ වන අතර නැවේ සිටි අය පමණක් ඉතිරි විය. මේ මහා ජල ගැල්මෙන් පසු දෙවියන් වහන්සේ නෝවා සමග ගිවිසුම ඇති කර ගන්නා ලදි. මෙය ජල ගැල්මෙන් පසු ආරම්භ වන මුළු මහත් මිනිස් සංහතිය සමග ඇති කරගත් ගිවිසුමකි. මේ ගිවිසුමේ ලකුණ වන දේදුන්නේ විවිධ වර්ණ මිනිස් සංහතියේ විවිධත්වය ඉතාමත් සංකේතාත්මකව විද්‍යාමාන කර දක්වයි.

❖ <u>ආබ්‍රහම් සමග ගිවිසුම</u>

මෙහිදී දෙවියන්වහන්සේ එක් පුද්ගලයෙක් සමග ගිවිසුමක් ඇති කර ගනිමින් ඔහු සහ ඔහුගේ පරම්පරාව මගින් එතුමාගේ අභිලාෂයන් ව්‍යාප්ත කරමින් ඉදිරියට ගෙන යෑමට සලස්වන ලදි. මෙම ගිවිසුමේ සංකේතය චර්මච් ඡේදනය විය.

❖ <u>සීනයි ගිවිසුම</u>

මෙම ගිවිසුම තුල වහල් කමින් නිවහල් වූ ඉශ්‍රායෙල් ජනතාව ජන කොටසක් කරමින් ඔවුන්ගේ ජීවිත පරම සත්‍ය නොහොත් දෙවියන්වහන්සේගේ අධිකාරිත්වය යටතේ ශක්තිමත් කරන ලදි. ඔවුන් තමත් පාරාවෝ මෙන් දේව වෙසින් සිටින මනුෂ්‍යයන්ගේ පීඩනයට යටත් නොවිය යුතු බව මෙහි පරම අර්ථය විය. මම ගිවිසුමේ සලකුණ වුයේ ගල් ලැලි වල ලියන ලද දස පණතයි.

❖ <u>ජෙරමියාගේ ගිවිසුම</u>

ජෙරමියා විප්‍රවාසයේ සිටි ජනතාවට විස්තර කල මෙම ගිවිසුම පෙර ගිවිසුම් වලට වඩා එක් ආකාරයකින් වෙනස් විය. එතුමා මෙම ගිවිසුම මනුෂ්‍යයන්ගේ සිත් වල ලියන බව පෙන්වා දෙන ලදි. මෙම ගිවිසුමෙන් ප්‍රකාශ කරන ලද්දේ දේව දරුවන් දෙවියන් වහන්සේගේ ජීවමාන ලියවිලි බවයි. තෝරාගත් ජනතාවක් ලෙස පිහිටවනු ලැබුවේ ඉහත ගිවිසුම් මතය. තෝරා ගැනීම දිගටම පවත්වාගෙන යාමට විශ්වාසයේ හා කීකරුකමේ ප්‍රතිචාර පූර්ණ නිදහසකින් ප්‍රතිචාර දැක්විය යුතුව ඇත. මෙය දේව ජනතාවට ලැබෙන වරප්‍රසාදයකි.



❖ <u>ජේසුස්වහන්සේගේ අලුත් ගිවිසුම</u>

ජේසුස්වහන්සේ පෙර ගිවිසුම් සියල්ල අලුත් කරමින් අලුත් ගිවිසුමක් ස්ථාපිත කරන ලදි. ජේසුස්වහන්සේ මරණයට පත් කළ විට සියළු බලාපොරොත්තු අහිමි වුවා සේ හැඟී ගියත් ජනතාව තුළ අලුත් ගිවිසුමේ බලාපොරොත්තුක් ඇති විය. මේ ගිවිසුමේ සංකේතය ජේසුස්වහන්සේගේ රුධිරය නොහොත් ජීවිතය යි.

ජේසුස්වහන්සේ තම ජීවිතය පූජාකරමින් සිය ජීවිතය මත මෙම ගිවිසුම පිහිටු වන ලදි. මෙයින් දෙවිඳුන් හා මනුෂ්‍යයා අතර සම්බන්ධතාවයේ වැදගත් කම ගෙන හැර දක්වයි. මෙම අවධාරණය තුළ දෙවිඳුන් සමග සම්බන්ධයට මනුෂ්‍යයන්ගේ ජීවිත වල තිබිය යුතු පුද්ගලික පාරිශුද්ධත්වය අවධාරණය කරයි.

### 1.4.3. කිතුණු සංඝය දෙවියන්වහන්සේගේ ගෘහයේ ජනතාව ලෙස

මෙම රූපකයෙන් කිතුණු සංඝය දෙවියන්වහන්සේගේ ගෘහයේ වැසියන් ලෙස ගෙන හැර දක්වයි. මෙමගින් කිතුණු සංඝයේ සෑම සාමාජිකයෙකුටම දෙවිඳුන් හමුවීමේ ඇති සමානාත්මතාවය අවධාරනය වේ. බොහෝ නිදහස් නිකායන් මේ රූපකය අනුව තම සංඝය ඒකරාශි කර තිබේ. මෙසේ ඒකරාශි කළ නිදහස් නිකායන්ගේ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයක් නම් ඔවුන් අතර ඇති සහෝදරත්වයයි.

ශ්‍රී ලාංකික සමාජය තුල එඬේරා කුමන නිකායකට අයත් වුවත් වේ. බයිබලීය රූපක 3 න්ම තම සංඝය අර්ථවත් කිරීමට නිර්මාණකාරී බලපෑම් ලබා ගත හැකිය. මෙසේ තම නිකායේ ශක්තීන් තවත් ශක්තිමත් කර ගනිමින් දුර්වල තැන් ශක්තිමත් කර ගැනීම සඳහා අනිකුත් නිකායන්ගෙන් ආභාෂය ලබාගත හැකිය.

කිතුණු සංඝයේ මූලික ස්වභාවය ගැන එඬේරාට පැහැදිලි අවබෝධයක් තිබිය යුතු අතර මේ ස්වභාවය අවබෝධ කර ගැනීමට සංඝයේ ජනතාව යොමු කිරීම එඬේරා සතු මූලික වගකීමක් වෙයි. මෙහිදී සංඝයේ ජනතාව ජීවත්වන සන්දර්භයට අනුකූලව මෙය ඉටු කිරීම එඬේරාට පැවරෙන වගකීමකි. මේ සඳහා සංඝයේ ජනතාවගේ වයස, අධ්‍යාපනය, ආර්ථික තත්ත්වය සහ අත්දැකීම් වැනි යථාර්ථයන් වැදගත් වෙයි.

### 1.5. කිතුණු සංඝයේ සංක්ෂිප්ත සමාජ විද්‍යාත්මක හා විකාශනය

සමාජ විද්‍යාත්මකව කිතුණු සංඝය ලෝකයේ අනෙකුත් සංවිධාන සහ ආයතන මෙන් සමාජයේ විකාශනය වෙමින් ක්‍රියාත්මක විය. එසේම වර්තමානයේ අඛණ්ඩ ක්‍රියාකාරී ආයතනයන් අතර කිතුණු සංඝය ඉතාමත් පැරණි අවුරුදු 2000 ක ඉතිහාසයක් ඇති ආයතනයකි.

කිතුණු සංඝයේ විකාශනයේ ඉහත විස්තර කල බයිබලීය සහ දේවධර්මානුකූල පදනම මත මූලිකව රඳා පැවතුනත් සංඝය තුල මේ පදනම යුගයෙන් යුගයට පරපුරෙන් පරපුරට කාලානුරූපව සහ දේශානුරූපව අර්ථකතනය වී ක්‍රියාත්මක විය. මෙහිදී සංඝයේ විකාශනය විවිධ සන්දර්භවල දේශපාලන, ආර්ථික විද්‍යාත්මක සහ සංස්කෘතික වැනි යථාර්ථයන්ගේ බලපෑම තුළ වර්ධනය විය.

මෙම යථාර්ථයන් විටෙක සංඝයේ යහපත් සංවර්ධනයට හිතකර වුවත් සමහර අවස්ථා වලදී අහිතකර විනාශකාරී බලපෑම් ඇති කරන ලදි. එඬේරාට සංඝය සම්බන්ධයෙන් හසල බයිබලීය හා දේවධර්මානුකූල දැනුමක් අවශ්‍යවන්නාසේ ම සමාජය තුළ සංඝය මෙම පදනම් වලට කෙතරම් අනුකූල වී විකාශනය වූවාද යන්න ගැන පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම අත්‍යාවශ්‍යය. මෙම අවබෝධය මූලිකව දෙවැදෑරුම් ලෙස දැක්විය හැකිය.

එනම් සමස්ත ලෝකයේ, තම රට තුල සහ තමා ජීවත්වන සන්දර්භය තුල සංඝයේ විකාශනයේ සමාජ විද්‍යාත්මක ඉතිහාසය සාමාන්‍ය ජනතාවගේ දෘෂ්ඨි කෝණයෙන් වටහා ගැනීම එඬේරාගේ කාර්යක්ෂම සහ අවබෝධාත්මක සේවයට අත්වැලකි. මෙහිදී සෑම දහ දෙනෙකුගෙන් නව දෙනෙක් කිතුණුවන් නොවන ලංකාව වැනි රටක බහුතර ජනතාව  කිතුණු සංඝයේ විකාශනය ගැන දරන මති මතාන්තර ඉතා වැදගත් වෙයි.

ජේසුස්වහන්සේගේ කාලයෙන් පසු ළදරු පුරාණ කිතුණු සංඝය ප්‍රථමයෙන් රෝම අධිරාජ්‍යයේ පීඩාවලට ලක් විය. මේ කාලයේදී  බොහෝ කිතුණුවන් කෲර ලෙස පීඩාකර ඝාතනය කරනු ලැබුවත් මේ තත්ත්වන් තුල ආධ්‍යාත්මිකව වර්ධනය වී ශක්තිමත් විය. මේ කාලයේදී කිතුණුවෙක් වීම මරණයට අත වැනීමක් විය. මේ නිසා කිතුණුවෙක් ලෙස ජීවත්වීම ජීවිතයත් මරණයත් අතර බියකර ගැඹුරු තීරණයක් විය. මේ නිසා මේ පුරාතන සංඝයේ නාමික කිතුණුවෝ නොසිටි අතර ආර්ථික හෝ දේශපාලනමය වාසි සඳහා කිසිවකු සංඝයට ආකර්ශනය නොවීය. එහෙත් ක්‍රි.ව. **325** පසු කොන්ස්ටන්ටයින් රෝම අධිරාජයාගේ මිලාන් අඥාවෙන් ලැබුනු ආගමික නිදහසින් පසු ක්‍රමානුකූලව කිතුණුවෝ නොයෙකුත් වරප්‍රසාද භුක්ති විඳීම ආරම්භ කරන ලදි. මේ නිසා මෙයට පෙර තිබූ භයානක අභියෝග ඉවත්වීමත් සමඟ සමහරු වරප්‍රසාද ලබා ගැනීමට කිතුණුවන් වීම ආරම්භ විය. රෝම අධිරාජ්‍ය තුල ක්‍රමයෙන් කිතු දහම රාජ්‍ය ආගම වීමත් සමග ආර්ථික, සමාජීය සහ දේශපාලනමය වාසි තකා කිතුණුවන් වීම ජනප්‍රිය විය. මෙම තත්වයන් අනිවාර්යයෙන්ම සංඝයේ අධ්‍යාත්මික වර්ධනයට පහරක් විය. මෙසේ ක්‍රමානුකූලව විශේෂයෙන් බොහෝ බටහිර රටවල් කිතු දහම රාජ්‍ය ආගම ලෙස පිළිගත් අතර රාජ්‍යය පාලනය කිතු දහම සමග සමීප සබඳතාවයක් ගොඩ නගන ලදි.



මේ තත්ත්වය තුල බොහෝ විට කිතුණු නායකයන්ට රාජ්‍ය පාලකයන් ආරක්ෂා කිරීමට සිදුවිය. කිතුණු නායකයන්ගේ මෙම ක්‍රියා කලාපය ඔවුන්ව සාමාන්‍ය ජනතාවගෙන් දුරස් කිරීමට මහගු පිටිවහලක් විය. එසේම කිතුණු ධර්මය රෝම අධිරාජ්‍යයේ රාජ්‍ය ආගම වීමත් සමග රෝමයේ රදගුරුතුමාගේ බලය වර්ධනය විය. රෝමයේ මුල්ම රදගුරුතුමා ජේසුස්වහන්සේගේ අග්‍ර ශ්‍රාවක පේදුරුතුමා යන විශ්වාසයත් සමග රෝමයේ රදගුරුතුමා නොහොත් පාප්වහන්සේ බටහිර කිතුණු සංඝයේ නායකයා බවට ක්‍රමයෙන් පිළිගන්නා ලදී. මධ්‍යතන යුගයේ මුස්ලිම් සහ කිතුණු පාලකයන් අතර ඇතිවුනු කුරුස යුද්ධ සංඝයේ අවිහිංසාකාරී ස්වභාවය ඉතා දරුණු ලෙස පළුදු කළ අතර සංඝය තුල යුධමය මානසිකත්වයක් නිර්මාණය කිරීමට සමත් විය.

මින් අනතුරුව **15** වන ශත වර්ෂයේ බටහිර ලෝකයේ ආරම්භ වන පුනරුදය කිතුණු සංඝයේ විකාශනයට හා ස්වභාවයට සෘජුවම බලපාන ලදි. මෙහිදී පුනරුදයේ ප්‍රධාන සාධක වන නව දැනුම, නව දේශයන් සහ ජාතිකත්වය මූලික සාධක විය. ගැලීලියෝ සහ කොපර්නිකස් වැනි විශාරදයන් නව අදහස් සහ යථාර්තයන් ඉදිරිපත් කරන විට එය කිතුණු නායකත්වය ඒ වන විට පවත්වාගෙන යෑමට උත්සහ කළ සෑම සත්‍යයේම භාරකාරත්වයට මහා තර්ජනයක් විය. පුනරුදය තුල බටහිරට සාපේක්ෂව ඔවුන් නව දේශයන් සොයා ගියත් ඒ වන විට මේ දේශයන්හි ස්වදේශිකයන් වාසය කරන ලදි. ජාතිකත්වයේ වර්ධනයත් සමග විවිධ ජන කොටස් තම තමන්ගේ ජාතිය, දේශය හා සංස්කෘතීන් ගැන වඩ වඩා උනන්දුවන්ට විය.

මේ පසුබිම තුල **15** වන ශත වර්ෂයේ බටහිර කිතුණු සභාව ඉතා ප්‍රබල ප්‍රතිසංස්කරණයකට ලක් විය. මේ ප්‍රතිසංස්කරනයේදී සමහර රටවල් රෝමය කේන්ද්‍ර කරගත් පාප්වහන්සේගේ අධිකාරීත්වය යටතේම සිටීමට තීරණය කළ අතර, අනෙකුත් රටවල් ස්වාධීන කිතුණු සංඝයන් නිර්මාණය කර ගන්නා ලදි. මේ ස්වාධීන සභා හැම විටම රෝමය කේන්ද්‍රගත සංඝයේ දුර්වලතා සහ දූෂණ ඔවුන්ගේ වැටහීමේ හැටියට පෙන්වා දුන් අතර ඔවුන් නිර්මාණය කළ නව සංඝයන් මෙම දුර්වලතා සහ දූෂණ අවම කරමින් පවත්වාගෙන යෑමට විධිවිධාන යොදන ලදි.

Community of Hope

### 1.5.1. ශ්‍රී ලංකාව තුල කිතුණු සංඝයේ සංක්ෂිප්ත සමාජ ඉතිහාසාත්මක වර්ධනය හා විකාශනය

සමස්ත කිතුණු සංඝයේ මේ සංක්ෂිප්ත සමාජ විද්‍යාත්මක ඉතිහාසය සමග ශ්‍රී ලංකාවේ කිතුණු සංඝයේ විකාශනය ගැන අවබෝධයක් එඬේරා සතු වීම එඬේරාගේ සේවය අර්ථවත්ව කරගෙන යෑමට අත්‍යාවශ්‍යය වේ. 16 වන ශත වර්ෂයේ පෘතුගීසි අධිරාජ්‍යය සමග කිතු දහම ලංකාවට පැමිණි බව ජනප්‍රිය මතය වුවත් ඊට පෙර කිතුණු ආභාසය ලංකාව තුල තිබුණු බවට සමහර පුරාවිද්‍යාත්මක සාධක වලින් සහ ලියවිලි වලින් සනාථ වේ.

මේ සාධක අතර පුරාවිද්‍යාත්මක සාධක 2 ක් සහ ලියවිලි 2 ක් ඉතා වැදගත් කොට සැලකිය හැකිය. 1912 දී පුරාවිද්‍යාත්මක කැණීම් වලින් හමුවූ දැනට අනුරාධපුරයේ කෞතුකාගාරයක ඇති ගලක කැටයම් කරන ලද 5 වෙනි හෝ 6 වන ශත වර්ෂයට අයත් නෙස්ටෝරියන් කුරුසිය හා වවුනියා කෞතුකාගාරයේ තබා ඇති 5 වෙනි හෝ 6 වන ශත වර්ෂයටම අයත් විය හැකි කිතුණු ප්‍රසාද ස්නාපනය සඳහා භාවිතා කරන ලදැයි අනුමාන කළ හැකි ශෛලමය බඳුන පුරාවිද්‍යාත්මකව ලංකාව තුල කිතුණු ආභාසයට සාධක ලෙස සැලකිය හැකිය.

ලිඛිත සාක්ෂි ලෙස 6 වන ශත වර්ෂයේ ග්‍රීක් භාෂාවෙන් ලියැවී ඇති ටොපෝග්‍රපියා ක්‍රිස්ටියානා සහ චූල වංශයේ ග්‍රන්ථාරූඪ වී ඇති අදාළ කොටස වැදගත් වේ.

ග්‍රීක් ග්‍රන්ථයේ එකල ලංකාවේ විසූ කිතුණු සංඝයක් ගැන වාර්තා වන අතර චූල වංශයේ සඳහන් වාර්තාව අනුව මිගාර නම් දකුණු ඉන්දියානු සෙනෙවියා කිතුණුවෙක් බවත්, ඔහු කිතුණු ලබ්ධිය ව්‍යාප්ත කිරීමට වෙර දරා ඇති බව පළමු ශ්‍රී ලාංකික පුරාවිද්‍යාත්මක කොමසාරිස් වන සෙනරත් පරණවිතාන මහතා මතයක් ඉදිරිපත් කර තිබේ.

පුරාවිද්‍යාත්මක සාධක අනුව 16 වන ශත වර්ෂයේ පෘතුගීසීන්ගේ පැමිණීමට පෙර ශ්‍රී ලංකාව යම් ආකාරයකින් කිතුණු ආභාසයෙන් පෝෂණය වූ බව නොඅනුමානය.

එහෙත් ප්‍රබල ලෙස කිතු දහමේ ආභාසය ලංකාව තුළ ක්‍රියාත්මක වීම ආරම්භ වන්නේ 16 වන ශත වර්ෂයේ මුල් භාගයේ පෘතුගීසීන්ගේ සම්ප්‍රාප්තියත් සමගය. එකල කෝට්ටේ රාජධානියේ පැවති අර්බුදකාරී තත්වය තුල බුවනකබාහු රජතුමා තම සහෝදරයා වූ මායාදුන්නගෙන් ආරක්ෂාවීම සඳහා පෘතුගීසීන්ගේ ආධාර පැතිමත් සමග පෘතුගීසීන්ගේ බලය ක්‍රමානුකූලව තහවුරු විය. එසේම බුවනෙකබාහු රජතුමා තමාගෙන් පසු රජවීමට සිටි ධර්මපාල කුමාරයා පෘතුගීසීන්ගේ රැකවරණයේ සිටි රෝමානු කතෝලික ආගමික නායකයන් යටතේ අධ්‍යාපනය ලබා දීමට සැලැස්වීම ලංකාවේ කිතුණු සංඝයේ විකාශනයේ සන්ධිස්ථානය විය.



අනතුරුව ධර්මපාල කුමාරයා රජවීමත් සමග ඔහු ලාංකික රාජ පරපුරේ ප්‍රථම කිතුණු රජතුමා බවට පත්විය. ධර්මපාල රජතුමාගෙන් පසු ක්‍රමානුකූලව ලංකාවේ මුහුදුබඩ පළාත් පෘතුගීසීන්ගේ පාලනයට නතුවීමත් සමග රෝමානු කතෝලික කිතු දහම මේ ප්‍රදේශවල ව්‍යාප්ත විය.

1505 ලංකාවට ගොඩබට පෘතුගීසීන්ගේ පාලන සමය 1658 ලන්දේසීන්ගේ අතට පත්වීමත් සමග පෘතුගීසි යුගය නිමාවට පත්විය. එහෙත් ඔවුන් දෙසූ රෝමානු කතෝලික කිතු දහම ඔවුන්ගේ පාලන සමයේ ස්ථිර ප්‍රතිඵලයක් ලෙස ලංකාවේ යථාර්ථයන්ට එක්විය. 1658 ලන්දේසීන් ලංකාවේ මුහුදුබඩ පළාත් යටත් කර ගැනීමත් සමග ලංකාවේ කිතුණු ඉතිහාසයේ තවත් පරිච්ඡේදයක් ආරම්භ විය. මේ පරිච්ඡේදයට එකල බටහිර ලෝකයේ කිතුණුවන්ගේ ආරවුල් එකහෙලා බලපාන ලදි.

මේ ආරවුල් වලදී රෝමය සහ පාප්වහන්සේ කේන්ද්‍ර කොටගත් රෝමානු කතෝලික සංඝය එක් පිලක් වූ අතර අනෙක් පිලට අයත් වූයේ ලෝකයේ නොයෙකුත් ප්‍රදේශවල මෙකල බිහිවූ විවිධ ප්‍රතිසංස්කෘත නිකායන්ය. මෙහිදී පෘතුගීසීන් රෝමය සහ පාප්වහන්සේ කේන්ද්‍ර කොටගත් රෝමානු කතෝලික සංඝයට අයත් වූ අතර ලන්දේසීන් අයත් වූයේ ප්‍රතිසංස්කෘත කණ්ඩායමටය. මේ සන්දර්භය තුළ ලන්දේසි බලය ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල තහවුරු වීමත් සමග ලන්දේසීන් ඔවුන්ගේ ප්‍රතිසංස්කෘත ඕලන්ද රෙපරමාදු නිකාය හැර අන් සියලු ලබ්ධීන් ඔවුන්ගේ බල ප්‍රදේශය තුල තහනම් කරන ලදි. මේ තහනම් නියෝගයත් සමග ලංකාවේ සෑම ලබ්ධියක්ම ලන්දේසීන්ගෙන් පීඩාවිඳි අතර ලන්දේසීන් රෝමානු කතෝලික කිතුනු දහම ලංකාවෙන් අතුගා දැමීම සඳහා සෑම විධිවිධානයක්ම යොදන ලදි. මේ තත්වය තුල වෙස්වලාගෙන ඉන්දියාවෙන් ලංකාවට පැමිණි ජුසේ වාස් සහ ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමන්ලා ඇතුළු සුළු කණ්ඩායමක් ලන්දේසි පාලන සමය තුල රෝමානු කතෝලික දහම ලංකාව තුල රැක ගන්නා ලදි. මේ තත්වය තුල රෝමානු කතෝලිකයන් බොහෝ පීඩා වින්දත් අධිරාජ්‍යවාදී ආකර්ෂණයෙන් මිදී සමාන්‍ය ජනතාවට වඩා සමීප විය.

1796 ලන්දේසීන්ගෙන් පාලන බලය අල්ලා ගත් ඉංග්‍රීසීන්ගේ ක්‍රියා කලාපයන් මීට පෙර අධිරාජ්‍යවාදීන් වූ පෘතුගීසීන්ට හා ලන්දේසීන්ට වඩා නොයෙකුත් ආකාරයෙන් වෙනස් විය. මොවුන් 1815 මුළු ශ්‍රී ලාංකික දිවයින මොවුන්ගේ පාලන බලයට නතු කර ගැනීමටත් පෙර, 1799 දී ලන්දේසීන්ගේ ආගමික තහනම ඉවත් කර සෑම ආගමකටම නිත්‍යානුකූලව නිදහසේ ක්‍රියාත්මක වීමට මග පාදන ලදි. මේ නිසා බෞද්ධ සහ හින්දු වැනි විවිධ ලබ්ධිකයන්ට පමණක් නොව විවිධ කිතුණු නිකායන්ට පවා ශ්‍රී ලංකාව තුල තම දහමවල් ඇදහීමටත්, ප්‍රකාශ කිරීමටත් අවස්ථාව උදාවිය.

බ්‍රිතාන්‍යය පාලකයෝ එංගලන්තයේ මෙන් එංගලන්ත සභාව රාජ්‍ය ආගම ලෙස ලංකාවේ අධිරාජ්‍යය පාලනය තුළ පවත්වාගෙන යන ලදි. මේ නිසා එංගලන්ත සභාවට අධිරාජ්‍ය පාලනයෙන් වැඩි වාසි ලැබීම නිතැතින්ම සිදුවිය.

මෙසේ අධිරාජ්‍ය රැකවරණය යටතේ කිතු දහම ලංකාව තුල ස්ථාපිත වීම ශ්‍රී ලාංකික කිතු දහමට සෘජුවම බලපෑම් ඇති කිරීමට සමත් විය. මේ බලපෑම් ගැන මනා අවබෝධයක් සෑම එඬේරෙක්ම සතුවීම එඬේර සේවය තුල පැන නගින නොයෙකුත් අවස්ථාවන් වටහා ගැනීමටත්, නිරාකරණය කර ගැනීමටත් උපකාරයක් වනු ඇත.

පෘතුගීසීන්ගේ රැකවරණය යටතේ ලංකාවේ ක්‍රියාකාරී වූ කිතුණු නායකයන් අධිරාජ්‍යවාදී පාලනය සහ කිතුණු සංඝය අතර යම් පරතරයක් තබා ගැනීමට නිතර වග බලා ගත් අතර අධිරාජ්‍යවාදී රජයෙන් වේතන ලබා නොගන්නා ලදි. මෙහිදී මෙම ආගමික නායකයන් ලංකාවේ බහුතර ආගමික නායකයන් වන බෞද්ධ භික්ෂූන්වහන්සේලා මෙන් බ්‍රහ්මචාරීන් වීමත්, සාමාන්‍ය ජනතාව සමග මිශ්‍ර වී ක්‍රියා කිරීමත්, ඔවුන්ගේ ආභාසය ලංකාව තුළ අන් කිතුණු නිකායන්ට වඩා ප්‍රබල වීමට හේතු සාධක වූ බව අනුමාන කළ හැකිය.

එසේම මොවුන් නිතර ජන සමූහයන් තම දහම වැළඳ ගැනීමට යොමු කළ අතර තනි පුද්ගලයන් තම ඥාති හිතමිත්‍රාදීන්ගෙන් හුදකලා කොට කිතු දහමට යොමු කිරීමට එතරම් උනන්දුවක් නොදක්වන ලදි. එසේම රෝමානු කතෝලික කිතු දහමේ පිළිම, පුද පූජා සහ වත් පිළිවෙත් බුදු දහමේ, හින්දු දහමේ සහ ප්‍රාථමික ඇදහිලි වල නිරත වූ ලාංකික ජනතාවට වටහා ගැනීමට පහසු වූ බව නොඅනුමානය.

ඕලන්ද ප්‍රතිසංස්කෘත සංඝය සමස්ත ලෙස ගත් කල මධ්‍යම පන්තික ලබ්ධියක් වූ අතර පුද පූජා, වත් පිළිවෙත් සහ සංකේත භාවිතය අවම විය. පිළිම සම්බන්ධයෙන් ඔවුන්ගේ මතය වූයේ ඒවා බයිබලයේ පරණ ගිවිසුමේ දස පනතේ දෙවන පනතට පටහැනි නිසා කිතුණු සංඝය තුළ භාවිත නොකල යුතු බවයි. එපමණක් නොව තම ලබ්ධින් තුළ පිළිම භාවිතා කළ රෝමානු කතෝලික කිතුනුවන් ඇතුළු බෞද්ධ, හින්දු සහ ප්‍රාථමික ඇදහිලි පවත්වා ගෙන ගිය ජනතාව පව් කරුවන් හැටියට සලකා හැකි සෑම විටම ඔවුන්ගේ පිළිම විනාශ කිරීමට වග බලා ගන්නා ලදි. ඕලන්ද ප්‍රතිසංස්කෘත ලබ්ධිකයන් මෙසේ කිරීමෙන් බලාපොරොත්තු වූයේ මේ ජනතාව පිළිම වැඳීමේ පාප කර්මයෙන් මුදා ඔවුන්ගේ විමුක්තිය සඳහා සැබෑ දහම එනම් ඕලන්ද ප්‍රතිසංස්කෘත ඇදහිල්ල වැළඳ ගැනීමට ඔවුන් යොමු කිරීමයි.

ඉංග්‍රීසි පාලන සමයේ ලැබුනා වූ ආගමික නිදහසත් සමග ලංකාවේ සාම්ප්‍රදායික ආගම් වූ බෞද්ධ සහ හින්දු ලබ්ධීන්ගේ ප්‍රබෝධයක් ඇති විය.



මෙහිදී එංගලන්තයේ මෙකල වර්ධනය වෙමින් තිබූ ලිබරල්වාදී ආකල්ප සමග පැන නැගුණු සංකල්පයක් වන රාජ්‍ය පාලනය සහ ආගම අතර පරතරයක් පැවතිය යුතුය යන සංකල්පය මේ ආගම්වල ප්‍රබෝධයට මහගු අත්වැලක් විය. මෙහිදී ඇති වූ මූලික වාසිය නම් සාමාන්‍යයෙන් කිතුණුවන්ට සහ විශේෂයෙන් ඇංග්ලිකානු නිකායේ කිතුණුවන්ට එකල ලංකාව පාලනය කල බ්‍රිතාන්‍යය යටත් විජිත රාජ්‍යයෙන් තිබූ විශේෂ වරප්‍රසාද සාධාවාරාත්මක නොවන බව අවධාරණය කරමින් ජන මතයක් ගොඩ නැගීමට හැකි වීමයි.

1948 ලංකාවට දේශපාලනමය නිදහස ලැබීමත් සමග කිතුණුවන්ට තිබූ වාසිදායක තත්ත්වය තුරන් විය. මෙහිදී ජාතිකත්වය පිළිබඳ හැඟීම් වර්ධනය වීම සහ විදේශීය ගනුදෙනු අවම කිරීම නිසා කිතුණුවන්ට මානසික සහ මූල්‍යමය ගැටලු වලට මුහුණ දීමට සිදු විය. එමෙන්ම 70 දශකයේ මැද භාගය පමණ වන විට ලංකාව තුළ විද්‍යාමාන වූ විවෘත ආර්ථිකයේ සහ ගෝලීයකරණයේ වර්ධනයත් සමග ක්‍රමයෙන් කිතුණු විරෝධී ආකල්ප ලංකාව තුළ වර්ධනය විය.1980 ව දශකයේ සිට උත්සන්න වූ ජාති වාදී අරගලය හමුවේ කිතුණුවන්ට නැවත බොහෝ අර්බුද වලට මුහුණ දීමට සිදු විය. මෙයට මූලික හේතුව වන්නේ සෑම බෞද්ධයෙක්ම පාහේ සිංහල සහ සෑම හින්දු බැතිමතුන්ම පාහේ ද්‍රවිඩ වුවත් කිතුණු ප්‍රජාව සිංහල සහ ද්‍රවිඩ ජන කොටස් දෙකෙන්ම සමන්විත වීමයි.

ශ්‍රී ලාංකීය බහුතර ජනතාව කිතුණු සභාව තේරුම් ගැනීමට බොහෝ විට උත්සහ කරන්නේ මේ ඉතිහාසාත්මක පදනම මත සිටය. එම නිසා වර්තමානයේ එඬේර සේවයේදී සන්දර්භය වටහා ගැනීම හා ගැඹුරෙන් අවබෝධ කර ගැනීම එඬේර සේවයේ සාර්ථකත්වයට ඉතා වැදගත්ය.

# 2. පරිච්ඡේදය

## එඬේර සේවයේ සන්දර්භය

එඬේර සේවයේ දී අවට පරිසරය, සමාජය වටහා ගැනිම ඉතා වැදගත්ය. පාරසරික වටාපිටාව මෙන්ම ජන ජීවිතය තුල ජාතික, ආගමික සහ සංස්කෘතික බහුවිධත්වයන් එදිනෙදා ජීවිතයේදි මනුෂ්‍යයන්ට ඉතා වැදගත් වේ. ජන සමාජය තුළ මෙම විවිධ අංග ස්වාධීනව වෙන් වෙන් වශයෙන් ක්‍රියාත්මක නොවේ. බොහෝ විට මෙම බහුවිධත්වයේ සාධක දෙකක් හෝ කිහිපයක් විවිධාකාරයෙන් සම්මිශ්‍රනය සංකිර්ණ අනන්‍යතාවයන් ගොඩනගන අතර ඒවා සමාජයට විවිධ බලපෑම් ඇතිකිරිමට හේතු සාධක වි තිබේ. මෙහිදී ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන අනන්‍යතාවයන් අතර ජාති ආගමික සම්මිශ්‍රනය ඉතා වැදගත් වේ. මෙම අනන්‍යතාවයන් ජනතාවට ජන සමුහයන් ලෙස ස්ථාවරත්වයන් ගොඩ නැගීමටත් සුරක්ෂිත භාවය ගොඩනගා ගැනිමටත් ඉතා වැදගත් වෙයි. එඬේර සේවයේ දී සන්දර්භයේ විවිධත්වය අවබෝධ කර ගැනිම සාර්ථක සේවයක ආරම්භයයි.



## 2.1. සමාජ විවිධත්වය

ශ්‍රී ලංකාව ලෝකයේ බොහෝ රටවල් සමග භූගෝලීයව සැසඳු විට කුඩා වුවත් විවිධ බහු විධත්වයන්ගෙන් පෝෂණය වි තිබේ. ජාති ආගමික අනන්‍යතාවන් සම්බන්ධයෙන් ඇන්ඩෲ ග්‍රේලීගේ විග්‍රහයක් වර්ධනය කරමින් යං නැමැති පුද්ගලයා ඉදිරිපත් කර ඇති පහත විග්‍රහය ශ්‍රී ලාංකික සන්දර්භය අවබෝධ කර ගැනීමට ප්‍රයෝජනවත් වෙයි.

"පළමුව ජාති ආගමික සම්මිශ්‍රනය තුළ ආගම ජාතියේ පදනම ලෙස දැකිය හැකිය. ජුදෙව් සහ ආමිශ් මෙයට උදාහරණ වේ. දෙවනුව ජාතික ආගම තුල ආගම ජාතියේ එක් පදනමක් ලෙස ක්‍රියා කරයි. ග්‍රික් හෝ රුසියානු ඕතඩොක්ස් සභාවන් සහ ඕලන්ද ප්‍රතිසංස්කෘත සභාව මෙයට උදාහරණ ලෙස දැක්විය හැකිය.[1]



මෙහිදී ජාතික අනන්‍යතාවය ආගමික අනන්‍යතාවයෙන් තොරව ගෙනහැර දැක්විය හැකි අතර ආගමික අනන්‍යයතාව ජාතික අනන්‍යයතාවයෙන් ගෙනහැර දැක්විම විරලය. තෙවනුව ආගමික ජාති අනන්‍යතාවය දැක්විය හැකිය. මෙහිදී එක ආගමක් බොහෝ ජාතීන් හවුලේ අනුගමනය කරති. අයර්ලන්ත, ඉතාලිය සහ පෝලන්ත කතෝලිකයන් උදාහරණ ලෙස දක්වයි. මෙහිදි ජාතික අනන්‍යතාවයකින් තොරව ආගමික අනන්‍යතාවය දැක්විය හැකිය."

ශ්‍රී ලංකාව තුළ මුලිකව සංඛ්‍යාත්මකව වැදගත් වන්නේ 69% පමණ වන සිංහල බෞද්ධ අනන්‍යතාවයි. සුළු ජනකොටස් අතර ප්‍රධාන ප්‍රතිශතය වන්නේ 18% පමණ වන දමිළ හිංදු බැතිමතුන් ද 8% පමණ මුස්ලිම් බැතිමතුන් ද ලංකාවේ වෙසෙති. මෙහිදී බහුතර බෞද්ධයන් සිංහල සහ හින්දු බැතිමතුන් දමිළ විම කිතුණු අනන්‍යතාවයට සෘජුවම බලපාන කරුණකි. මේ තත්වය තුළ බෞද්ධාගමික අනන්‍යතාවය සිංහල ජාතික අනන්‍යතාවය සමගත් හින්දු ආගමික අනන්‍යයතාව දමිළ ජාතික අනන්‍යතාවය සමගත් සමිප සබඳතාවක් පවති. මෙම අනන්‍යතාවයන්වල දීර්ඝ ඉතිහාසය තහවුරු කිරිමට රුකුලක් වි තිබේ. මේ සමිප සම්බන්ධතාවයන් තුල සිංහල කිතුණු සහ දමිළ කිතුණු ජනතාවගේ අනන්‍යතාවයන් නිතර අර්බුදකාරි තත්වයක පවති. මෙම තත්ත්වය තුල ජාති ආගමික අනන්‍යතාවයන් පිළිබඳව සංකීර්ණ අවබෝධයක් එඬේරා සතුවිම අර්ථවත් එඬේර සේවයක් ඉටු කිරිමට මහෝපකාරි වෙයි.

පසුගිය අවුරුදු 500 තුළ අධිරාජ්‍යවාදි යුගයේදි සිංහල සහ දමිළ සුළුතරයක් කිතුණුවන් විමත් බහුතර සිංහල බෞද්ධ සහ දමිළ හින්දු අනන්‍යතාවයන් තවත් ශක්තිමත් වී තහවුරු විය. මෙහිදී සිංහල සහ දමිළ සුළුතර කිතුණුවන් විම බහුතර සිංහල බෞද්ධ සහ දමිළ හින්දු ජනතාව බොහෝවිට අර්ථකතනය කරන ලද්දේ සිංහල සහ දමිළ අනන්‍යතාවයන් පාවාදීමක් වශයෙනි. ජාතික ප්‍රශ්න වලදී බොහෝ සිංහල හා දමිළ කිතුණුවන් බහුතර සිංහල හා දමිළ ජනතාවගෙන් හුදකලා විම මේ තත්ත්වයට බලපෑ කරුණු අතර වැදගත් කරුණක් විය. නිදහස් සටනේදි පවා සමහර සිංහල හා දමිළ කිතුණුවන් පුද්ගලිකව දායක වුවත් සංස්ථාගත සභාවන් ඉංග්‍රිසි අධිරාජ්‍යවාදි රජය සමග පැහැදිලි සමිප සම්බන්ධතාවයන් නොකඩවා පවත්වන ලදි. මෙසේ කිතුදහම ජීවිත දර්ශනයකට වඩා අධිරාජ්‍යය ගැති ආයතනයක් ලෙස ශ්‍රී ලංකාව තුළ බහුතර සිංහල බෞද්ධ සහ හින්දු දමිළ ජනතාව අතර මතයක් තහවුරු විය.

ශ්‍රී ලංකාවේ ජන වාර්ගික අර්බුදය තුළ මේ අනන්‍යතාවයන් නොයෙකුත් ගැටළු සහ අර්බුදයන් නිර්මාණය කර තිබේ. මෙයට ප්‍රධාන හේතුව වන්නේ කිතුණු සංඝය තුල සිංහල හා දමිළ ජනකොටස් දෙකම නියෝජනය විමයි. සුළුතර කිතුණු ජනතාවට බොහෝ විට කිතුණු සංඝය තුල සහෝදරත්වයෙන් විසීමට සිදු වේ. සමාජය තුළ කිතුණු සිංහල දමිළ ජාතිකත්ව අනන්‍යතාවය තුළ ජීවත් වෙති.

අර්බුදකාරි වාතාවරණයන්හිදි බොහෝ විට කිතුණු අනන්‍යතාවයට වඩා සිංහල හා දමිළ අනන්‍යතාවයන් ඉස්මතු වීම ලංකාවේ මෑත ඉතිහාසයේ නිතර විද්‍යාමාන වූ කරුණකි. ඉහත තත්ත්වය ගැන සංවේදීව තමාගේ සේවය හැඩගැස්වීමෙන් සුභාරංචියේ වටිනාකම් තුළ ලාංකික සහ ජීවනයට දායක වීමට එඬේරුන්ට අවස්ථාව සලසා ගත හැකි වේ.

එසේම විවිධත්වය තුළ කිතුණු ජනතාවගේ අනන්‍යතාවය ගැන පැහැදිලි අවබෝධයක් එඬේරා සතුවීම ඉතා වැදගත් වේ. ලංකාවේ සංඛ්‍යාත්මකව විශාල ක්‍රිස්තියානි ජන කොටස මුහුදුබඩ ප්‍රදේශවල ධීවර කර්මාන්ත පසුබිමේ වෙසෙති. කිතුණුවන්ගෙන් විශාල බහුතරයක් රෝමානු කතෝලික නිකායට අයත් වන අතර ශ්‍රී ලාංකික  ජන සමාජය තුළ කිතුණු ආභාසය සහිත ප්‍රධාන සංස්කෘතියක් නිර්මාණය කර තිබේ. මෙම ප්‍රදේශයේ භාෂාව, ජන ඇදහිලි, ජන කථා සහ ආප්තෝපදේශ වැනි අංග කිතුණු ආභාසයෙන් බොහෝ සේ පෝෂණය වී තිබේ. මෙම ධීවර කිතුණුවන් තම කර්මාන්තයේ නියැලෙන විට ඔවුන්ට පාලනය කළ නොහැකි වර්ෂාව, මාරුත වැනි ස්වභාවික යථාර්තයන්ට මුහුණ දෙයි. මෙවැනි වාතාවරණයක් තුළ මෙම යථාර්ත වලට මුහුණ දීමට කිතුණු දහම තුලින් පන්නරය ලබයි. ජන ඇදහිලි ජන කථා ඒවායේ ඉතිහාසාත්මක සත්‍යයෙන් ස්වාධීනව මනුෂ්‍යන්ට බලපෑම් ඇති කරයි. සමාජ විද්‍යාත්මකව මේ සම්බන්ධයෙන් හෝටන් සහ හන්ට් මෙසේ අදහස් දක්වා තිබේ. මිථ්‍යා සහ ජන කථා සෑම සංස්කෘතියකම වැදගත් අංගයන්ය. ඒවා ධෛර්‍යය, පූජාවීම වැනි ගුණාංග වලට ප්‍රබෝධය ලබා දීමට සමත් අතර වියෝවීම් වලදී සහනය ගෙනදෙයි. සමාජ විද්‍යාත්මකව මෙම කථාවල සත්‍ය අසත්‍ය භාවය වැදගත් නොවේ. හොල්මන් ගැන විශ්වාස කරමින් ක්‍රියා කරන අයට ඒවා සත්‍ය වේ. මේ නිසා මිථ්‍යා ජන කථා සහ ගුප්තාර්ත ඇදහිලි ගැන අවබෝධයක් නොමැතිව කිසිම ජන සමාජයක ක්‍රියාකාරීත්වය තේරුම් ගත නොහැකිය.[2]

දකුණේ සිංහල බෞද්ධ බහුතරයක් සහ උතුරු හා නැගෙනහිර දමිළ හිංදු බහුතරයක් ජීවත් වන නගරබද ප්‍රදේශ තුල සිංහල හා දමිළ කිතුණුවෝ උප සංස්කෘති නිර්මාණය කර තිබේ. මෙම කිතුණුවන් ප්‍රධාන සිංහල බෞද්ධ හා හින්දු දමිළ සංස්කෘතිවල ජීවත් වන අතර එම සංස්කෘති තුල ප්‍රධාන සංස්කෘතිවල විවිධ කිතුණු ලකුණු නිර්මාණය කර තිබේ. මෙම ප්‍රදේශවල ජනතාව භූගෝලීයව මිශ්‍රව ජීවත් වෙති. මෙසේ ජීවත් වීමෙන් ඇතිවන මිතුදම් නිසා සමහර අවස්ථාවල මොවුන් එකිනෙකාගේ ආගමික වත්පිළිවෙත් වලට සහභාගි වෙති. ලංකාවේ ජනතාවගෙන් බහුතරයක් ජිවත්වන ගැමි කෘෂිකාර්මික රටාව තුල කිතුණු සංඝයන් එතරම් ස්ථාපිත වී නොමැත. මේ නිසා බොහෝ විට එම රටාව තුල සිටින කිතුණු සුළුතරය ප්‍රතිවිරුද්ධ  සංස්කෘතියක් නිර්මාණය කර තිබේ. මේ සමාජ විවිධත්වය තුල එඬේර සේවයේ මුහුණ දීමට සිදුවන යථාර්ථයන් විවිධය.



මුහුදුබඩ කිතුණු බහුතරයක් සහිත ප්‍රදේශවල දේශපාලන හා සමාජයමය වශයෙන් කිතුණු බලය තහවුරු වී ඇති නිසා මේ ප්‍රදේශවල කිතුණු විරෝධී බලපෑම් අවම වශයෙන් දැකිය හැකි වේ.

එඬේරා තමා සේවය කරන ප්‍රදේශයේ ජන කථා, ජන ගී, ජන ඇදහිලි සම්බන්ධව අධ්‍යයනය කිරීම එම ප්‍රදේශයේ ජනතාවගේ සිතුම් පැතුම් තේරුම් ගැනීමට අත්‍යාවශ්‍යය. ජනකථා වැනි දේ බොහෝ විට ඒවායේ ඉතිහාසාත්මක පසුබිමෙන් ස්වායත්තව මනුෂ්‍යයන්ගේ පැවැත්මේ යථාර්තයන් ගෙන හැර දක්වයි. ශ්‍රී ලංකාව තුල සේවය කරන්නට එඬේරුන්ට ප්‍රධාන වශයෙන් ග්‍රාමීය හා නාගරිකව සේවය කිරීමට සිදුවන නිසා මෙම සන්දර්භය තුළ සමහර යථාර්ථයන් වටහා ගැනීම මෙම සේවයට පිටුවහලක් වෙයි. ග්‍රාමීය බැඳීම් ශක්තිමත්ය. ගැමියන් - දුරින් ජීවත් වේ. නමුත් එකිනෙකාට සමීපයි. නගර - ලගින් ජීවත් වේ. නමුත් එකිනෙකාට සමීප නැත.

## 2.2. ආර්ථික විවිධත්වය

ලංකාවේ ආර්ථික පසුබිම් ඉතා සංකීර්ණය. එම නිසා එඬේරෙකු යම් ප්‍රදේශයක සේවය කරන විට තමා සේවය කරන ප්‍රදේශයෙත් සමස්ත ශ්‍රී ලංකාවෙත් ආර්ථිකය ගැන අවබෝධයක් ලබා ගැනීම එඬේර සේවය හරියාකාරව කරගෙන යැමට අත්‍යාවශ්‍යය කාරණයකි. එමෙන්ම පවතින ප්‍රධාන ආර්ථික ක්‍රමය හැදෑරීම ද එඬේරා විසින් කල යුතු වේ. ලංකාවේ ජනගහනයෙන් 70% පමණ ගැමි ගොවි ආර්ථික රටාවක ජීවත් වෙති. මෙම ආර්ථික රටාවේ ජීවත් වන ජනයා ස්වභාවික ලෝකය සහ පරිසරය සමග සබැඳිතාවයකින් ජීවත් වෙති. මේ ජනයා අතර සමීප නෑදෑ සම්බන්ධතා සහ සමාජීය සම්බන්ධතා නිතර දැකිය හැකිය. මොවුන් නගරයේ තරම් කාර්ය බහුල ජීවිතයකට හුරුවූ අය නොවේ. මේ ආර්ථික රටාවේ ජීවත් වන බොහෝ ජනයා සෑමදේම මුදලින් නිර්ණය නොකරයි. මයිකල් රොද්‍රිගෝ පියතුමා පැවසුවේ,"දුගියන් අපගේ අනුකම්පාවේ ප්‍රතිමූර්තින් නොව අපගේ දෛවයේ සහකරුවන්ය".[3]

මෙම ආර්ථික රටාවේ ශ්‍රී ලාංකික ජනයාගෙන් බහුතරයක් ජීවත් වුවත් මෙම රටාවේ ජීවත් වන කිතුණුවන් විරලය. එසේම දැනට පවතින කිතුනු ආකල්ප සහ වටිනාකම් මෙම රටාවට එතරම් අනුකූල නොවේ. එහෙත් ප්‍රවේශමෙන් විග්‍රහ කිරීමේ දී මෙම රටාවේ ආකල්ප සහ නැකම් කිතු දහමට ඉතා සමීප බව දැකිය හැකිය. ශ්‍රී ලාංකික සමාජයේ දිනෙන් දින උත්සන්න වන ඇති නැති පරතරය තුළ ක්‍රමානුකූලව ඉතා සුළු පිරිසක් බොහෝ ධනවත් වන අතර ඉතා විශාල ජනතාවක් දුප්පත් වෙමින් පවති. මේ තත්වය තුළ ප්‍රතිශතයක් වශයෙන් ගත් විට ක්‍රිස්තියානි දුප්පතුන්ගේ ප්‍රතිශතයට වඩා බෞද්ධ සහ හින්දු දුප්පතුන්ගේ ප්‍රතිශතය විශාලය. මේ යථාර්තය තුළ සමස්තයක් ලෙස කිතුණු සංඝය ධනවත් ජනකොටසක් ලෙස බහුතර ජනතාව හැඳින්වීම නොවැළැක්විය හැකිය.

### 2.2.1. ධනවාදි ආර්ථිකය

ශ්‍රී ලංකාව තුළ ධනවාදි ආර්ථිකයේ වර්ධනය පැහැදිලි වන්නේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදි යුගයේදිය. ධනය කේන්ද්‍රගත මෙම සමාජ රටාවේ ප්‍රධාන අරමුණ ලාභයයි. ශ්‍රී ලංකාවේ අද පවතින බොහෝ කිතුණු නිකායන් ලංකාවට හඳුන්වාදෙනු ලැබුවේ මෙම අර්ථික රටාව තුළය. මෙම ධනවාදී ආර්ථිකයේ වර්ධනය හා ප්‍රොතෙස්තන්ත කිතුණු නිකායන් අතර සමිප සබැඳිතාවයක් පවතී. ප්‍රොතෙස්තන්ත ධර්මය ප්‍රචලිත වූ ස්ථානවල ධනවාදී ආර්ථිකයේ වර්ධනය නිරන්තරයෙන් සිදුවූ බව විශාරදයින් පෙන්වා දී තිබේ. මෙම විශ්වීය යථාර්ථය ශ්‍රී ලංකාව තුළද එසේම විද්‍යාමාන වේ. ප්‍රොතෙස්තන්ත ධර්මය ප්‍රචලිත වූ ස්ථානවල ධනවාදී ආර්ථිකයේ වර්ධනය ලංකාවේ නගරබද ප්‍රදේශවල පැන නැගුණු අතර ක්‍රමානුකූලව එහි බලපෑම ගම් නියම් ගම් කරා වර්ධනය විය.

### 2.2.2. විවෘත ආර්ථිකය - ගෝලියකරණය

1977 දී ලංකාව තුළ නිල වශයෙන් විවෘත ආර්ථික ක්‍රමය ස්ථාපිත කිරීමෙන් පසු විවිධ බඩු භාණ්ඩ සහ ආයතන නොයෙකුත් රටවලින් ලංකාවට ගලා එන්නට විය. නිදහස් වෙළඳ කලාප ඇති විමත් සමඟ බොහෝ නිමි ඇඳුම් කර්මාන්ත ශාලා විවෘත විය. මේ තත්ත්වය තුළ අවශ්‍ය භාණ්ඩ සීමාවකින් තොරව මිලදී ගැනීමට ජනතාවට අවකාශ සැලසිනි. නිමි ඇඳුම් කර්මාන්ත ශාලා වල සමහර කාන්තාවන්ට රැකියා අවස්ථා විවෘත විය. එහෙත් මෙය නිදහස් ආර්ථිකයේ වංශ කථාවේ එක් පැත්තක් පමණි. නිදහස් ආර්ථිකයත් සමග සීඝ්‍රයෙන් ඉතා සුළුතරයක් පොහොසත් විම ආරම්භ වූ අතර බහුතරයක් ක්‍රමානුකූලව ඉතා දුප්පත් විමට පටන් ගන්නා ලදි. බහුජාතික සමාගම් කුඩා කර්මාන්ත ගිල ගැනීමත් සමග අත් යන්ත්‍ර වලින් රෙදි විවීම වැනි සුළු කර්මාන්ත වල නියැලුනු අයට ක්‍රමානුකූලව රැකියා අහිමි විය. විවෘත ආර්ථිකය තුළ ලෝකයේ විවිධ ස්ථාන වල සැම ආකාරයෙන්ම එක සමාන ව්‍යාපාර ආරම්භ විය. මේ පසුබිම තුළ ලෝකයේ විවිධ ස්ථානවල එකම වර්ගයේ ඇඳුම් පැළඳුම්, ආහාර පාන, චාරිත්‍ර වාරිත්‍ර විවෘත ආර්ථික සංස්කෘතිය වැළඳගත් අය අතර ප්‍රචලිත විම වර්ධනය විය. අද බොහෝ රටවල මෙම තත්ත්වය එම රටවල සාම්ප්‍රදායික සංස්කෘතින්ට තර්ජනයක් වී තිබේ.

මෙම නිදහස් ආර්ථිකයේ සහ ගෝලියකරණයේ වර්ධනය තුළ 1970 දශකයේ අග පටන් මීට පෙර ලංකාවේ නොතිබුනු විවිධ බටහිර කිතුණු දර්ශනයන් ලංකාව තුල වර්ධනය විය.

මෙම දර්ශනයන් ලංකාවේ වර්ධනය වී තිබු සාම්ප්‍රදායික කිතුණු නිකායන්ට වඩා නිදහස් ආර්ථිකයේ සහ ගෝලියකරණයේ රටාවන් සමග සමීපව සම්බන්ධ විම ලංකාවේ සාම්ප්‍රදායික සංස්කෘතින් සහ ලබ්දින් සමග ආතතියන් ඇති කිරීමට සමත් විය.



මෙම දර්ශනය හරහා දියත් වූ ලාංකික සභ්‍යත්වයන්ට එතරම් ගරුත්වයක් නොදක්වන ධර්මදූත ව්‍යාපාරයන් මෙම තත්ත්වය උත්සන්න කිරීමට හේතු සාධක විය.

### 2.3. දේශපාලනික විවිධත්වය

ලංකාවේ සේවය කරන සැම එඬේරෙක්ම නිදහසෙන් පසු දේශපාලන ප්‍රවනතා ගැන අවබෝධයක් ලබා ගැනීම අත්‍යාවශ්‍යය. 1948 ලංකාවට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් දේශපාලන නිදහස ලැබුන අතර බටහිරකරණය වූ සුළු ජන කොටසක් අතට දේශපාලන බලය පවරන ලදි. අතිතයේ සිට වර්තමානය දක්වා රටේ දේශපාලනික අස්ථාවර භාවය හා ස්ථාවර භාවය පිටුපස ඇති සන්දර්භය වටහා ගැනීම තුළ එඬේර කාර්යභාරය වටහා ගැනීම එඬේර සේවකයාගේ වගකීම වේ.

### 2.3.1. යටත් විජිත යුගය සහ දේශපාලන අස්ථාවරත්වය

අද ලංකාව තුළ ව්‍යාප්ත වී තිබෙන බොහෝ කිතුණු නිකායන්ගේ වංශ කථාව අධිරාජ්‍යය යුගය හා බැඳී පැවතිම එඬේර කාර්යභාරයේ සන්දර්භය තුළ විවිධ බලපෑම් නිර්මාණය කිරීමට සමත් වී තිබේ. මේ අධිරාජ්‍ය යුගයේ ක්‍රියාකාරිත්වය ගැන එඬේරුන් පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම වර්තමානය පවතින සමහර තත්වයන් වටහා ගැනීමට මහෝපකාරි වේ.

19 වන ශත වර්ෂයේ මැද භාගයේ ඇති වූ බෞද්ධ පුනරුදය ලංකාව තුළ කිතුණු අනන්‍යතාවයේ තීරණාත්මක සන්ධිස්ථානයක් විය. මේ කාලයේදී සමහර ප්‍රොතෙස්තන්ත්‍ර මිෂනාරිවරුන් හා බෞද්ධ නායකයන් අතර පැවති වාද පහ බෞද්ධ බැතිමතුන්ගේ මානසික ශක්තිය තහවුරු කිරීමට මහෝපකාරි විය. මින් අනතුරුව හෙන්රි ස්ටිල් ඕල්කට් සහ අනගාරික ධර්මපාල වැනි නායකයන් කේන්ද්‍රගතව ඇති වූ බෞද්ධ ගිහි ප්‍රබෝධය කිතුණු ආභාසයෙන් බුදු දහමට නවෝදයක් ලබා දීමට සමත් විය.

එසේම දේශානුරාගි ජාති අනුරාගි විමුක්ති සංවිධාන හා විමුක්ති ව්‍යාපාර බිහි විය. ලංකාවේ පමණක් නොව ලොව පුරාම විමුක්ති ව්‍යාපාරවල වර්ධනය වර්තමාන සමාජ යථාර්ථයක් වී තිබේ.මෙම විමුක්ති සංවිධාන ගැන සලකා බලන විට ප්‍රධාන වශයෙන් පෙනෙන කරුණක් නම් මෙම සංවිධාන වල ක්‍රියාකාරි සාමාජික සාමාජිකාවන් බහුතරයක් තරුණ තරුණියන් විමයි.

### 2.3.2. පසු යටත් විජිතවාදි යුගය

1956 වන තෙක් ක්‍රිස්තියානි බ්‍රිතාන්‍ය පාලන සමයේ වරප්‍රසාද ලබා ගත්තේ ය. මන්ද 1948 අප ශ්‍රී ලංකා ද්වීපය නිදහස ලබා ගත්තත් කිතුණු නිකායන් 1960 පමණ වන තෙක් නිදහස ලබා තිබුනේ නැත.

රටේ නිදහස ඇති වීමෙන් පසු ඇති වු සංස්කෘතික හා දේශපාලන වෙනස් වීම් වල ප්‍රතිඵල වුයේ කිතුණු නිකායන් අර්බුද වලට මුහුණ දීමට සිදු වීමත්, කිතුණු විරෝධී ස්වභාවයක් ක්‍රමාණුකූලව වර්ධනය වී  අද දක්වා දැකිය හැකිය හැකි වීමත්ය. කිතුණුවන්ට මුහුණ දීමට සිදුව ඇති අර්බුද අතර සභා පරිපාලන විධි, මුදල්, භෞතික සම්පත් නඩත්තුව යන කාරණා ද කිතුණුවන්ට විරුද්ධ වන කාරණා අතර  භූගෝලීය ව්‍යාප්තිය, ඉහළ අධ්‍යාපන මට්ටම හා රැකියාවන් බොහෝ දෙනෙක් නිරතවීම, අන්තර් ජාතික සම්බන්ධතා මෙන්ම භාෂාව, දේශපාලනය කෙරෙහි ආගම බලපෑම, කිතු නිකායන් දේශයට අනුගත නොවී තිබීම, කිතුණුවන් සුළු ජන කොටසක් වීමත් කිතුණු අධිමාන්නයක් ඇති කර ගැනිම යන සාධක බලපාන ලදි. වර්තමානයේ ද එඬේර සේවයට අභියෝගයක් තිබේ.

### 2.3.3. වර්තමාන යුගය - ජනවාර්ගික සිවිල් යුද්ධයෙන් පසු යුගය

2009 වසරේ ලංකාවේ අවුරුදු 30 පමණ පැවති සිවිල් යුද්ධයේ ආයුධ සන්නද්ධ අරගලය යම් ආකාරයකින් නිමා වුවත් සම්පූර්ණ ජනවාර්ගික අර්බුදය මුළුමනින්ම සමතයකට පත් වී ඇතැයි කිව නොහැක. එය අළු යට ගින්දර මෙන් පවතින තත්වයකි. එඬේර සේවයේ සන්දර්භයේ ඇති මෙම සංවේදී යථාර්තය එඬේරාගේ සෑම ක්‍රියාකාරිත්වයකදීම සැලකිල්ලට භාජනය කරමින් හරවත් එඬේර සේවයක යෙදීමට ඉතා වැදගත් වේ. මෙහිදී ඉහත යථාර්තය විවිධ දෘෂ්ඨි කෝණයන්ගෙන් අවබෝධ කර ගැනීම සහ එම යථාර්තයන් තම ජනයාට පුළුල් පරාසයක් තුළ අවබෝධ කරදීම එඬේරාගේ වගකීමක් සේ සැලකිය හැකිය.

## 2.4. ජේසුස්වහන්සේගේ එඬේර දර්ශනය

ජේසුස්වහන්සේගේ දර්ශනය කෘෂිකාර්මික ජීවන රටාවට කෙතරම් සම්පද? බහුතර ජනතාව  කෘෂිකාර්මික ජීවන රටාවට දිවිපෙවෙත ගෙනයන ශ්‍රී ලංකාවේ ජීවත්වන කිතුණුවන්ට මෙය වැදගත් ප්‍රශ්නයකි.

ශ්‍රී ලංකාවේ කිතුණුවන්ට මෙය දෙයාකාරයකින් වැදගත් වේ. ප්‍රථමයෙන් පසුගිය අවුරුදු 500 තුල අධිරාජ්‍යයවාදීන් කිතුදහම කාර්මීකරණය තුළ සහ ක්‍රමාණුකූලව වර්ධනය වු ධනවාදී ආර්ථික රටාවක් හඳුන්වා දුන් නිසා ජේසුස්වහන්සේගේ දර්ශනය  තුළ කෘෂිකාර්මික රටාව අවධාරණය කිරීම ඉතා අවම විය.

ජේසුස්වහන්සේගේ සමහර ඉගැන්වීම්වල අවධාරණය කරන මංපෙත් විවර වීම අවම විය. එහෙත් ජේසුස්වහන්සේ තම සමස්ථ දර්ශනය අධිරාජ්‍යවාදයට පටහැනිව ගෙන හැර දැක් වූ අතර ධනවාදයේ බීජයක්වත් එතුමාගේ ඉගැන්වීම් වලට පදනම් වූයේ නැත. ජේසුන්වහන්සේගේ දර්ශනයේ මූලික පදනම වූයේ දේව රාජ්‍යයයි. සංක්ෂිප්තව මෙහි අර්ථය වූයේ සාධාරණත්වය හා ධර්මිෂ්ඨකම රජයන සමාජයකි.



එතුමාගේ ඉගැන්වීමෙහි පදනම වූයේ මෙම රාජ්‍යය මේ මිහිපිට තුළ ස්ථාපිත වීමයි. මෙය එතුමා තම ශ්‍රාවකයන්ට ඉගැන්වූ යැදුම තුළ මනාව පැහැදිලි වෙයි. මෙය උන්වහන්සේ උගන්වන ලද්දේ මෙලෙසය, "ඔබගේ රාජ්‍ය ඒවා, ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් පෘථිවියේ කරනු ලැබේවා" මෙහිදී එතුමාගේ ඉගැන්වීම් හුදෙක් ලෝකෝත්තර දහමක් පමණක් නොව අනිවාර්යෙන්ම මේ මිහිපිට ක්‍රියාත්මක වන ක්‍රියාත්මක විය යුතු යාථාර්තයක් බව මනාව පැහැදිලි වෙයි. මෙම රාජ්‍යයේ විවිධ අංග ගෙනහැර දැක්වීමට එතුමා කෘෂිකාර්මික ජීවන රටාව පදනම් කර ගන්නා ලදි. එතුමා ජීවත් වුන සහ හැදුනු වැඩුනු පරිසරය ගැන සලකා බලන විට මෙය පුදුමයට කරුණක් නොවේ. වරක් මෙම රාජ්‍ය එතුමා අබ ඇටයකට උපමා කරමින් දේව රාජ්‍යයේ පැමිණීම ඉතාමත් කුඩා ඇසට නොපෙනෙන ලෙස ඇරඹුනත් ක්‍රමයෙන් එය වර්ධනය වන බව පෙන්වා දෙන ලදි. මෙම රාජ්‍යයේ දහම මනුෂ්‍යයන් වටහා ගන්නා ආකාරය අවබෝධකර දීමට එතුමා වපුරන්නාගේ උපමාව දේශනා ලදි. මෙහිදී එතුමා මග වැටුන බීජ, ගල් ගොඩේ වැටුනු බීජ, කටු ගොඩේ වැටුනු බීජ සහ සරු බිමේ වැටුනු බීජ වර්ධනය වූ ආකාරය උපයෝගි කර ගන්නා ලදි.

කම්කරුවන්ගේ සහ කුලිකරුවන්ගේ අයිතිවාසිකම් ගෙන හැර දක්වමින් එතුමා පවසන ලද්දේ ගවයෙකු පවා වැඩට යොදා ගන්නා විට ඌගේ කට නොබැඳිය යුතු බවයි. අනවශ්‍ය ලෙස තම ජීවිතය ගැන කනස්සලු වූ මනුෂ්‍යයන්ට කෙතේ මානෙල් ස්වාභාවිකව වැඩෙනා සැටි බලා පාඩමක් ඉගෙන ගන්නා ලෙස දේශනා කළ සේක.

එපමණක් නොව බයිබලයේ ජෝහාන්තුමාගේ සුභාරංචියට අනුව ජේසුස්වහන්සේ තමන්ව මිදි වැලකට උපමා කරගත් අතර තමන්ගේ ශ්‍රාවකයන් එම වැලේ අතු බව පවසන ලදි.

එතුමාගේ ජීවිතයේ උත්තරීතර පූජාව එනම් එතුමාගේ ජීවිත පූජාව පවා පැහැදිලි කිරීමට වරක් එතුමා භාවිතා කරන ලද්දේ කෘෂිකාර්මික ජීවන රටාවේ උදාහරණයකි. බීජයක් පොළොව මත වැටී මිය යැමෙන් ගසක් වී එල දරන සේ තම ජීවිතය මේ මහ පොළොව මත පූජා කිරීමෙන් එල දැරිය හැකි නව ජීවිතයක උපත ඇරඹෙන බව එතුමා වදාරන ලදි. එතුමා මේ උත්තරීතර පූජාව සිදු කරණ ලද්දේ ද ගසකින් සැදු කුරුසියක් මතය. ඉහත කී මෙම දර්ශනය එතුමාගේ දහමේ උත්තරීතර හරය වූ අතර මේ සත්‍යයට සහභාගීවීමට එතුමා තම අනුගාමිකයන් කැඳවන ලදි.

කිතුණු නමස්කාරයේ කේන්ද්‍රිය වත්පිළිවෙත් වන මහා තුති පිදුම හෙවත් යුකරිස්ත පූජාව ජේසුස්වහන්සේ ස්ථාපිත කරන ලද්දේ කෘෂිකාර්මික පෘථිවි එල භාවිතා කරමිනි. මෙය එකල ජේසුස්වහන්සේගේ ජාතියේ ජනතාව ඇදහූ ජුදෙව් දහමේ මූලික වත් පිළිවෙත් හා සමග සසඳන විට විප්ලවකාරි පරිවර්තනයකි.

මන්ද ජුදෙව් දහමේ කේන්ද්‍රය නමස්කාරය තුළ සතුන් පූජා කිරීම අනිවාර්ය්‍ය විය. ජේසුස්වහන්සේ ස්ථාපිත කළ මෙම නමස්කාරයේ මනුෂ්‍ය ශ්‍රමයෙන් වගා කළ තිරිඟු ඇඹරීමෙන් නිපදවන ලද රොටි කඩා එය මනුෂ්‍ය සංහතියේ විමුක්තිය සඳහා බිදෙන එතුමාගේ ශරීරය ලෙස අනුභව කිරීමට තම ශ්‍රාවකයන්ව යොමු කළ සේක.

දහඩිය මහන්සියෙන් හදාවඩා ගත් මිදි වැල් වලින් ලැබෙන මිදි එලය මිරිකීමෙන් නිෂ්පාදනය කළ මිදියුෂ එතුමාගේ රුධිරය ලෙස පානය කිරීමෙන් නව යුගයේ දේව රාජ්‍යයේ පුරවැසියන් වීමට එතුමා ඇරැයුම් කළ සේක. එදා සතුන් පූජා කරමින් තම විමුක්තිය පැතූ ජනතාවට මෙය  අභියෝගයක් විය.

මෙමගින් එතුමා මනුෂ්‍යය ශ්‍රමයේ එල විමුක්තියේ සංකේත ලෙස භාවිතා කර ඒවා තම ජීවිතයට සම කරමින් ඒවා අනුභව කරමින් තම ජීවිතයට එතුමාගේ ජීවිතය බද්ද කර ගැනීමට එතුමාගේ අනුගාමිකයන්ට ආරාධනා කරන ලදි. මේ අනුව බලන විට ජේසුස්වහන්සේගේ ඉගැන්වීම් සහ දර්ශනය කෘෂිකාර්මික ජීවිත රටාවට කෙතරම් සම්පදැයි මනාව පැහැදිලි වෙයි. මේ නිසා අධිරාජ්‍යවාදි යුගයේ ජේසුස්වහන්සේගේ ජීවිත රටාවේ මුල් ගලවා ආසියාවට හඳුන්වා දෙන ලද කිතු දහම නැවත වරක් කෘෂිකාර්මික ජීවිත රටාව තුල ස්ථාපිත කිරීම ශ්‍රී ලංකාවේ කිතුණුවන්ගේ මූලික කාර්යභාරයක් විය යුතුය.

එඬේරා මෙම විවිධ යථාර්ත සහිත සන්දර්භය තුල සේවය කරන විටදී සෑම විටම තම ස්ථාවරය සහ සංඝයේ ස්ථාවරය ගොඩනැගීමේදී දේවධර්මාචාර්ය්‍යය මැක්වාරි  විසින් ඉදිරිපත් කර ඇති පහත මූලික කාරණා වලට අවධානයට යොමු කිරීමෙන් අර්ථවත් එඬේර සේවයකට දේවධර්මානුකූල පදනමක් ගොඩ නගා ගත හැකි වේ.

❖ <u>අත්දැකීම්</u>

මනුෂ්‍යයන්ගේ අත්දැකීම් වයස, අධ්‍යාපනය හා සංචාරය කර ඇති ප්‍රදේශ වැනි කරණා අනුව විවිධ වේ. මෙම තත්ත්වය පුද්ගලයන්ට බලපාන සෘජු කරුණකි. මේ නිසා විවිධ මනුෂ්‍යන් අතර සේවය කරන විටදී එඬේරා තමා සේවය කරන ජනතාවගේ අත්දැකීම් ගැන පැහැදිලි අවබෝධයකින් සිටීම ඉතා වැදගත්ය. මෙම අවබෝධය සහිතව සංඝය තුළ සිටින විවිධ පුද්ගලයන් සමඟ එඬේරා ක්‍රියා කරන විට එමගින් එම මනුෂ්‍යයන්ටත්, සමාජයට සහ සංඝයටත් අර්ථවත් බලපෑමක් ඇති වෙයි.

❖ <u>එළිදරව්ව</u>

සෑම ආගමකම යම් ආකාරයක දිව්‍යමය එළිදරව්වක් ගැන විශ්වාසයන් තිබේ. එහෙත් එළිදරව් බොහෝ විට තර්කානුකූලව සම්පූර්ණයෙන් විස්තර කළ නොහැකි අත්දැකීමකි. වටහා ගත නොහැකි, තීරණ ගැනීමට අපහසු ජීවිතයේ නොයෙකුත් කාරණා සම්බන්ධයෙන් මනුෂ්‍යයන් බොහෝ විට දිව්‍යමය එළිදරව්වක් පතයි.



කිතුණු ආගමිකයෝ දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ තුළින් ඔවුනට එළිදරව්වන් ලැබෙන බව විශ්වාස කරති. මෙහිදී මෙම එළිදරව්වන් පැමිණෙන්නේ ඉතිහාසය තුළ ක්‍රියා කරන දෙවියන්වහන්සේගෙන් නිසා එම එළිදරව්වන් තමන් ජීවත්වන සන්දර්භයන් තුල වටහා ගත යුතු වෙයි. එසේම දෙවිඳුන් විශ්වයේ දෙවිඳුන් වන නිසා මෙම හැම එළිදරව්වක් තුළින්ම මුළු විශ්වයේම අභිවෘද්ධිය එතුමා බලාපොරොත්තු වන බව දේවධර්මානුකූල සත්‍යයකි.

❖ <u>ශුද්ධ ලියවිලි</u>

ඇදහිල්ලේ දේවධර්මානුකූල පදනම ගොඩනැගීමට ශුද්ධ ලියවිලි ඉතා වැදගත් ස්ථානයක් ගනී. යුග ගණනාවක් ඇදහිල්ලේ ජන සමාජය ප්‍රායෝගිකව තම දේවධර්මානුකූල හැදියාව ගොඩනැගූ ආකාරය ශුද්ධ ලියවිලි වල ගෙනහැර දක්වයි.

❖ <u>සංස්කෘතිය</u>

පුළුල් පරාසයක සලකා බැලූවිට මනුෂ්‍ය ජීවිතයේ සෑම අංගයක්ම සංස්කෘතිය සේ සැලකිය හැක.

❖ <u>සම්ප්‍රධාය</u>

සෑම මනුෂ්‍යය කොට්ඨාසයකටම තමන්ටම ආවේණික වූ සම්ප්‍රධායන් තිබේ. දේවධර්මානුකූල පදනම් වලට මෙම සම්ප්‍රධායන්ගේ ආභාසය නොලැබුනහොත් එම පදනම් එකී ජනයාට වෙන් වෙන් වශයෙන් අර්ථවත් වීම බලාපොරොත්තු විය නොහැක.

❖ <u>තර්ක ශාස්ත්‍රය</u>

තර්කය දේවධර්මානුකූල අවබෝධය ලබාගැනීමට අනිවාර්යෙන් අත්‍යාවශ්‍යය වෙයි. එහෙත් සමහර අවස්ථාවල මනුෂ්‍යයන් තර්කය දේවධර්මානුකූල මෙනෙහි කිරීමේ අංගයක් හැටියට වටහා ගැනීමට මැලිකමක් දක්වති. එඬේරා මෙම විවිධ යථාර්ත සහිත සංදර්භය තුල සේවය කරන විටදීත් සෑම විටම තම ස්ථාවරය සහ සංඝයේ ස්ථාවරය ගොඩනැගීමේදීත් අත්දැකීම්, එළිදරව්ව, ශුද්ධ ලියවිලි, සංස්කෘතිය, සම්ප්‍රධාය, තර්ක ශාස්ත්‍රිය කාරණා වැදගත් වේ.

එසේම ජනයන්ගේ අනන්‍යතාවයන් ජනතාවට ජන සමූහයන් ලෙස ස්ථාවරත්වයන් ගොඩ නැගීමටත් සුරක්ෂිත භාවය ගොඩනගා ගැනීමටත් ඉතා වැදගත් වේය යන්න වටහා ගැනීමත් ඒ අනුව ක්‍රියා කිරීමත් එඬේර වගකීමක්ම වන්නේය.




1 Yang, F. & Ebaugh, H.E. ( 2001 Sept), Religion and Ethnicity Among New Immigrants :The Impact of Majority/ Minority Status in Home and Host Countries, Journal for Scientific Study of Religion 40:3 (2001) p.36

2 Horton, P.B. & Hunt, C.L.(1964), Western Michigan University, Sociology, Mc Graw Hill Book Company London, p.76


**නාඳුනන තුවක්කුකරුවෙක් විසින් ඝාතනය කල, මයිකල් රොද්‍රිගෝ පියතුමා සමග මෙම පොතේ කතෘ 1986 මැයි-ජූනි බුත්තල ක්ෂේත්‍ර පුහුණුව ලැබූ අවධියේ එතුමා පැවසූ වදනකි.**



# 3. පරිච්ඡේදය

## එඬේරාගේ ජීවිතය හා කාර්යභාරය

කිතුණු දර්ශනයට අනුව සෑම කිතුණු සංඝයකම සෑම සාමාජිකයෙක්ම පූජකයෙකි/එඬේරෙකි. මෙම කිතුණු යථාර්ථය බයිබලයේ නව ගිවිසුමේ පළමුවෙනි පේදුරු හසුන්පතේ සඳහන් සියළු ඇදහිලිවතුන්ගේ පූජකත්වයෙන් මනාව පැහැදිළි වෙයි. මෙයින් අදහස් වන්නේ කිතුණු සංඝය තුළ නරඹන්නන් සහ රඟ දක්වන්නන් නොමැති අතර සංඝයේ සෑම පුද්ගලයෙක්ම සෑම විටම ක්‍රියාකාරිව සහභාගී විය යුතු බවයි. එහෙත් මේ පසුබිම තුළ දෙවියන්වහන්සේ විශේෂ කාර්යභාරයන් ඉෂ්ඨ කිරිමට පුද්ගලයන් කැඳවන සේක. එම නිසා එඬේර ජීවිතය සහා එහි කාර්යභාරය අවබෝධ කර ගැනිම වැදගත්ය.



### 3.1. එඬේර සේවය කුමකට ද?

එඬේර විශේෂ කැඳවීම් සිදුවන්නේ සංඝය තුළ සංඝය සඳහාය. මේ අනුව මුළු සංඝයටම අයත් එඬේර කාර්යභාරය ක්‍රියාත්මක කිරිමේ විශේෂ වගකීම් ගැනීමට දෙවියන්වහන්සේ පුද්ගලයන්ට විශේෂ කැඳවීම් කරන සේක. මෙම කැඳවීම් කරන්නේ කැඳවන පුද්ගලයන්ගේ මහිමය සඳහා නොව දෙවිඳුන්ගේ මහිමය සඳහාත් ආධ්‍යාත්මික වර්ධනය සඳහාත්ය. මේ නිසා කිතුණු දර්ශනයට අනුව සංඝයට අයත් නොවන පුද්ගලිකව තමන් එඬේරුන් යැයි හඳුනා ගන්නා පුද්ගලයන් සිටි නම් ඒ අය එඬේරුන් ලෙස පිළිගැනීමට අපහසුය. එසේම සැමවිටම සංඝයේ දායකත්වය සහිතව එඬේර කාර්යභාරයන් ක්‍රියාත්මක කිරීම එඬේරාගේ මූලික වගකීම වෙයි.

එඬේරාගේ මූලිකම කාර්යභාරය වන්නේ ජේසුස්වහන්සේ ප්‍රකාශ කළ දේව රාජ්‍යය ප්‍රකාශ කිරීමය. එඬේරා කරන සෑම කාර්යක්ම දේව රාජ්‍යයේ කාරණා විය යුතුයි. මෙම යථාර්තය ජේසුස්වහන්සේ තම ශ්‍රාවකයින්ට ඉගැන් වූ යැදුමේ මෙසේ සඳහන් වෙයි.

"ඔබගේ රාජ්‍ය ඒවා, ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් පෘථිවියේද කරනු ලැබේවා."

මෙහිදී ජේසුස්වහන්සේ අදහස් කරනු ලැබුවේ කාලයට , දීපයට සහ දේශයට සීමා නොවන දෙවියන්වහන්සේ කැමැත්ත ඉෂ්ඨ වන සෑම තැනම ක්‍රියාත්මක වන මෙම රාජ්‍යය ප්‍රකාශ කිරීම සෑම කිතුණුවකුගේ මෙන්ම එඬේරාගේ ද මූලික කාර්යභාරයයි. එමනිසා මෙම දෙවියන්වහන්සේගේ වැඩ සිටීම අප තුළ, අප අතර හා අප අවට ක්‍රියාත්මක වෙයි නම්, ජාති, ආගම්, කුලමල යනාදී භේදයන්ගෙන් තොරව මෙම ස්ථානවල දේවරාජ්‍ය ක්‍රියාත්මක වෙයි. මේ පදනම තුළ දේවස්ථාන පළාතේ දේව රාජ්‍යයයේ ක්‍රියාකාරිත්වය තුළ තම සේවය තම නිකායට අයත් සාමාජික සාමාජිකාවන්ට පමණක් එඬේරාගේ සේවය සීමා කළ නොහැකිය.

## 3.2. එඬේරාගේ ජීවිතය

ශ්‍රී ලාංකික සමාජය තුළ එඬේරාගේ ජීවිතය හා කාර්ය -භාරය වෙන් කළ නොහැක. එඬේරාගේ ජීවිත රටාවෙන් දෙසන දහම මුඛයෙන් දේශනා කරන දහමට වඩා ඉතා වැදගත්ය. මේ නිසා එඬේරාගේ ජීවිත රටාව හැසිරවිය යුතු ආකාරය ගැන අවබෝධයක් එඬේරා සතු වීම අත්‍යාවශ්‍යය. මෙහිදී ජේසුස්වහන්සේ තම ශ්‍රාවකයන්ගෙන් බලාපොරොත්තු වූ ජීවිත රටාව එඬේරා තුළ විද්‍යාමාන විය යුතු වෙයි. ප්‍රථමයෙන් තම ශ්‍රාවකයන්ට පියා ද, මවු ද, සහෝදර සහෝදරියන් යනාදි සැවොම අතහැර එතුමා අනුගාමී වීමට ජේසුස්වහන්සේ ආරාධනා කරන ලදි. මෙහිදී ජේසුස්වහන්සේ අදහස් කරන ලද්දේ තම සමීප ඥාතීන් කෙරෙහි ඇති තද හැඟීම්බර සබඳතාවය ඉවත් කර එතුමා අනුගාමී විය යුතු බවයි. වරක් ජේසුස්වහන්සේ දෙසූ උපමාවක මෙම කරුණ මනාව අන්තර්ගත වී තිබේ.

මේ උපමාවට අනුව ජේසුස්වහන්සේ අනුගාමී වීමට කැඳවූ විට සමහර පුද්ගලයින් නොයෙකුත් නිදහස කරුණු ඉදිරිපත් කරන ලදි. අයෙක් තමා ගොන් පස් බානක් මිලට ගත් නිසාත්, තවත් තැනැත්තෙක් භාර්යාවක් සරණ පාවාගත් නිසාත්, අනිත් තැනැත්තා කෙතක් මිලට ගත් නිසාත් එතුමා අනුගාමී වීමට දැනට අපහසු බව දක්වන ලදි. එවිට ජේසුතුමා පැවසුවේ "නගුලට අතතබා පසුපස බලන තැනැත්තන්ට එතුමාගේ ශ්‍රාවකයින් විය නොහැක" යන්නයි.

## 3.3. එඬේරාගේ පුද්ගලික විනය

එඬේරා විවාහක නම් ඔහුගේ හෝ ඇයගේ පවුල් ජීවිතය සමාජයේ අනෙකුත් බොහෝ වෘත්තීන් වල නියැලෙන අයට වඩා තම කාර්යභාරයට සමීපව සම්බන්ධ වී තිබේ.



සෑම විට මෙම තත්ත්වය ගැන අවබෝධයෙන් ක්‍රියා කිරීම එඬේරාගේ සේවයට ...කුලකි. මෙහිදී මෙම කාරණාව සම්බන්ධයෙන් නිතර තම සහකරු හා දරුවන් සමඟ සාකච්ඡා කිරීම එඬේරා සතු වගකීමකි. මෙයට මූලික හේතුව නම් එඬේරා සහ තම පවුලේ රුචිය හෝ අරුචින් වටහ ගෙන එඬේර කාර්යට මුහුණ දීමට සිදු වීමයි. එඬේරාගේ පවුලේ සමාජිකයන්ගේ පුද්ගලික පාරිශුද්ධත්වය සහ ඔවුන්ගේ හිතවත්කම් සංගය තුළ නිතර සාකච්ජාවට භාජනය වන කාරණාවන්ය. මෙම කාරණාවන් විටෙක එඬේරාගේ පවුලට හිසරදයක් විය හැකි වුවත් ඒවාට මුහුණ දීමට ක්‍රමවේදයන් සොයා ගැනීමෙන් තම පවුලට පැමිණිය හැකි ආතතියන් අවම කර ගත හැකිය. මෙහිදී විවාහක එඬේරන්ට තම පවුල සමඟ සේවය කිරීමේදී බයිබලීය පදනමක් මත තම දේවධර්මය ගොඩනගා ගැනීම ඉතා වැදගත් වෙයි. මෙවැනි පදනමක් මත පැවතීම සේවය තුළ පැමිණෙන අභියෝග වලට මුහුණ දීමට එඬේරාට මහෝපකාර වෙයි.

මෙම පසුබිම තුළ තමාගේ සේවය සහ පවුල අතර පවතින ආතතිය හැසිර වීමට බයිබලීය පසුබිම මත පදනම් වූ දේවධර්මානුකූල අවබෝධයක් ලබා ගැනීම අර්ථවත් එඬේර සේවයකට ඉතා වැදගත් වේ.

## 3.4. එඬේරාගේ පවුල සහ සේවය

(ලූක් 14:26 -27, මතෙව් 10:37, මාර්ක් 8:34-35 , ජොහාන් 12:25)

ඉහත බයිබල් කොටස් වල අන්තර්ගතයේ සාරාංශය ලූක්තුමාගේ සුභාරංචියේ රචකයා ඉතාමත් ප්‍රබලව ශ්‍රාවකයා තම පියාට ද මවට ද භාර්යාවට ද දරුවන්ට ද සහෝදරයාට සහ සහෝදරියට ද ද්වේෂ කළයුතු බව පවසයි. මතෙව් තුමාගේ සුභාරංචියේ රචකයා භාර්යාව, සහෝදරයා සහ සහෝදරිය මේ කොටසේ සඳහන් නොකරන අතර පියාට ද මවට ද පුතාට ද දුවට ද ජේසුස්වහන්සේට වඩා ප්‍රේම කරන්නා එතුමාට සුදුසු නැති බව පවසයි. මාර්ක්තුමාගේ සහ ජොහාන්තුමාගේ සුභාරංචි රචකයන් පියා ද මව ද භාර්යාව ද දරුවන් ද සහෝදරයා සහ සහෝදරිය ද යනාදි වශයෙන් සඳහන් නොකරයි. ජොහාන්තුමාගේ සුභාරංචිය හැර අනෙකුත් සමදර්ශක සුභාරංචි (මතෙව්, මාර්ක් සහ ලූක්) ශ්‍රාවකයන් තමන්ගේ කුරුසිය රැගෙන ජේසුස්වහන්සේ අනුගමනය කළ යුතු බව පවසයි. එහෙත් සුභාරංචි රචකයන් හතර දෙනාම ශ්‍රාවකයන් තමන්ගේ ජීවිත ජේසුස්වහන්සේ උදේසා පුජා කළ යුතු බව පවසයි. එසේ කරන්නට අල්පෙච්ඡ ජීවිත අත්දැකිම් ආගාපේ ප්‍රේමය සමඟ ප්‍රගුණ කළ යුතුව ඇති බව ද ශුභආරංචි රචකයින් ජේසුස්වහන්සේගේ ජීවිත ආදර්ශය ගෙනහැර පෙන්වා දෙයි.

### 3.4.1. බයිබලීය පදනම මත පවුල සහ සේවය පිළිබඳ දේවධර්මානුකූල අර්ථකතනයක්

මෙම බයිබල් කොටස් ජේසුස්වහන්සේගේ ශ්‍රාවකයන් ජේසුස්වහන්සේට සහ එතුමාගේ සුභාරංචියට සම්පූර්ණයෙන්ම කැපවිය යුතු බව පැහැදිලිව උගන්වයි.

එසේ නම් කිතුණු සේවකයන්ගේ පවුල්වල ස්ථානය කුමක්ද? ඒ අයගේ සහකරුවන් හා සහකාරියන්ගේ ස්ථානය කුමක්ද? මෙහිදී මෙම ප්‍රශ්න වලට පිළිතුරු වශයෙන් සුභාරංචි රචකයන් පවා විවිධ ප්‍රතිචාර දක්වා ඇති බව අපිට පිළිගැනීමට සිදු වේ.

මෙහිදී ලූක් තුමාගේ සුභාරංචියේ ඇති තම පවුලේ සමාජිකයන්ට ද්වේෂ කිරීම අපට කෙසේ තේරුම් ගත හැකිද? අප තේරුම් ගෙන ඇති කරුණක් නම් ආසියාතිකයන් හැටියට මෙය තේරුම් ගැනීම අපට එතරම් අපහසු කරුණක් නොවේ. මෙම ද්වේෂ කිරීම නම් අනවශ්‍ය බැඳීම්හට ගන්වන රුචිකත්වයෙන් මිදීමයි. තණ්හාව ඇති කරන රුචිකත්වයෙන් වැලකී අල්පේච්ඡ ජීවිතයකට ඇතුළු වීමයි. අල්පේච්ඡ රුචිකත්වයේ ජීවිතය ශ්‍රාවකයෙකු වීමේ මිලය වේ.

මෙයින් අදහස් වන්නේ කිතුණු සේවකයකු තම පවුල රැක බලා නොගත යුතු බවද? කොහෙත්ම නැත. කිතුණු සේවකයකු මෙම අනවශ්‍ය බැඳීම් වලින් මිදුනොත් ඔහුට හෝ ඇයට තම පවුල වඩා හොඳින් රැක බලා ගැනීමට අවකාශ සැලසෙයි. කිතුණු සේවකයකු මෙම අනවශ්‍ය බැඳීම් වලින් මිදෙන්නේ කෙසේද? මෙය කිරීමට කිතුණු සේවකයා සෑම දෙයක් සම්බන්ධවම අනුකූලත්වයක් ලබා ගත යුතු වේ. සමහර අවස්ථා වලදී කිතුණු සේවකයන් තමාගේ සේවය කෙරෙහි පවා අනවශ්‍ය බැඳීම් ඇති කර ගනී. ඒ අය තමාගේ සේවය කෙරෙහි තණ්හාවක් වර්ධනය කර ගනි. මෙහි ප්‍රඵලයක් ලෙස ඒ අය මමත්වය වර්ධනය කර ගනී. මේ ක්‍රියාදාමය තුළ මේ අය දෙවියන් වහන්සේගේ සේවය තුළ වැදගත්ම පුද්ගලයන් තමන් යැයි සිතන අතර ඒ සමග ඒ අයගේ පවුල් වල කාර්යභාරයන් අතපසු කිරීමට පෙලඹෙයි.

සමහර අවස්ථා වලදී මේ පුද්ගලයන් තමන් වෙනුවට වෙනත් පුද්ගලයන් ආදේශ කළ නොහැකි යැයි පවා කල්පනා කිරීමට පෙලඹෙයි. මෙවැනි පුද්ගලයන් තම සේවය කෙරෙහි අනවශ්‍ය බැඳීමක් ඇති කර ගන්නා විටදී බොහෝ විට ඔවුන් තම පවුල කෙරෙහි තිබිය යුතු බැඳීම අතහැර පවුලේ කටයුතු අතපසු කරයි. මෙවැනි තත්වයන් සමහර අවස්ථා වලදී කිතුණු සේවකයා විවාහයෙන් බාහිර සම්බන්ධ කෙරෙහි යොමු කිරීමට පවා හේතු සාධක වේ. අනිත් අතට සමහර කිතුණු සේවකයෝ තම පවුල් වල කාර්ය්‍යභාරයන් අනවශ්‍ය ලෙස අවධාරණය කරයි.

කිතුණු සේවකයන් මේ අන්තයට ගිය විට මේ නිසා සේවයේ වගකීම් අතපසු විය හැකිය. එසේම මේ ආකාර අනවශ්‍ය බැඳීම් කරණකොට ගෙන පවුලේ දරුවන්ගේ සහ සහකරුගේ/සහකාරියගේ නිදහස පවා සීමා විය හැකිය. කිතුණු සේවකයා තම පවුල නඩත්තු කළ යුත්තේ තම සහකරුවා/ සහකාරිය සමග සාකච්ජා කරමින් පවුලේ වගකීම් බෙදා ගනිමින්ය. වැඩුනු දරුවන් ඇති සේවකයන් එම දරුවන් සමග ද පවුලේ කාරණා සාකච්ජා කරමින් වගකීම් බෙදා ගැනීම වැදගත් වෙයි.



මෙහිදී සමදර්ශක සුභාරංචි වල සඳහන් කර ඇති ආකාරයට තම කුරුසිය රැගෙන ජේසුස්වහන්සේ අනුගාමී වීම ඉතා වැදගත් වෙයි. ජේසුස්වහන්සේගේ ශ්‍රාවකයන් හැටියට මොවුන් තම කුරුසිය දරා ගත් විට ඔවුන් අන් අයගේ අමාරුකම් කැමැත්තෙන්ම දරනු ලැබේ. එවිට ඔවුන් තමන්ගේ වගකීම් මැසිවිලි නැගීමකින් තොරව ඉෂ්ඨ කළයුතු බව අවබෝධ කර ගනී. කුරුසිය මත, අමාරු ප්‍රශ්න සමගින් පොර බදිමින්, දේව කැමැත්ත ඉෂ්ඨ කළයුතු බව ජේසුස්වහන්සේ ගෙත්සෙමනේ උයනේ දී, "මාගේ කැමැත්ත නොව, දෙවියන් වහන්සේගේ කැමැත්ත" ඉටුවිය යුතු යැයි කී ආකාරය අපට උගන්වයි. ලූක් තුමාගේ සුභ අස්නේ මේ බයිබල් කොටස සහ අනිත් ශුභආරංචි තුනෙන් සමාන්තර බයිබල් කොටස් සෑු අනුගාමිකයන් තම පවුල සහ අනෙකුත් දේවල් කෙරෙහි පමණක් නොව තම ජිවිතය කෙරෙහි පවා අනවශ්‍ය බැඳීමක් ඇති කර නොගත යුතු බව පෙන්වා දෙයි. මෙය කෙලෙස් නැසීමේ උච්චතම අවස්ථාව වේ. ජොහාන් තුමාගේ සුභ අස්න මෙය විචිත්‍රවත් අන්දමින් විස්තර කරමින් බීජයක් පොළොවේ වැටී මළොත් පමණක් තවත් බීජ නිපදවිය හැකි බව පෙන්වා දෙයි.

කිතුණු සේවකයන්ගේ පවුල් ඔවුන්ගේ සේවයේ කොටසක් විය යුතුය. ඔවුන් ක්‍රිස්තු කේන්ද්‍රිය වටිනාකම් සහ ආකල්ප තම පවුල් වල වැපිරිය යුතුය. ඒවා ඔවුන් එසේ නොවපුලහොත් මේ වටිනාකම් සහ ආකල්ප ඔවුන්ගේ පවුල්වල වර්ධනය විය නොහැක. මෙම ආකල්ප හා වටිනාකම් දේව සේවකයාගේ විවාහ ජිවිතයේ ආරම්භයේදීම තම සහකරු හෝ සහකාරිය සමග සාකච්ජා කිරීම ඉතා වැදගත් වෙයි.දැනට කිතුණු සේවකයන් මෙසේ සාකච්ජා කර නොමැති නම් දැන් හෝ එසේ කළ යුතු වන්නේ මෙය තෘප්තිමත් විය හැකි සහ එකිනෙකා පෝෂණය කරන්නා වූ පවුල් ජීවිතයකට මෙය ඉතා වැදගත් වන නිසාය. කිතුණු සේවකයන් තම පවුල සහ සේවය අතර සමබරතාවය සහ ආතතිය නඩත්තු කිරීමට උත්සාහ කරන විටදී ඔවුන් මේ අංග දෙක පරස්පර විරෝධි යැයි සිතිය යුතු නැත. මන්ද මේ අංග දෙක එකම කාසියක දෙපැත්ත වැනි ය.

## 3.5. එඬේරාගෙ වගකීම් සහ කාර්යභාරයන්

එඬේරාගේ ජිවිත රටාව කිතුණු සංඝයේ පැවැත්මට හා අනාගතයට එක හෙලා බලපාන සාධකයක් වේ. මේ නිසා සෑම එඬේරෙක්ම පරිණත පුද්ගලයෙක් වීම ඉතා වැදගත් වෙයි.

ඉහත සඳහන් පසුබිම තුළ පරිණත ජීවිත රටාවක වැදගත් අංග සම්බන්ධයෙන් මූලික දැනුමක් එඬේරා සතු විය යුතු වේ. පරිණත පුද්ගලයෙකු නිතරම සැබෑ ලෝකයේ යථාර්ථයන් සමග ජීවත් වෙයි. තමාගේ සුරක්ෂිතතාවය ගැන සෑහෙන සහතිකයක් ඇති අතර හීනමානය ඇතිකර ගැනීමෙන් තම ජීවිත රටාවට බලපෑම් ඇති කර නොගනි. ඔහුට හෝ ඇයට මනුෂ්‍යයෙක් හැටියට හැඟීම් ඇති අතර ඒවා අනවශ්‍ය ආතතියකින් තොරව පාලනය කර ගත හැකිය.

අන්තර් පුද්ගල සම්බන්ධතා වලදී තමන්ගේ ආත්මාර්ථ අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා අන් අය දඩම්මා කර නොගනියි. පරිණත පුද්ගලයාට තමා ගැන සෑහෙන ඇගයීමක් ඇති අතර තමා පූර්ණ පුද්ගලයෙකු යන හැඟීම ඇත. තමා දන්නා දේ ගැන යටහත් පහත් ලෙස ආඩම්බර වීමටත් නොදන්නා දේ වටහා ගැනීමට උත්සහ කිරීමටත් මෙම පුද්ගලයාට හැකියාව තිබේ. තමාගේ ස්වාධිනත්වය නැතිකර නොගෙන අන් අය මත යැපීමටත් හුදකලා නොවී ස්වාධින වීමටත් ඔහුට හෝ ඇයට පුළුවන්ය. අන් අයගේ රහස් හෙළි නොකිරීමට වග බලා ගැනිම පරිණත පුද්ගලයෙකුට අපහසු නොවේ.

### 3.5.1. අධ්‍යනය කාර්යභාරය

එඬේරා තමාගේ සහ කිතුණු සංඝයේ අභිවෘර්ධිය උදෙසා නිතිපතා අධ්‍යයනයේ යෙදිය යුතු වේ. මෙය හරියාකාරව කිරීමට ඔහු හෝ ඇය රිද්මානුකූල ජිවිත රටාවකට ඇතුලත් වීම වැදගත් වේ. එසේ නොමැති නම් කලබලකාරි ජිවිත රටාවක් තුළ එක වැඩ සටහනකින් තව වැඩ සටහනකට ගමන් කරමින් එඬේරාට අධ්‍යයනයේ වැදගත් කම ක්‍රමානුකූලව අමතක කළ හැකිය. මෙසේ වූ විට එඬේරා ජයේ කාරණා පෙරේදා භාෂාවෙන් කථා කිරීම නොවැලැක් විය හැකිය. මෙවැනි තත්වයක් තුළ එඬේරා සංඝයට හිසරදයක් විය හැකිය. මේ නිසා සෑම එඬේරෙක්ම නිතිපතා අධ්‍යයනය සඳහා යම් කාලයක් වෙන් කල යුතු වේ. එඬේරා අධ්‍යයනය කරනවා ද නැද්ද යන්න කිතුණු සංඝයේ අය නොදකින නිසා එය එතරම් බැරෑරුම් ප්‍රශ්නයක් නොවේ යැයි සමහර එඬේරු සිතිය හැකිය.

එහෙත් එඬේරා කතා කරන හා දේශනා කරන දත්තයන් එඬේරාගේ අධ්‍යයන මට්ටමේ මිනුම්දණ්ඩ ලෙස ක්‍රියාත්මක වන නිසා මෙම කාරණාව එඬේරාට සංඝයෙන් සැඟවිය නොහැකිය. එඬේරාගේ අධ්‍යයන කාල සටහනේ බයිබලය නිතිපතා හැදෑරීම අනිවාර්ය අංගයක් විය යුතු අතර එය පමණක් ප්‍රමාණවත් නොවේ. ශ්‍රාවකයන් තමන්ගේ ජිවිත ජේසුස්වහන්සේ වෙනුවෙන් අධ්‍යනයකින් පූජා කළ යුතු බව පවසයි.

### 3.5.2. ධර්මදූත කාර්යභාරය

ධර්මදූත කාර්‍යයභාරය එඬේර සේවයේ වැදගත්ම කාර්‍ය භාරයකි. ධර්මදූත කාර්යභාරයේ නොයෙදෙන එඬේරෙක් මනුෂ්‍යයන්ගේ සුවය සඳහා ක්‍රියා නොකරන වෛද්‍යවරයෙක් හා සමානය. වෛද්‍යවරුන් මනුෂ්‍යයන්ගේ සුවය සඳහා විවිධ ආකාරයෙන් ක්‍රියා කරන්නාක් මෙන් විවිධ එඬේරන් විවිධ ක්‍රම සහ විධි වලට ධර්ම දූත කාර්ය භාරයේ නිරත වෙති. සමහර එඬේරු පත්‍රිකා බෙදමින් සුභාරංචිය ප්‍රකාශ කරයි. අන් අය වචනය දේශනා කරමින් සුභාරංචිය ප්‍රකාශ කරයි. තවත් සමහරු තම ජීවිත රටාවෙන් සුභාරංචිය ප්‍රකාශ කරනවා විය හැක. අයෙක් ක්‍රම කිහිපයක් භාවිතා කරමින් සුභාරංචිය ප්‍රකාශ කිරීමට වෙර දැරිය හැකිය. මෙහිදි නොකල යුතු දේ නම් තමා භාවිතා කරන ක්‍රමය හෝ ක්‍රම පමණක්



නිවැරදි යයි කියමින් අන් අය හෙලා දැකීමයි. එමෙන්ම කාලයට හා දේශයට අනුව ක්‍රම තෝරා ගැනීමට එඬේරු ප්‍රඥා ගෝචර විය යුතුය.

මේ සම්බන්ධයෙන් ජේසුස්වහන්සේගේ සහ පාවුලුතුමාගේ ක්‍රියාකාරිත්වයෙන් එඬේරුන්ට පාඩම් උගත හැකිය. පාවුලුතුමා මේ යථාර්තය විචිත්‍ර ලෙස මෙසේ විස්තර කර තිබේ. "මම පැල කෙලෙම්, අපොල්ලොස් වතුර දැමුවේය, එහෙත් වැඩීම සැලැස්වූයේ දෙවියන්වහන්සේය." මෙහිදී පාවුලු ධර්මදූත කාර්යභාරය සාමූහික බවත් එය වර්ධනය වෙමින් ඉදිරියට ගමන් කරන ක්‍රියාදාමයක් බවත් මනාව පෙන්වා දෙයි. මේ නිසා ධර්මදූත කාර්යභාරය යම් කාලයකට හෝ දේශයකට සීමා නොකර එය කිතුණු ජීවිතයේ අනිවාර්‍යය අංගයක් ලෙස පවත්වා ගෙන යෑම ඉතා වැදගත්ය. එමෙන්ම සුභාරංචිය ප්‍රකාශ කිරීමේදි අසන්නන්ට හා වටහා ගන්නන්ට කිතු දහම තුළ මුහුණ දීමට සිදුවන අභියෝග අවබෝධ කල යුතු වේ.

ධර්මදූත සේවයේ මූලික පරමාර්ථය වන්නේ ජේසුස්වහන්සේගේ දර්ශනය මත ජීවිත පරිවර්තනයකට මනුෂ්‍යයන් යොමු කිරීමයි. මෙය සනාථ කිරීමට අනේක උදාහරණ ගෙන හැර දැක්විය හැකිය. පොහොසත් තරුණයාට ප්‍රකාශ කළේ ද්‍රව්‍යමයදේට කිතුණුවීම කිතුදහමට පටහැනිය. ජේසුස්වහන්සේගේ ශ්‍රාවකයෙකු වීමට ද්‍රව්‍යමදේට ඇති අනවශ්‍යය බැඳීම නැතිකල යුතු බව එතුමා පෙන්වන ලදි. එඬේර සේවය වර්ථමානයේ කළ යුත්තේ එය අනාගතයේදී ද කළ හැකි ආකාරයටය.

### 3.5.3. නායකත්වය කාර්යභාරය

කිතුණුවන්ට තමන්ගේ ජීවිතයේ නායකත්වය විවිධාකාරයෙන් ක්‍රියාත්මක කිරීමට සිදු වේ. මෙහිදි පහත සඳහන් නායකත්වයේ විවිධ මුහුණුවරවල් කිතුණුවන්ගේ කාර්යභාරයට පිටුවහලක් ලෙස ගෙනහැර දැක්විය හැකිය. මේ විවිධ මුහුණුවරවල් වටහාගෙන ක්‍රියා කිරීමෙන් කිතුණුවන්ගේ ජීවිත වඩා අර්ථවත් කළ හැකිය. මෙහිදී පහත දැක්වෙන නායකත්වයේ විවිධ මුහුණුවරවල් අවස්ථානුකූලව යෙදවීමෙන් කිතුණුවන්ට තම සේවාවන් වඩා අර්ථවත් කර ගත හැකිය.

- <u>අණ කිරීමේ නායකත්වය</u>

මෙම ක්‍රමයේදී නායකයා අණ කරන විට නායකයා සමග සිටින කණ්ඩායම අණ කරන දේ ක්‍රියාත්මක කිරීම බලාපොරොත්තු වෙයි. බැලූ බැල්මට මෙම ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී ලෙස නොපෙනුනත් සමහර අවස්ථා වලදී මෙම ක්‍රමය භාවිතා කිරීම ඉතා වැදගත් වෙයි. මෙම නායකත්වය හදිසි අනතුරු අවස්ථාවකදී, ජල ගැලීමක් වැනි ස්වභාවික විපත්ති වලදී මෙන්ම යුද්ධ සහ අරගල පවතින අවස්ථාවලදීත් වඩාත් ප්‍රයෝජනවත් වෙයි.

❖ <u>අලෙවි කිරීමේ නායකත්වය</u>

මෙම නායකත්ව ක්‍රමය ක්‍රියාත්මක කරන නායකයාට තමාගේ වැඩ පිළිවෙල ගැන පැහැදිලි අවබෝධයක් ඇතත් එය සෘජුවම තමන් සමග ක්‍රියා කරන ජනතාවට යොමු නොකරයි. ඒ වෙනුවට මෙම නායකයා තමන්ගේ යෝජනා තම ජනතාවට යොමු කරමින් ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීමට උත්සහ කරයි.

❖ <u>පරික්ෂා කිරීමේ නායකත්වය</u>

මෙම ක්‍රමය භාවිතා කරන නායකයාට තමා කරන්ට යන දේ ගැන මූලික අවබෝධයක් ඇතත් එය ක්‍රියාත්මක කිරීමට තම කණ්ඩායමේ අයගේ රුචිකත්වය පරික්ෂා කර බලයි.

❖ <u>උපදෙස් ගැනීමේ නායකත්වය</u>

මෙහිදී නායකයා අන් අයගේ උපදෙස් මත ක්‍රියාත්මක වන අතර තම මතය වඩා අවධාරනය කිරීමට උත්සහ නොකරයි.

❖ <u>හවුල් නායකත්වය</u>

හවුල් නායකත්වය තුල නායකයා කණ්ඩායමේ තවත් සාමාජිකයෙක් වන අතර තමාගේ සේවාවන් අන් අයට විවෘර්තව තබයි.

## 3.6. සශ්‍රීකත්වයේ දේව ධර්මය සහ එඬේරා.

වර්තමාන සමාජයේ යමෙක් කිතුණුවකු වුවහොත් සියළු කරදර අමාරුකම් දැරුවේ යැයි මතයක් වර්ධනය වෙමින් පවති. බයිබලය තුළ මෙම මතයට පදනමක් දැක්වීම අසීරුය. මෙම සශ්‍රීකත්වයේ දේවධර්මය කිතු දහම හා පටහැනි බව ගෙනහැර දැක්විය හැකි හොඳම උදාහරණය ජේසුස්වහන්සේගේ ජිවිතය සහ සේවයයි. එතුමා මේ මිහිපිට ජිවත් වූ සමයේ මුහුණ දීමට සිදුවූ දුක් ගැහැට එමටය. මෙම තත්වය තුළ එතුමා තම ශ්‍රාවකයන්ට පැවසුවේ මේ ලෝකයේ දුක් ගැහැට අධික මුත් ඒවාට ධෛර්යමත්ව මුහුණ දී ජය ගත හැකි බව එතුමා ජීවිත ආදර්ශයෙන් පෙන්වා දෙන ලදි.



# 4 පරිච්ඡේදය

## <u>එඬේර සේවය විවිධ දෘෂ්ඨිකෝණයන්ගෙන්</u>

එඬේර රූපකය නායකයන්ගේ සහ පාලකයන්ගේ කාර්යභාරය විස්තර කිරීමට විවිධ දෘෂ්ඨිකෝණයන්ගෙන් පෙන්විය හැකිය. බයිබලයේ පුරාණ සහ නව ගිවිසුම් වල නිතර භාවිතා කර තිබේන ආකාරයට දේව ධර්මය සමාජ විද්‍යාත්මක දෘෂ්ඨිකෝණයන්ගෙන් විග්‍රහ කරමු. කිතුණුවන්ට එඬේර සේවය තුළ එඬේර සංකල්පය ගැඹුරෙන් අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වෙයි.

## 4.1. බයිබලිය දෘෂ්ඨිකෝණය

එඬේර රූපකය නායකයන්ගේ සහ පාලකයන්ගේ කාර්යභාරය විස්තර කිරීමට බයිබලයේ පුරාණ සහ නව ගිවිසුම් වල නිතර භාවිතා කර තිබේ. එඬේර සේවයේ කාර්ය්‍ය භාරය ප්‍රධාන වශයෙන් බයිබලය තුළ තෙවැදෑරුම් සන්දර්භයට අදාලව හඳුනාගෙන තිබේ. ඒවා නම් පාලක, දිවැසි සහ පූජක සේවාවන්ය. මෙම හඳුනාගැනීම විස්තර වි ඇත්තේ ඉතිහාසය තුළ දේව ජනතාවගේ අත්දැකීම් සහ එළිදරව්ව තුළය. පුරාණ ගිවිසුම තුළ ඇරැඹෙන මෙම කාර්යභාරයන් ක්‍රමාණුකූලව වර්ධනය වි නව ගිවිසුම තුළින් අද දක්වා වර්ධනය වි තිබේ.

දිවැසි කාර්යභාරය බයිබලීය සම්ප්‍රධාය තුළ උත්තරිතර ලෙස දක්වා තිබේ. සමාජය තුළ දේව කැමැත්ත ඉටුනොවන අවස්තාවලදි දිවැසිවරු දේව කැමැත්ත ස්ථාපිත කිරීමට ක්‍රියා කරයි. දිවැසිවරු දේව කැමැත්ත සමාජය තුළ නොපැකිලව සහ නොබියව ප්‍රකාශ කර සිටියි. එඬේරාගේ මෙම කාර්යභාරය විටෙක බිය ජනක විය හැකිය. මොවුන් කූට ලෙස මුදල් ඉපැවු පේන කී මනුෂ්‍යයන් නොවූහ. මේ මනුෂ්‍යයන් ධර්මිෂ්ඨ ජිවිත ගතකළ තත්කාලීන සමජය ගැන පරිණත අවබෝධයක් තිබූ මනුෂ්‍යයන් විය. මොවුන්ගේ සේවාවන් විශේෂයෙන් කැපී පෙනෙනුයේ සමාජයේ අර්බුදකාරි අවස්ථාවලදීය.

පූජකයන්ගේ සම්ප්‍රධායික කාර්යභාරය වූයේ මනුෂ්‍යයන් හා දෙවිඳුන් අතර අතරමැදියෙක් විමයි. මෙය සිදු කරන ලද්දේ පූජා ඔප්පු කිරිම, යැදීම වැනි අංග තුළිනි. ජේසුස්වහන්සේගේ කාලයේ මේ පූජක ක්‍රියාකාරිත්වය දූෂිත වෙමින් තිබූ අතර ජනතාවට පූජකයන් හිසරදයක් විය. පූජකයන් දෙවිඳුන් වෙත මනුෂ්‍යයන් යොමු කරන මුවාවෙන් තම මඩිය තරකර ගැනීමට ක්‍රියා කරන ලදි. පුරාණ ගිවිසුමේ පූජකත්වය පාරම්පරිකව පියාගෙන් පුතාට උරුම විය. ජේසුස්වහන්ගේ කාලයේ දී යුදෙව් දහම තුළ ක්‍රියාත්ම වූයේ මෙම පූජකත්වයයි. එහෙත් ජේසුස්වහන්සේ මේ පූජකත්වයට අයත් නොවිය. ජේසුස්වහන්සේගේ පූජකත්වය වනාහි ප්‍රේමයේ, පරිත්‍යාගයේ හා සේවකත්වයේ පූජකත්වයකි. එක්තරා ආකාරයකින් එඬේර සේවය අනෙකුත් සේවාවන්ගෙන් වෙනස් වන්නේ මේ සංකල්පයේ පදනම මතය.

## 4.2. දේවධර්මානුකූල දෘෂ්ඨිකෝණය

අද සමාජයේ එඬේර සේවය විවිධ දේවධර්ම ආකෘති අනුව වර්ධනය වී තිබේ. මෙම ආකෘති මූලිකව පදනම් වී ඇත්තේ නිකායානුකූලවය. නිකායන්ගේ අවධාරණය අනුව ලංකාවේ යථාර්ථයන් තුළ මෙම දෘෂ්ඨිකෝණයන්ගේ බලපෑම් විවිධාකාරය. බොහෝ ප්‍රතිසංස්කෘත නිකායන් සෑම කිතුණුවකුගේම පූජකත්වය අවධාරණය කරන අතර කිතුණු දහම තුළ පූජක පැලැන්තියක් පැවතිය නොහැකි බව අවධාරණය කරයි. බොහෝ විට මේ නිකායන් එඬේරුන් කිතුණු නායකයන් වශයෙන් හඳුන්වති.

රෝමානු කතෝලික සහ ලංකා සභා නිකායන් තුළ එඬේර සේවය තෙවැදෑරුම් ලෙස අර්ථකථනය කර තිබේ. මේවා රදගුරු, පූජක හා තේවාචාර්ය ලෙස නම් කර තිබේ.

මෙම සේවාවන් නව ගිවිසුමේ ළදරු සංඝයෙන් ආරම්භ වී අද දක්වා වර්ධනය වී තිබේ. මෙහි දී මූලික එඬේර කැඳවීම තේවාචාර්ය සේවය සඳහාය. නායක සේවකත්වය, පාලන, දිවැසිවර, පූජකත්වය මත ක්‍රියාත්මක වන තුන් වැදෑරුම් පදවි සදාකාල පූජකත්වයට ජනතාව තුළින් ජනතා සේවයට කැඳවා තිබෙන බව විශ්වාසයයි.

වගකීම අනුව තුන්වැදෑරුම් පදවි එකිනෙකට වෙනස් වුවත් එකම සමානාත්මකතාවයෙන් වගකීම් අනුව වගකීමෙන් ආගාපේ ප්‍රේමයෙන් කටයුතු කිරීමට කැඳවා ඇත. ජේසුස්වහන්සේගේ පූජකත්වය වනාහි ප්‍රේමයේ, පරිත්‍යාගයේ හා සේවකත්වයේ පූජකත්වයකි. විශ්වය එක්සේසත් කරන්නා වූ පාලනයකට ගෙන එන දිවැසිවර පූජකත්වයකි. මෙම අනුහස ආදර්ශයෙන් කටයුතු කිරීමට එඬේර පූජකත්වයට කැඳවා ඇත.






## 4.3. සමාජ විද්‍යාත්මක දෘෂ්ඨිකෝණය

එඬේර සේවය සංස්කෘතික, ආර්ථික සහ දේශපාලනාත්මක වැනි සමාජ විද්‍යාත්මක සාධක මත විවිධ මුහුණුවරවල් ගනී. සමාන්‍යයෙන් සමාජ විද්‍යාත්මක දෘෂ්ඨිකෝණයෙන් බැලූ කළ එඬේරා ජන නායකයෙකි. මේ තත්වය තුළ එඬේරා ජීවත් වන ජන සමාජයේ ආගමික කටයුතු වල පමණක් නොව සමාජීය කටයුතු වල නිරත වීමට ඔහුට හෝ ඇයට සිදු වේ.

සමාජ සේවය - තෙවැදෑරුම්ය

- ➢ සමාජ සේවය
- ➢ සමාජ සංවර්ධනය
- ➢ සමාජ ක්‍රියාකාරිත්වය

මෙහිදී බොහෝ විට ශ්‍රී ලාංකික සමාජයේ කිතුණුවන් සුළුතරයක් නිසා සාමාජීය කටයුතුවල අවධාරණය බහුතර හින්දු හෝ බෞද්ධ සංදර්භයේ පවතී. මේ තත්වය වටහා ගෙන සමාජ විද්‍යාත්මකව නායකත්වය පවත්වාගෙන යෑම එඬේරා සතු වගකීමකි. මේ සඳහා තමා ජීවත් වන සමාජයේ මනුෂ්‍යයන්ගේ ජන ඇදහිලි, චාරිත්‍ර පිළිවෙත් වැනි අංග ගැන සෑහෙන අවබෝධයක් ඔහු හෝ ඇය සතු විය යුතු වේ.

ශ්‍රී ලංකාවේ 8% වන කිතුණු සුළුතරයට අන් ආගම් වල පූජක සහ පූජ්‍යය පක්ෂය සම්බන්ධයෙන් ඇති දෘෂ්ඨි කෝණයන්ගේ බලපෑම් තිබේ. මෙහිදී බෞද්ධ සහ හින්දු ලබ්ධීන්ගෙන් බලපෑම විශේෂයෙන් සැලකිල්ලට ගත යුතු වේ. මේ තත්ත්වයට මූලික හේතුවක් වන්නේ ශ්‍රී ලාංකික කිතුණුවන්ගෙන් විශාල බහුතරයක් සිංහල සහ ද්‍රවිඩ ජන කොටස් වලට අයත් වීමය. මෙහිදී වැදගත්ම කරුණ වනුයේ මෙම ජන කොටස් වල බහුතරය හින්දු සහ බෞද්ධ ලබ්ධීන්ට අයත් වීමයි.

ග්‍රාමීය පළාත් නාගරික මෙන්ම අර්ධ නාගරික පළාත් නාගරික පළාත් ජනයා නොයෙකුත් අවවාද අනුශාසනා ලබා ගැනීමට කිතුණු එඬේරුන් හමුවට පැමිණීම නිතර දැකිය හැකි කරුණකි. මේ අතර නොයෙකුත් අසනීප වලට ප්‍රතිකාර ලබා ගැනීමට හමුවිය යුතු වෛද්‍යවරුන් ගැන උපදෙස් ලබා ගැනීමට හා ශ්‍රී ලාංකික සමාජයේ සාමාන්‍ය ජනතාව තුළ කිතුණු එඬේරුන්ට දේශීය හා විදේශීය කාරණා සම්බන්ධයෙන් පුළුල් අවබෝධයක් ඇති බවට විශ්වාස බැවින් විදේශීය රටවල සිටින තම ඥාතීන් සම්බන්ධ කාරණා ගැන අවවාද ලබා ගැනීමට පැමිණීම වැනි කාරණා ප්‍රමුඛත්වයක් ගනී. විවිධ ලබ්ධීන්ට අයත් අය එඬේරාගෙන් ආශිර්වාද ලබා ගැනීම. එඬේරුන්ට ආගමික නොවන විවිධ සමාජ සේවා සංවිධාන වල සේවය කිරීමට සිදුවේ.

මෙම සංවිධානවල සේවය කරනවිට බොහෝ විට තම කිතුණු අනන්‍යතාවය නියෝජනය කිරීමට එඬේරාට සිදුවෙයි. එය අනෙකුත් සමාජ ආගමික යථාර්ථයන් තුළ ද අධ්‍යාත්මික නායකත්වයකි.

ලාංකික සමාජයේ සමහර ජන කොටස් එඬේරා අධිරාජ්‍යවාදීන්ගේ නියෝජිතයෙක් ලෙස ද කල්පනා කරයි. මෙවැනි තත්වයන් තුළ මෙසේ කල්පනා කරන පුද්ගලයන් සමග තර්ක කරමින් මෙය අසත්‍ය බව සනාථ කිරීමට ක්‍රියාකරනවාට වඩා මෙම තත්වයට ඉවහල් වන සාධක ගැන අවබෝධයක් ලබා ගැනීමෙන් මෙම තත්වය මග හැරීමට දායක විය හැකිය. එසේම විවිධ සමාජ පසුබිම් වල එඬේරා ආධාර ලබා දෙන්නෙක් ලෙස හඳුනාගෙන තිබේ. මෙවැනි ස්ථානවල මනුෂ්‍යන්ට නොයෙකුත් හේතු නිසා ආර්ථික අමාරුකම් ඇති වූ විට අවශ්‍යය උපකාර ලබා ගැනීමට එඬේරාගේ පිහිට පැතිම දැකිය හැකිය. අවශ්‍යතාවයෙන් පෙළෙන මනුෂ්‍යයන්ට උපකාර කිරීම මූලික කිතුණු වගකීමක් වුවත් මෙම තත්වයට පවතින සමාජ පසුබිම පැහැදිලිව අවබෝධකරගෙන කල්පනාකාරිව මුහුණදීම එඬේරාගේ වගකීමකි.

සමාජවල ජාති, ආගම් සහ කුල භේදයකින් තොරව යම් කාරණා සම්බන්ධයෙන් අවවාද අනුශාසනා ගැනීමට ජනතාව එඬේරා හමුවීමට පැමිණෙති. මෙම සමාජීය කාරණා සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට එඬේරා යොමුවන විට පැහැදිලි ක්‍රමවේදයක් තුළ මෙම සේවය ක්‍රියාත්මක කිරීම අර්ථවත් සේවයකට මහෝපකාරීවෙයි.






# 5. වන පරිච්ඡේදය

## එඬේර රැක බලාගැනීම හා උපදේශනය

එඬේර රැක බලාගැනීම හා උපදේශන පිළිබඳ බයිබලීය පසුබිම ලාංකික සමාජයේ ජනතාව ඔවුන්ගේ නිවෙස්වල දී බැහැ දැකීම එඬේර සේවයේ සුවිශේෂ අංගයකි. මෙම කාර්යභාරය ඉතා සරල වුවත් එයින් ලැබෙන ඵල විපාක ඉමහත්ය. ලාංකික සමාජය තුල මේ බැහැ දැකීම් ක්‍රමාණුකූලව සිදු කිරීම සංඝයේ සහ පුද්ගලයන්ගේ අභිවෘද්ධියට එක හෙලා බලපෑම් ඇති කරයි. මෙහිදී අර්ධ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ වල බොහෝ විට එඬේරාට සංඝයේ පවුල්වල සාමාජිකයෙක් වීමට සිදුවේ. ආහාර ගැනීම. ක්‍රමානුකූලව යාච්ඤා කිරීම - සෑම සාමාජිකයෙක් ගැනම රහසිගතව පුද්ගලික දැනුමක් ඇතිව සිටීම එඬේර රැක බලා ගැනීම වඩා අර්ථවත්ව සිදු කිරීමට පැහැදිලි සැලසුමක් ඇතිව ක්‍රියා කිරීම ඉතා වැදගත් වේ. මෙහිදී පළමුව තමා සේවය කරන ප්‍රදේශයේ භූගෝලීය පිහිටීම අවබෝධ කර ගැනීම අවශ්‍ය වේ. මේ සඳහා සිතියමක් තබා ගැනීම යෝග්‍යය. එසේම එම මනුෂ්‍යයන්ගේ සමාජ ආර්ථික හා දේශපාලනිකව ජනතාව නිවෙස්වල බැහැ දැකීමේදී ප්‍රදේශ අනුව විවිධ ක්‍රම වේද භාවිතා කිරීමට එඬේරාට සිදු වේ.

### 5.1. එඬේර රැක බලාගැනීම හා උපදේශන පිළිබඳ බයිබලීය පසුබිම




එඬේර රැක බලා ගැනීම සහ උපදේශනයේ වැදගත්කම ගෙනහැර දැක්වීමට බයිබලයෙන් අනේකාකාර උදාහරණ ගෙන හැර දැක්විය හැකිය.

5.1.1. **Good Shepherd** යහපත් එඬේරා

St. John Chapter 10 ශු. ජොහාන් 10 පරිච්ඡේදය.

A wellknown figure among many agricultural people

බොහෝ කෘෂිකාර්මික ජනතාව අතර ඉතාමත් ප්‍රසිද්ධ රූපකයක්

01. Sign of wealth & statues ධනවත් සහ බලවත් කමේ සංකේතයක්

02. Both in the Old & New Testaments, පරණ සහ අලුත් ගිවිසුම් දෙකෙහිම

a) Human Shepherds මානුෂික එඬේරුන්

b) God as Shepherd දෙවිදුන් එඬේරෙක් ලෙස

**5.1.1.1. In O.T.- (3 chief ways)** පරණ ගිවිසුමේ - (තෙවැදෑරුම් ලෙස)

1. Relationship between God and the people of Israel - දෙවිඳුන් සහ ඊශ්‍රායෙල් ජනතාව අතර සම්බන්ධතාවය

Ps 95: 6-7, Is 40-11

Ezek 34: 11-15, Ps 23

2. Religion & political leaders were described as shepherds. ආගමික සහ දේශපාලන නායකයන් එඬේරුන් හැටියට විස්තර කර තිබේ.

God appointed to care for His people දෙවිඳුන්ගේ ජනතාව රැක බලා ගැනීමට එතුමන් විසින් පත් කරන ලදි.

Ex. Moses Promised Lord උදා : මෝසෙස් පොරොන්දු වූ දේශය Human Shepherds Kings, Priests & prophets - මානුෂික එඬේරුන් - රජවරු, පූජකවරු සහ දිවැසිවරු

Ref. Prov. 2: 6-8 & Ps 119: 105

3. In the times of trouble & defeat prophets like Isaiah & Jeremiah used the 'Good Shepherd' yet in another way.

One True Shepherd (Ezek 4: 23)

කරදර සහ පරාජය ඇති වූ කාලවලදී යෙසායා සහ ජෙරමියා වැනි දිවැසිවරු "යහපත් එඬේර" සංකල්පය භාවිතා කළේ වෙනත් අර්ථකතනයක් සහිතවය එකම සත්‍ය එඬේරා

Jer. 23: 5 / Is 40: 11/ Mica 5: 2-4

**5.1.1.2. In N.T.- (2 chief ways)** නව ගිවිසුමේ - (දෙවදෑරුම් ලෙස)

01. I am the Good Shepherd etc. මම යහපත් එඬේරා යනාදිය

Jn 10: 1-1

Heb 13 : 20

02. OT idea is given in the NT 'the flock of God' - command to Peter දෙවිදුන්ගේ රැළ : පරණ ගිවිසුමේ අදහස අළුත් ගිවිසුමේ ද දී තිබේ. පේදුරුට දුන් ආඥාව

Matt 16: 18, Jn 21 : 15-26

Paul Acts 20 28

Peter being example to the flock පේදුරු රැළට ආදර්ශයක්

1 Pet 5 : 2&3



5.2. **THE WORK OF THE SHEPHERD** එඬේරාගේ කාර්යභාරය

Picture Language. රූපක භාෂාව

- He guides his flock (Is 40:11) රැළට මගපෙන්වයි.
- He feeds the sheep (Ps 23) රැළ පෝෂණය කරයි.
- He guards his flock (1 Sam 17: 34) - රැළ ආරක්ෂා කරයි.
- He searches for any sheep that stays & get lost (Matt 18: 12) නැතිවූවන් සහ මුලා වූවන් සොයයි.
- He knows & name each sheep (Jn 10: 1- 4) සෑම බැටළුවකුම හඳුනයි.
- He carefully tends any sheep that are sick or weekly. (Gen. 33: 13) දුර්වල සහ ලෙඩ වූවන් ප්‍රවේශමින් රැකබලා ගනී.

5.3. **Good Shepherd** යහපත් එඬේරා

**St. John Chapter 10** ශු. ජොහාන් 10 පරිච්ඡේදය

5.4. **MODEL OF THE EARLY CHURCH** ආදී සභාවේ ආකෘතිය

- Feeding with the truth - සත්‍යයෙන් පෝෂණය කිරීම.
- Protecting error & false teaching - වැරදි සහ අසත්‍ය ඉගැන්වීම් වලින් ආරක්ෂා කිරීම.
- Caring for the needy & distressed - අසරණයන් සහ දුගියන් රැකබලා ගැනීම.
- Encouraging Halfhearted in the faith. -ඇදහිල්ලේ දුබලයන් ශක්තිමත් කිරීම.
- Order & discipline - විනය සහ ක්‍රමානුකූල බව
- Guidance & spiritual direction. - ආධ්‍යාත්මික මගපෙන්වීම.

Jn 21: 15-17, Acts 20: 28-31, 1Tess 5: 2-15, 2 Tim 4: 1-5

SUMMED UP IN THE IDEA TENDING THE FLOCK OF GOD (1Pet 5:2) මෙහි සාරාංශ ගත අදහස නම් දෙවිදුන්ගේ රැළ රැකබලා ගැනීමයි

5.5. **False Prophets & worthless Shepherds** - ව්‍යාජ දිවැසිවරු සහ නොවටිනා එඬේරු

Shepherds who oppressed and exploited people - මනුෂ්‍යයන් පීඩාවට සහ දූෂණයට පත් කරන්නා වූ එඬේරු

- Take privileges while refusing to accept their responsibilities - තමන්ගේ වගකීම් පැහැර හරිමින් අයිතිවාසිකම් බුක්ති විඳින්නන් - Ezek: 34:2,3
- Force and hardness- බලහත්කාර කම් සහ දරදඬු භාවය - Ezek:34:4,5,&10
- Robbers and thieves - මංකොල්ලකාරයන් සහ හොරුන් - Jn .10
- Wrong idea of leadership - නායකත්වය ගැන වැරදි අදහස් - 1 Pet. 5:2,3.
- False Apostles and deceitful workmen - ව්‍යාජ අපෝස්තුලුවරු සහ කූඨ සේවකයන් 2 Cor. 11:13

## 5.6. PATTERN SET BY JESUS ජේසුස්වහන්සේගේ ක්‍රම වේදය

+ He was the message - එතුමා පණිවුඩය විය - 2Cor 3:1-3
+ Servant Shepherd - සේවක එඬේරා - Lk.22:25-27 Jn.13:13-16 Mk.10:42-44

Servant means සේවකයා යනු :-

Incarnation and the Cross මාංශවත් වීම සහ කුරුසියයි.

Being one with people - මිනිසුන් අතර මිනිසෙක් විය - Phil.2:7,Jn.1:14,Heb.2:14&18,Jn.2:1-11

His attitudes towards People - මනුෂ්‍යන් කෙරෙහි එතුමාගේ ආකල්පය

2. Jesus showed a deep concern that people should live the best and fullest sort of life Lk.4:16-21, Matt5:17

මනුෂ්‍යයන් විශිෂ්ඨ සහ පූර්ණ ජීවිත ගත කළ යුතුය යන කාරණාව කෙරෙහි ජේසුස්වහන්සේ ඉතා සැලකිලිමත් විය.

## 5.7. උපදේශකත්වය සහ උපදේශනය

උපදේශකත්වය සහ උපදේශනය එඬේර සේවයෙ දී එඬේරාට නිතරම යෙදීමට සිදුවන අංගයකි. නූතන සමාජයේ බොහෝ විට උපදේශනය වෘත්තිමය මට්ටමෙන් ක්‍රියාත්මක වන අතර එඬේර සේවයට පුහුණු කරන ආයතන මේ සම්බන්ධයෙන් දැනුමක් ලබා දෙයි. මෙම වෘත්තිමය උපදේශනයන් එඬේරාට තම සේවයට අත්වැලක් වුවත් එඬේර සේවය තුළ උපදේශනයන් නොයෙකුත් ආකාරයෙන් මෙම වෘත්තිමය උපදේශනයන්ගෙන් වෙනස් වේ. මෙහිදි විශේෂයෙන් ජන සමාජයේ පවතින සංස්කෘතිමය උපදේශන ක්‍රම ගැන එඬේරා සතු අවබෝධය තම සේවය වඩා අර්ථවත් කර ගැනීමට එඬේරාට උපයෝගි කර ගත හැකිය. උපදේශකත්වය ද උපදේශනයෙන් වෙනස් වන්නකි. උපදේශකත්වයේ දී සිදුවන්නේ යම් කාර්යක ක්‍රියාවලියක් සිදු විය යුතු ආකාරය පැහැදිලි කොට ඊට අනුකූලව ආදාළ කාර්ය සිදු කළ යුතු යැයි කෙරෙන දැනුවත් කිරිමයි. උපදේශනයේ දී සිදුවන්නේ සේවා ලාභියාට තම ගැටළුව සේවාලාභියාගේ ගැටලුවක් සේම නොඅඟවා පොදු ස්වභාවය විවරණය කිරිමයි. එම විවරණය තුළ දී තමන් අනුගමනය කළ යුතු ක්‍රම වේදයන් පිළිබඳව මනසින් සිතන්නට ඉඩ කඩ ලැබෙන අතර සේවාලාභියා මධ්‍යය ගත වු ආකාරයට උපදේශකයා ගැටළුව විසදා ගැනිමට සහය දේ. සාම්ප්‍රධායික ලාංකික ජන සමාජයේ උපදේශනය සාංස්කෘතික අධ්‍යාපන ක්‍රමයේ කොටසකි. සමාජයේ සෑම සංසිද්ධියක්ම දම්වැලක පුරුක් මෙන් බැඳුනු විවිධ සමාජ අධිකාරිත්වයන් සහිත පුද්ගලයන් තුළින් පාලනය වේ. උදාහරණක් වශයෙන් දැරියක වැඩිවියට පැමිණී විට උපදෙස් දීමට අධිකාරිත්වය සහිත පරිණත කාන්තාවන් ගෙන හැර දැක්විය හැකිය.



මෙහිදි මෙම පුද්ගලයන්ගේ සුදුසුකම් බොහෝ විට පදනම් වන්නේ පෙළ පොත් වලින් ලබා ගත් දැනුමට වඩා අත්දැකිම් හා ප්‍රඥාව මතය. මෙම සුදුසුකම් අත්සන් සහිත කඩදාසි සහතික මගින් සනාත නොවුනත් ජන සමාජයේ පුද්ගලයන්ගේ මනස් මත මෙම පුද්ගලයන්ගේ අධිකාරිත්වය මුද්‍රා වි ඇත. මේ පසුබිම තුළ සමාජයේ තරුණයන් වැඩිහිටියන්ට කීකරුවීම නිතැතින් බලාපොරොත්තු වේ. මෙහි දී පුද්ගලයන්ගේ අධිකාරිත්වය අත්දැකීම් හා ප්‍රඥාව මත පදනම් වුවත් එම පුද්ගලයන්ගේ අධිකාරිත්වයේ අනාගතය නිතර තීරණය කරනු ලබන්නේ එම පුද්ගලයන්ගේ පුද්ගලික පාරිශුද්ධ භාවයයි. මෙහිදී පුද්ගලයන්ට දෙනු ලබන උපදේශකත්වය සහ උපදේශනය සිදුවන්නේ සමාජය සන්දර්භය තුළය. නිතරම පුද්ගලික සුභසිද්ධියට වඩා සමාජයේ යහපත් පැවැත්ම රැකගැනීම ජනතාව බලාපොරොත්තු වේ. මේ නිසා පුද්ගලයෙක්ගේ මානසික ගැටලුවක් ආරවුලක් හෝ අර්බුදයක් ඒ සමාජයේ සෑම පුද්ගලයෙකුටම බලපානු ලැබේ.

මානසික රෝගි ස්වභාවයන් හා ලක්ෂණ

01 කංසාව (Anxiety) - නොසන්සුන් කම, ආවේගශිලි බව

02 ග්‍රස්තිය (Obsessive Compulsive Disorder) - එකම සිතුවිල්ල නැවත නැවත ඇතිවීම, එකම සිදුකිරිම නැවත නැවත කිරිම උදා : නිතර නිතර නෑම, අත් සේදිම

03 හදිසි තැති ගැන්ම (Panic Disorder) - අධික ලෙස කැළඹීම, මරණ බිය

04 සමාජ භීතිකා (Social forbia) - සමාජ තත්ව වලට බිය වීම, කණ්ඩායම් සමග වැඩ කිරිමේ අපහසුව, වගකිම් පැහැර හැරිම හෝ කල් දැමිම

05 විෂාදය (Depression) - ශාරීරික හෝ පාරසරික හේතු මත අසමන්‍යය ලෙස කළකිරිම උදා: පවුල් ප්‍රශ්න

06 පශ්චාත් ව්‍යසන ක්ලේමත ආබාධ - (Post Traumatic stress Disorder)

යුද්ධ වාතාවරන සුනාමි ස්වභාවික අපදා වැනි අවස්ථා තුල එම සිදු විම නැවත නැවත යට ගිය සිදුවීම් ආවර්ජනය හා බිය.

මේ ආකාරයට ආරවුලක් හෝ අර්බුදයක් ඒ සමාජයේ සෑම පුද්ගලයෙකුටම බලපානු ලබන විට එඬේර සේවයට වගකිමක් ද ඇත. මේ අවස්ථාවන්හි උපදේශකත්වය සහ උපදේශනය මගින් අවංකව එකිනෙකාව පිළිගනිමින්, ඇහුම්කන් දෙමින්, සහවේදනයකින් මධයස්තව සිටිමින් ගැටළුව පුද්ගලයකු මෙන්ම කණ්ඩායමක් ලෙස ලිහිලනය කරා ගෙන යා යුතු නොවේ

# 6 පරිච්ඡේදය

## අධ්‍යනය සහ ධර්මදේශනා

කිතුණුවන් මනුෂ්‍යයන්ගේ වර්ධනය සඳහා අධ්‍යනය හා ධර්ම දේශනා නොයෙකුත් මාධ්‍යයන් තුලින් භාවිතා කරති. කිතුණු සංඝය අද දක්වා ශාරීරික, මානසික සහ ආධ්‍යාත්මික වර්ධනය ගැන සෑම විටම ක්‍රියා කර තිබේ. මෙයට කදිම උදාහරණය ලෙස ලොවපුරා කිතුණු සංඝයන් ගොඩනගා පවත්වා ගෙන ගිය සහ යන දේවස්ථාන, පාසැල් සහ ශාරීරික සුවය සඳහා ආරෝග්‍යශාලා වැනි දේ ගෙනහැර දැක්විය හැකිය. මෙම අධ්‍යන හා ධර්ම දේශනා ගැන සලකා බලන විට ජේසුස්වහන්සේගේ ඉගැන්වීම් ක්‍රම ගැන අවබෝධයක් ලබා ගැනීම එඬේරාගේ සේවයට පිටුවහලක් වෙයි.

## 6.1. ජේසුස්වහන්සේගේ ඉගැන්වීම් ක්‍රම - JESUS'S TEACHING METHODS

1) **PARABLES**-A story with one central message. -

උපමා - පණිවුඩයක් සහිත කතන්දරයක්

a) Long stories-Lk.10:30-37(Good Samaritan) - Matt.20:1-16(Labo.in the Vineyard)

b) Short stories-Matt7:24-27(Wise & foolish Men) -Lk.15:4-7(Lost Sheep)

c) Picture-language-Lk.6:39(Blind leading blind) - Matt.13:33(Leaven)

2) **ALLEGORY**- Every detail is important.

දෘෂ්ඨාන්තයක්

a) Jn.15:1-10- (Vine) - Mk.12:1-10- (Wicked tenants)

b) Matt.13: 3-9/ Mk.4: 3-9/Lk.8: 5-8. (Sower)

Parable or allegory?

3) **EVERYDAY LIFE** - Stories and pictures from everyday world around Him

එදිනෙදා ජීවිතයෙන්

a) Matt.6:26&28- (Lilies of the field)

b) Nature-Sparrows, fox, fig trees, bread & door etc

4) **HUMOUR**- People would have laughed at these sayings.

හාස්‍යය

a) Lk.6:39- (Blind leading blind)

b) Matt.7:3-4 (Log in your own eye)



5) **EXAGGERATION**-To put across a message very

අතිශෝක්තිය

strongly in order to make people wake up and take notice.

a) Mk.10:25 (Eye of a needle)

b) Lk.14: 26 (Hate his own father, mother & etc.)

6) **PARADOX**- A statement which seems to contradict itself.

පරස්පර විරෝධි සේ පෙනුනත් ගැඹුරු සත්‍යයක්

a) Mk.9:35(First and Last)

b) Matt.10:39 (He who finds his life will lose it..)

7) **REPETITION**- Same thing is repeated.

පුන පුනා කීම

a) Lk.14:11(Humble exalted)Also Lk.18-14

8) **POETRY**- Sayings in verses.

පද්‍යය

a) Matt.11:17(Piped and danced)

9) **USE OF THE OT**

පුරාණ ගිවිසුම භාවිතය

**a) Lk.7:18-23 (Poor & Good news)- com.Is:35:5-6**

10) EXAMPLE-**By own example**

උදාහරණ

**a) Lk.19:1-10(Zaccheus)**

11) **SYMBOLIC ACTION-Performing of a symbolic action**

සංකේතාත්මක ක්‍රියා

**a) Lk.19: 28-44 (Entering into Jerusalem on a donkey.)**

සෑම කිතුණු සංඝයක්ම නිතිපතා මානසිකව සහ ආධ්‍යාත්මිකව වර්ධනය විය යුතු වේ. මේ වර්ධනයන් හරියාකාරව හැසිරවීමට විවිධාකාරයේ අධ්‍යයනයන් අනිවාර්ය වේ. පුළුල් වශයෙන් මෙම අධ්‍යනයන් විධිමත් සහ අවිධිමත් යනුවෙන් කොටස් දෙකකට බෙදිය හැකිය. මෙම අධ්‍යන ක්‍රම දෙක සම්බන්ධයෙන් පත පොතින් දැනුම ලබා ගත හැකි අතර ඊට අමතරව අත්දැකීම් යොදා ගනිමින් එඬේරාට විවිධ ක්‍රම යොදා ගත හැකිය. එඬේරෙකුගේ ඉගැන්වීමේ සේවය සඳහා ජේසුස්වහන්සේගේ ඉගැන්වීමේ ක්‍රම ගැන අවබෝධයක් ලබා ගැනීම සහ ඒවා අද භාවිතා කළ හැකි ආකාරයන් ගැන වැටහීමක් ලබා ගැනීම ඉතා වැදගත්ය.

ජේසුස්වහන්සේ සමාජය තුළ අවිධිමත් අධ්‍යාපන ක්‍රම ඉතාමත් දක්ෂ හා අර්ථවත් ආකාරයෙන් භාවිතා කර ඇති බව සුභාරංචි වල මනාව පැහැදිලි වේ.

ජේසුස්වහන්සේගේ ප්‍රධානතම ඉගැන්වීමේ ක්‍රමය වූයේ උපමා භාවිතයයි. මේ උපමා ජේසුස්වහන්සේ ලබා ගන්නා ලද්දේ එතුමාගේ සමකාලීන සමාජයෙනි. මෙසේ ලබා ගත් උපමා එතුමා ත්‍රිවිධාකාරයෙන් භාවිතා කර තිබේ. යම් අවස්ථාවල එතුමා දීර්ඝ කථාවක් පවසන ලදි. නිතරම මේ උපමා කතා වල උපමාව හා උපමේයට අමතරව එදා ජේසුස්වහන්සෙගේ සමාජයේ සමාජ ආර්ථික අර්බුද එතුමා සාකච්ඡාවට භාජනය කරන ලදි.

ජේසුස්වහන්සේ දේශනා කල ඉතා ප්‍රසිද්ධ දීර්ඝ උපමාවක් වන යහපත් සමාරිතයාගේ කථාවේ මෙය සක්සුදක් සේ පැහැදැලි වේ. එදා සමාජයේ තිබූ ජුදෙව් සමාරිත කුල භේදය, සමහර මාර්ග වල සොරුන්ගෙන් හා මංකොල්ල කන්නන්ගෙන් තිබූ තර්ජන යනාදි දේ මේ කථාවෙන් මනුෂ්‍යයන්ගේ අවධානයට යොමු කර තිබේ. එසේම එතුමා එදා සමාජ පසුබිමෙන් කෙටි උපමා කතාද වදාරන ලදි. ජේසුස්වහන්සේ නිතරම තම ධර්ම දේශනා වලදී එදිනෙදා ජීවිතයේ දකින හා භාවිතාවන දේ යොදා ගන්නා ලදි. කෙතෙහි මුහුන්, අත්තික්කා, මානෙල්, අබ, තිරිඟු, ඉරිඟු වැනි දේ එතුමාගේ ජීවිතයට ඉතා සමීප විය. මෙමගින් මනුෂ්‍යයන් එදිනෙදා කන, බොන, අඳින, පලඳින දෑ උපයෝගී කරගෙන එතුමා තම දහම මනුෂ්‍යන්ට වඩා අර්ථවත් කරන ලදි. විටෙක ජේසුස්වහන්සේ හාස්‍යය එතුමාගේ ධර්ම දේශනා වලට මාධ්‍යය වශයෙන් භාවිතා කරන ලදි. හාස්‍යය ජනතාවගේ හදවත් වලට සමීප නිසා මෙම භාවිතය අද සමාජය විපර්යාසය තුල එදිනෙදා ජීවිතයට ජීවනයක් ගෙන එන්නට කටයුතු කිරීමේ සේවය කරන්නට ජේසුස්වහන්සේ කළාක් මෙන් කිරීම එඬේරාගේ කාර්ය වේ.

## 6.2. බයිබලය අධ්‍යනය කිරීම

එඬේරාගේ අත් පොත බයිබලයයි. බයිබලය කිතුණුවන්ට අද්විතීය ග්‍රන්ථයකි. ඔහු - ඇය නිතිපතා බයිබලය කියවිය යුතු අතර එය අධ්‍යයනය කිරීම අත්‍යාවශ්‍යය.

එනමුත් බයිබලය සම්බන්ධව එඬේරාගේ වගකීම ඉන් හමාර නොවේ. ඔහු - ඇය ජනතාවට බයිබලය අධ්‍යනය කිරීමට මග පෙන්විය යුතුය. මෙහිදී කිතුණු සංඝය තුළ බයිබලයට හිමිවන ස්ථානය පැහැදිලිව තේරුම් ගැනීම අත්‍යාවශ්‍යය. බයිබලය දේව වචනය වන අතර එය ලියන ලද්දේ මනුෂ්‍යයන්ය. එහෙත් මනුෂ්‍යයන් එය ලියන ලද්දේ දේව මගපෙන්වීම සහිතවය.

එහෙත් දෙවියන්වහන්සේගේ පූර්ණ එළිදරව්වීම සිදුවූයේ ජේසුස්වහන්සේ තුළය. මේ නිසා බයිබලය සම්පූර්ණයෙන් අර්ථවත් වන්නේ දෙවියන් වහන්සේගේ පූර්ණ එළිදරව්ව වන ජේසුස්වහන්සේ තුළය. ජේසුස්වහන්සේගෙන් තොරව බයිබලය භාවිතා කිරීම තවත් පොතක් පරිහරණය



...ර්මකි. එමෙන්ම බයිබලය කිතුණුවන්ට ව්‍යවස්ථාවක් හෝ නීති පොතක් නොවන බව වටහා ගැනීමත් එය සංඝයට වටහා දීමත් එඬේරා සතු වගකීමකි.

බයිබලය විවිධාකාරයෙන් අධ්‍යනය කල හැකිය. මෙයින් වැදගත් ක්‍රම 3 ක් පහත දැක්වේ.

**01** පවුල තුල බයිබලය අධ්‍යනය කිරීම.

**02** පුද්ගලික භාවනාව සඳහා බයිබල් අධ්‍යනය කිරීම.

**03** දැනුම සඳහා බයිබලය අධ්‍යනය කිරීම.

එසේම 92% විවිධ ආගම් අදහන ශ්‍රී ලංකාවේ සමාජීය වටිනාකම්, ආකල්ප, සාරධර්ම හා ප්‍රමුඛතාවයන් මූලිකව සලකා බලා කටයුතු කිරීමට වග බලා ගැනිම යහපත් ආරංචිය අධ්‍යනය මගින් ජන හදවත් වලට ලබා දිය හැක.

## 6.3. ශ්‍රාවකයන් පුහුණු කිරීම

කිතුණු සංඝය ඉදිරියට ගෙන යෑම සඳහා ශ්‍රාවකයන් පුහුණු කිරීම හා සෝදිසි කිරීම එඬේරා සතු වගකිමකි. මෙහිදි මූලිකව සෑම කිතුණුවෙක්ම ශ්‍රාවකයෙකි. එහෙත් මේ මූලික කැඳවීම තුළ ශ්‍රාවකයන්ට විශේෂ වගකිම් ඉටුකිරීමට සිදුවේ. එඬේරාගේ ජීවිත රටාවෙන් දෙසන දහම මුඛයෙන් දෙසන දහමට වඩා ඉතා වැදගත්ය. මේ නිසා එඬේරාගේ ජීවිත රටාව හැසිර විය යුතු ආකාරය ගැන අවබෝධයක් එඬේරා සතුවීම අත්‍යාවශ්‍යය. මෙහිදී ජේසුස්වහන්සේ තම ශ්‍රාවකයන්ගෙන් බලාපොරොත්තු වූ ජීවිත රටාව එඬේරා තුළ විද්‍යාමාන විය යුතු වෙයි. ශ්‍රාවකයන් පුහුණු කිරීමේ දී එඬේරා ක්‍රිස්තු ශාසනයට ගැලපෙන ආකාරයට ශ්‍රාවකයන් පුහුණු කිරීමට වග බලාගත යුතුය.

## 6.4. ධර්ම දේශනා

එඬේර සේවය තුළ ධර්ම දේශනා කිරීම අනිවාර්ය අංගයකි. විවිධ ධර්ම දේශනා අතර සෑම ඉරිදාම දේශනා කරන දහම් පණිවිඩය ඉතා වැදගත් වේ. මෙම ඉරිදා දහම් දෙසීම යම් ක්‍රමානුකූල පිළිවෙලකට කිරීමෙන් ඒවා ජනතාවට වඩා අර්ථවත් කළ හැකිය. එයට මූලික හේතුව නම් ඒ මගින් අවුරුද්ද තුළ කිතුණු ජීවිතයේ මූලික අංග සියල්ල ගැනම දේශනා කිරීමට අවකාශ සැලසීමයි. එසේම එඬේරාට රුචි මාතෘකා පමණක් දේශනා කිරීමේ ප්‍රවනතාවයෙන් මිදීමටද මෙය මහගු අත්වැලකි. දහම් දෙසීමට පෙර එඬේරා බයිබලය ගැඹුරින් හැදෑරීම අත්‍යාවශ්‍යය. එමෙන්ම නිතිපතා භාවනාවෙන් යුක්තව බයිබලය කියවා එය මෙනෙහි කිරීම එඬේරා සතු වගකිමකි. දහම් දෙසීමට ආධාරක වශයෙන් එඬේරාට තුන් වැදෑරුම් අටුවා පොත් භාවිතා කල හැකිය.

පළමුව භාෂා හෝඩිය අකුරු අනුව බයිබල් වචන විස්තර කර ඇති අටුවා පොත් මගින් තමාගේ දේශනය සඳහා භාවිතා කිරීමට බලාපොරොත්තු වන

වැදගත් බයිබලිය වචන පැහැදිලි කර ගත හැකිය. දෙවනුව බයිබලයේ පොත් විග්‍රහ කර ඇති අටුවා පොත් දේශනාවට යොදා ගන්නා බයිබල් කොටස හෝ පදය ගැන පුළුල් අවබෝධයක් ලබා දෙයි.

තෙවනුව බයිබලයේ අඩංගු නොයෙකුත් වැදගත් දේ සඳහන් සියළුම ස්ථාන පරිච්ඡේද හා පද වශයෙන් භාෂා හෝඩියේ අකුරු අනුව දක්වන අටුවා පොත් පරිහරණය කිරීමෙන් දේශනාවේදී ගෙනහැර දැක්වීමට බලාපොරොත්තු වන සියළුම වැදගත් දේ සඳහන් බයිබල් පද සොයා ගත හැකිය. එඬේරාගේ දේවධර්මය අන් අයගේ විවිධ දේවධර්ම වලින් පෝෂණය කර ගන්නවා නම් ඒ දේවධර්ම අනුකරණය කිරීම එඬේර සේවයට හිතකර නොවේ.

දේශනා කිරීමේදී භාවිතා කළ හැකි සරල ක්‍රම වේද 2 ක් නම් බයිබල් විවරණ දේශනා හා මාතෘකාවක් අනුව දේශනා කිරීමයි. බයිබල් විවරණ දේශනා වලදී අටුවා පොත් වලින් ලබා ගන්නා දැණුම විග්‍රහ කර විශ්ලේෂනය කළ යුතු වේ. මෙහිදී භාවිතා කරන බයිබල් කොටස කා විසින් කා හට ලියන හෝ පවසන ලද්දක් ද? එහි සමාජ පසුබිම කුමක් ද? එය ලියන ලද පරමාර්ථය පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ. ඉන් අනතුරුව තමාගේ සංඝයේ, ලාංකික සමාජයේ හා සමස්ථයක් වශයෙන් ලෝකයේ තත්කාලීන පසුබිම තුළ එම කොටසෙන් අදට ලැබෙන එළිදරව්ව ගැන යාච්ඥාවෙන් යුක්තව මෙනෙහි කිරීම වැදගත් වේ. මෙහිදී සියළුම අදහස් රචනා කරගෙන පසුව ක්‍රමානුකූලව දේශනාව සකස් කළහොත් දේශනාව වඩා අර්ථවත් කරගත හැකි වේ. දේශනා කිරීමේදී දේශනාවේ අන්තර්ගතය මෙන්ම දේශකයාගේ ශරීර අංග උපාංග භාවිතය ගැන අවධානය යොමු කළ යුතු වේ.

නිතරම දහම් දෙසන්නේ නමස්කාරය තුළ නිසා නමස්කාරයේ පසුබිමට හානි නොවන ආකාරයෙන් ශරීර අංග භාවිතා කිරීම යෝග්‍යය. මෙහිදී අත් පා චලනයෙන් දේශනය අර්ථවත් කළ හැකි වුවත් ඒවා අනවශ්‍යය ලෙස ප්‍රමාණය ඉක්මවා භාවිතයෙන් නමස්කාරයට හා දේශනයට බාධා පැමිණිය හැකිය.

- ඉරියව්, හඬ පාලනය, නේත්‍ර ස්පර්ශය,

කෙතරම් සරල වුවත් සෑම දේශනාවකටම පැහැදිලි ආකෘතියක් තිබිය යුතුවේ. මෙයට මුලික හේතුව නම් ජනතාවට ආකෘතියක් නොමැති දේශනයක් වටහා ගැනීමට නොහැකි විමයි.

- පැහැදිලි, සංක්ෂිප්ත, නිරවද්‍යයභාවය, දත්ත, ගලායාම

දේශනා කිරීමේදී භාෂාව භාවිතය හා හැසිරවීම එඬේරා කල්පනා කාරීව කළ යුතුවේ. මෙහිදී ශ්‍රවනය කරන්නන්ගේ පසුබිම අනුව දේශනාවේ භාෂාව හැසිරවීම ඉතා වැදගත් වේ. විවිධ සංදර්භ තුල ධර්ම දේශනා කිරීමේ පදනම වන්නේ සුවය පවත්වාගෙන යෑමට අත්වැලක් වීම සුව කිරීමට වඩා යහපති යන පදනම මත සුවය නැති කරන කරණා වැලැක්වීමට ක්‍රියා කරනු ලැබීමයි.




# 7 පරිච්ඡේදය

## සමාජ නිරෝගීතාවය



සමාජ නිරෝගීතාවය උදේසා සුවය පවත්වාගෙන යෑමට අත්වැලක් වීම සුව කිරීමට වඩා යහපති යන පදනම මත සුවය නැති කරන කරණා වැලැක්වීමට ක්‍රියා කරනු ලැබීමට කටයුතු කිරීම ඉතා යහාපත්ය. ක්‍රිස්තුස්වහන්සේ තුළ නව මිනිසෙක් වනවා සේම නව මිනිසෙක් බිහි කිරීමෙන් සමාජ නිරෝගීතාවය වර්ධනය කිරීමට එඬේරුන්ට ඇති සුවිශේෂ අවස්ථා අපමණය. නමස්කාරය ජන චන්දනාව ප්‍රධාන කොට සැලකිය හැකිය. මෙය ජන ජීවිතයම හා බැඳි පවති. එසේම මිනිස් අවධින්ට අනුව සමාජ නිරෝගීතාව උදේසා මැදහත්කාරකම් කිරීමේ අවස්ථාද බොහෝය. සමාජ නිරෝගී කිරීම උදේසා කටයුතු කිරීම එඬේර වගකිමක් වන්නේය.




❖ නමස්කාරය

සමාජ නිරෝගීතාවය වර්ධනය කිරීමට එඬේරුන්ට ඇති සුවිශේෂ අවස්ථාව නමස්කාරයයි. මෙය අනෙකුත් වෘත්තීන් වල යෙදෙන අයට සාමාන්‍යයෙන් නොලැබෙන අවස්ථාවක් වන අතර බොහෝ විට මේ අවස්ථාව එඬේරාට අඩුම තරමින් ඉරිදාවක් පාසා ඉරිදාවක් ලැබෙයි. මේ සඳහා ගිහි ජනතාව සමග අර්ථවත්ව නමස්කාරය පැවැත්වීම එඬේරාගේ වගකීමයි. මෙහිදී ප්‍රථමයෙන් නමස්කාරයේ මුලික අර්ථය එඬේරා වටහා ගැනීම සහ ජනතාවට වටහාදීම ඉතා වැදගත් වේ.

ක්‍රිස්තියානි නමස්කාරයේ ඇති විශිෂ්ඨතාවය නම් "නමස්කාරය වනාහි මනුෂයා සහ ඔහුගේ පරිසරය අතරත් අඛණ්ඩ පැවැත්ම සහ සමූහයා අතරත් පරම්පරාවක් සහා පරම්පරාවක් අතර අඛණ්ඩ පැවැත්මක් සහ ඒකත්වයක් ඇති කරවන බැම්මයි"

නමස්කාරයේ දී වචන භාවිතය වැදගත් වුවත් එය වචන වලට පමණක් සීමා නොවන බව මතක තබාගත යුතු කරුණකි. මෙහිදී මනුෂ්‍යයන්ගේ සෑම ඉන්ද්‍රියක්ම නමස්කාරයට යොමු කිරීමෙන් නමස්කාරය වඩා අර්ථවත් සහ හරවත් කළ හැකිය. මෙවැනි නමස්කාරයකින් මනුෂ්‍යයන් සමාජය සමඟ සන්නිවේදනය කරන සහ ක්‍රියාත්මක වන ඉන්ද්‍රියන් යහපත් අන්දමෙන් හැසිරවීමට ජනතාවට යොමුවක් ලැබේ. ඇස නමස්කාරයේ ප්‍රධාන අංගයකි. නමස්කාරය තුළදී බැතිමතුන් වටාපිටාවේ දකින දේ නමස්කාරයට යොමු කිරීමට හෝ නමස්කාරයෙන් බැහැර කිරීමට පාදක විය හැකිය. මේ නිසා නමස්කාරයේ වට පිටාව අර්ථවත්ව පිළිවෙල කිරීම නමස්කාරයට යොමු කිරීමටත් නමස්කාරය අර්ථවත්ව පවත්වාගෙන යෑමටත් ඉතා වැදගත් වේ.

නමස්කාරයට සහභාගිවන ජනයාට අවටින් දැනෙන සුගන්ධයන් තුළින් නමස්කාරය පිළිබඳ හැඟිම ගෙන දෙයි. එමෙන්ම එම පසුබිමේ අප්‍රසන්න දුගන්දයන් වෙතොත් එය නමසකාරයේ පසුබිම ඉවත් කරන සාධකයක් විය හැකිය.

ලංකාවේ සෑම නිකායකම පාහේ යුකරිස්තය නොහොත් සහභාගිකමේ දේව මෙහෙයන් වලට ජනයා ඇදී ඒමේ වැඩි ප්‍රවනතාවයක් ඇති බව නොරහසකි. මෙයට එක් මූලික හේතුවක් වන්නේ මේ දේව මෙහෙයේ දි සහභාගිකම භුක්ති විඳීමට ලැබීමයි. මෙහිදී පැහැදිලි වන වැදගත් කරුණ නම් නමස්කාරයේ දි දිව වැදගත් වන ආකාරයයි. ස්පර්ශය ලාංකික සමාජයේ සංවේදි අංගයක් වුවත් එය නමස්කාරයේදි අර්ථවත්ව භාවිතා කළ හැක. එඬේරා ජනතාවට ආශිර්වාද කිරීමේදි හිස අත් තැබීම මෙයට කදිම උදාහරණයකි. එඬේරා කුමන නිකායකට අයත් වුවත් තමා රැක බලා ගන්නා සංඝයේ නොයෙකුත් තිරණාත්මක අවස්ථාවල නමස්කාරයන් පැවැත්වීමට එඬේරාට සිදු වේ. මේ අවස්ථා ගැන පූර්වාබෝධයක් එඬේරා සතු විය යුතුයි. මෙම සමහර අවස්ථා සෑම සංඝයකටම පොදු වන අතර සමහර අවස්ථා සංඝය අනුව වෙනස් විය හැකිය. මෙම පොදු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.





❖ ප්‍රසාද ස්නාපනය හෙවත් බෞතීස්මය

ප්‍රසාද ස්නාපනය හෙවත් බෞතීස්මය සෑම කිතුණු නිකායකම පාහේ ඉතා වැදගත් සක්‍රමේන්තුවක් නොහොත් ප්‍රසාද නිධානයක් වෙයි. මෙහිදී අධිරාජ්‍යවාදී පසුබිම තුළ මෙම ප්‍රසාද නිධානය විවිධාකාරයෙන් ක්‍රියාත්මක වූ නිසා මේ සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් එඬේරා සතුවීම වැදගත් වෙයි. අධිරාජ්‍යවාදී සමය තුළ බෞතීස්මය ලබා ගුරු පත්වීම් ලබා ගැනීම සහ වෙනත් නොයෙකුත් වාසි ලබා ගැනීම නිසා මෙම සක්‍රමෙන්තුව සම්බන්ධයෙන් සමහර ජනතාව අතර පිළිකුල් සහගත හැඟීම් ඇති වූ බව අමතක කළ නොහැක. මෙම පසුබිම තුළ බෞතීස්මයේ ගැඹුරු අර්ථය ජනතාවට අවබෝධ කර දීම සහ මෙම ප්‍රසාදී නිධානය පෙර අධිරාජ්‍යය යුගවල සමහර විට වැරදි වැටහීම් ඇති වූ ආකාරයට භාවිතා නොකිරීමට වග බලා ගත යුතුවේ.

බෞතීස්මය පවිත්‍රවීමේ චාරිත්‍රයකි. මෙම චාරිත්‍රයෙන් මූලිකව බලාපොරොත්තු වන්නේ ඇදහිල්ලට සහ ඇදහිල්ලේ ජන සමාජයට ඇතුලත්වීම සහ නැවත උත්පාද වීමය. සමහර දේවස්ථාන වල බෞතීස්මයට වතුර බහාලීමට භාවිතා කරන භාජනය සහිත උපකරණය දේවස්ථානයේ ප්‍රධාන දොරටුව අසල තබා තිබේ. මෙයින් සංකේතාත්මකව ගෙන හැර දක්වන්නේ කිතුණු ඇදහිල්ලට ඇතුලත් වීමය. එසේම සමහර දේවස්ථානවල මෙම භාජනය අල්තාරය අසල තබා තිබේ. එසේ තැබීමෙන් සංකේතාත්මකව සිදු කරන්නේ ඇදහිල්ලේ ජන සමාජයට එක්වීමය.

❖ විවාහය

විවාහය සෑම සංඝයකම දැකිය හැකි වුවත් විවාහ චාරිත්‍ර චාරිත්‍ර සංඝය අනුව බොහෝ විට විවිධ විය හැකිය. මෙම විවිධත්වයන්ට භූගෝලීය ප්‍රදේශය හා කිතුණු නිකාය විශේෂයෙන් පාදක වේ. තමා සේවය කරන ප්‍රදේශයේ මෙම ප්‍රවනතාවයන් ගැන පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම එඬේරා අනිවාර්‍යයෙන්ම කළ යුතු කරුණකි. ශ්‍රී ලාංකික පසුබිමේ සාමාන්‍යයෙන් විවාහයන් සිදුවන්නේ විවාහ වන දෙදෙනා අතර පමණක් නොව ඒ දෙදෙනාගේ පරම්පරා දෙක අතරය. කිතුණු ඇදහිල්ල අනුව විවාහය තුළින් විවාහ වන ස්ත්‍රි සහ පුරුෂයා එක් මාංශයක් වන්නෝය.

ලංකාව වැනි බහු ආගමික රටක බහු ආගමික විවාහයන් සිදුවීම ස්වභාවිකය. මෙයට මූලික හේතුවක් වන්නේ සමාජයේ එකට ජිවත් වන ස්ත්‍රි පුරුෂයන් ජාති ආගම් භේදයකින් තොරව එකිනෙකාට ආකර්ශනය වීමයි. එසේම 8% පමණක් කිතුණුවන් සිටින ශ්‍රී ලංකාවේ කිතුණුවන් සහකරුවන් සහ සහකාරියන් සොයන විට ඔවුන්ගේ සන්දර්භයේ 92% කිතුණුවන් නොවීම කිතුණුවන් විවිධ ආගම් අදහන අය සමග විවාහ වීමට මූලික හේතුවක් වෙයි.

❖ අසනීප අවස්ථා

සුවය සඳහා පවත්වන දේව මෙහෙයන් අශුද්ධ ආත්මයන් දුරුකිරීම, ශාරීරික හා මානසික ආධ්‍යාත්මික සුවය තමා අයත්වන නිකායේ පරිණත පුද්ගලයන්ගේ අවවාද අනුශාසනා සහිතව කලයුතු සේවාවකි. නිතරම මෙම සේවාව ලාභ උපයන ව්‍යාපාරක් බවට පත්වීමට ඇති ප්‍රවනතාවය මහත් නිසා ප්‍රවේශම්විය යුතුවේ.

❖ අවමංගල්‍යය

ඉපදෙන සෑම මනුෂ්‍යයෙක්ම මිය යාම නිසා භේදයකින් තොරව සෑම සමාජයකම අවමංගල්‍යයන් ඇතිවන බව නොරහසකි. ඕනෑම සමාජයක අවමංගල්‍ය අවස්ථාවන් ඉතාමත් සංවේදී ජනක පරිසරයක් නිර්මාණය කරයි. මෙවැනි අවස්ථාවන්හි දි සෑම සමාජයකම කළ යුතු සහ නොකළ යුතු කාරණා තිබේ. සංඝයක් භාරව සිටින එඬේරුන්ට විවිධ විශේෂ නමස්කාරයන් නිතර මෙහෙයවීමට සිදුවේ.

❖ නිවෙස් සඳහා මුල් ගල් තැබීම්, අශිර්වාද කිරීම

ලාංකීය සමාජය තුළ අළුත් නිවසක් සෑදීමට පෙර මුල් ගල තැබීම ඉතා වැදගත් වේ. නිවෙස් ආශිර්වාද කිරීම

❖ ව්‍යාපාර ආශිර්වාද කිරීම

❖ ජන නායකයන් උදෙසා නමස්කාරයන්

## 7.1. කාන්තාවන්, පුරුෂයන් හා ස්වභාව ධර්මය අතර මෙහෙවර

එඬේර සේවය තුළ කාන්තාවන්ගේ හා පුරුෂයන් අතර සේවය සුවිශේෂ ස්ථානයක් ගනී. කාර්මිකරණය හා නාගරීකරණය, ගෝලීයකරණය වැනි ක්‍රියාවලින් නිසා ලෝකයේ පෙර නොවූ විරූ සංවර්ධනයක් ලඟා කර ගනිමින් සිටී. එසේ වුව ද එම ක්‍රියාවලිය නිසා මිනිසා සහ මිනිසාත්, මිනිසා හා පරිසරයත් අතර සිදුව ඇති විනාශය අති විශාලය. වාතය, ජලය, පස ඇතුළු පරිසර දූෂණය, ජෛව විවිධත්ව හානිය, පරිසර සම්පත් හානිය, වනාන්තර විනාශය යනාදිය අනතුරු ඇඟවීම දක්වා ඉහළ ගොස් ඇත. මෙවායේ ප්‍රතිඵල ලෙස මේ සඳහා අසීමිත ලෙස වෙහෙසෙන මිනිසා ලෝකය පවත්වා ආරක්ෂා කර තුලිත ලොවක් වෙනුවට ලෝකයේ ස්වභාවිකත්වය රැගෙන ගෝලීය උණුසුම් වීම සහ දේශගුණ වෙනස් වීම, ඕසෝන ස්ථරය වියැකීම, අම්ල වැසි පතනය වැනි පෙර නොඇසූ ස්වභාව ධර්මයට හානි සිදු වෙන තැනට පත්ව ඇත. එසේම කායිකව, මානසිකව අතතියට පත්ව සිටින මිනිසාව මෙම පසුබිම් පරිසයන් යටතේ පැවැත්ම උදේසා මගපෙන් විය යුතුව ඇත.



## 7.2. දරුවන් අතර මෙහෙවර

දරුවා යනු කවුද? එක්තරා ආකාරයකට දරුවා මිනිසාගේ පියා යැයි කිව හැකිය. මෙහි අර්ථය නම් පරිණත වැඩිහිටියෙක් බිහිවන්නේ දරුවෙකුගෙන් යන්නයි. මේ නිසා සෑම පුද්ගලයෙක්ගේම දරු අවධිය වැඩිහිටි අවධියට වඩා වැඩිමහළුය. මේ කාරණාව නිසාම සෑම වැඩිහිටියකුගේම දරු අවධියේ අත්දැකීම් වැඩිහිටි අවධියේ අත්දැකීම් වලට වඩා මුහුකුරා ගිය ස්වභාවයෙන් ගහනය ළමයෙකුට මුලින් ආවේගය ලැබෙන්නේ ආත්මයෙන්ය. එනම් ප්‍රේමය සහ අවදානයෙන්ය. චිත්තාවේගී අවධානය මගින් දරුවෙකු බුද්ධිය ලබා ගැනිමත් මානසික අවදානය යොමු කිරීමටත් උපකාරි වේ. ජන සමාජයේ අනාගතය රඳා පවතින්නේ දරුවන් අතරය. කිතුණු සංඝය ගැන සලකා බලන විට ද මේ යථාර්ථය එසේම සත්‍ය වේ. එසේම සමස්ත දරුවන් අද්විතීය අනන්‍යතාවයක් ඇති පුද්ගලයෙකි. නමුත් වර්තමානයේ බොහෝ දරුවන් විවිධ ඌණතාවයන්ට ලක්ව ඇත.

උදා - ADD අවධාන ඌණතාවය, ADHD අවධාන ඌණතාවය අධි ක්‍රියාකාරිත්වය, Autism - ස්වෛච්ජතාතාව

ඉහත ඌණතාවයන්ට ලක්වන්නේ ඩිජිටෙල්කරණය හමුවේ ස්වභාවිකව ජීවත් විය යුතු ආකාරයට දරුවන්ට ලබා නොදීමයි. එසේම තරඟකාරි න්‍යෂ්ඨික ජීවන රටාවන් නිසා ළමයි විවිධාකාරයෙන් කායිකව ද මානසිකව ද අපයොජනය වේ. සාමාජයේ වගකීම දරණ දෙමාපියන්ගේ සිට වැඩිහිටි අය දක්වා වර්තමානයේ අසමසම වටිනාකම නිසි ආකාරව දරුවන්ට අහිමි කිරීම නිසා ද අසහනකාරි දරුවන් ද රටට බිහි කරයි. එසේම උපතින් විශේෂ අවශ්‍යතා ඇති දරුවන් ද බිහිවේ. ජේසුස්වහන්සේ දරුවන්ට අශිර්වාද කිරීමෙදී කළ ක්‍රියාව එඬේර සේවකයකු ලෙස කිරීමට වග බලාගත යුතුය.

## 7.3. තරුණයන් අතර මෙහෙවර

තරුණයන් සෑම සමාජයකම කොඳු නාරටිය ලෙස හැඳින්විය හැකිය. මනුෂ්‍යයන්ගේ දැනුම, ශ්‍රමය හා නව නිමැවුම් සඳහා යොමු වීමට ඇති ප්‍රවනතාවයන් උච්ච වන්නේ යොවුන් සමයේදීය. එසේම වර්තමානයේ සමාජයේ තරුණ දරුවන් වගවෙන උගන්වන ගුරුවරුන්, දේශකයන් හා දේශපාලන මතවාද, මාධ්‍යයන්, විලාසිතා, ශාරීරික වර්ධනය හා ඒ ආශ්‍රිත ගැටළු හා විසඳුම්, මානසික ලැදියාව හා ඒ අශ්‍රිත ගැටළු හා විසඳුම්, චිත්තාවේග හා ඒ අශ්‍රිත ගැටළු හා විසඳුම්, ලිංගික ගැටළු හා විසඳුම්, පවුල් අශ්‍රිත ගැටළු හා විසඳුම්, අධ්‍යාපන ගැටළු හා විසඳුම්, සමබර පෞරුෂය වර්ධනය, යොවුන් වියෙන් වැඩිහිටි විය, පිළිබඳ අප සොයා බැලුවේ ද?

යොවුන් වියේ ස්වභාවිකව පැන නගින ආශාවන් පුබුදු කර වන හැගීම් ජනනය කර වැරදි ඉගැන්වීම් වලින් තරුණ ජීවිත නොමග යවන, කඩා බිඳ දමන, හිංසා පිඩා කරන්න උගන්වන බොහෝ දේ නිසා ජීවිත  සෑම අවස්ථා කෙරෙහි අවබෝධයකින් යුක්තව මෙම උගුලට හසු වි ඇති හා හසු වීමට යන තරුණ ජීවිත කෙරෙහි ක්‍රියා කිරිම හා මගපෙන්වීම  එඬේර වගකිමකි. ගැලපෙන යහපත් දේ නිර්මාණකාරිව යෙදවීම කිතුණු සංඝයක එඬේරා සතු වගකීමකි. තරුණයන් නිතර වෙනස්වන සුළුය. මෙහිදී එඬේරාගේ මගපෙන්වීම ඉතා වැදගත්ය.

## 7.4. වැඩිහිටියන් අතර මෙහෙවර

තුන්වන ලෝකයේ රටවල් අතර ලංකාවේ දිගු කලක් ජිවත්වීමේ ප්‍රවනතාවය ඉතා ඉහළ මට්ටමක ඇත. මේ තත්වය තුළ ශ්‍රි ලංකාව තුළ වැඩිහිටියන්ගේ ප්‍රතිශතය ඉහළ යමින් පවති. වර්තමානයේ වේගවත් ජීවන රටාව පවුල න්‍යෂ්ඨික කිරිම නිසා වැඩිහිටි ජීවිත හුදකලා වීමේ ප්‍රවනතාවය ඉහළ ගොස් ඇත. මේ නිසාම ඉතා අසරණ බොහෝ වැඩිහිටි ජීවිත උවමනා එපා කම් ගැන කතා කරන්න කෙනෙක් නොමැතිව, ශාරීරිකව මානසිකව වේදනාවෙන් සිටි. වර්තමානයේ කිතුණු සංඝය මේ පිළිබඳව විශේෂ අවදානය යොමු කළ යුතු කාලය එළඹ තිබේ. මෙහිදී නගරබද වැඩිහිටි නිවාස පවත්වාගෙන යාමේ සේවයෙන් ඔබ්බට යෑමට කාලය එළඹී තිබේ.

## 7.5. සහෝදරත්වය හා සහභාගිකත්වය

නව ගිවිසුමේ මුල් සභාවේ සහෝදරත්වය හා සහභාගිකත්වය "කොයිනොනියා" යන ගීක් වදනින් දක්වා තිබේ. සුභ අසුභ කුමන ශාරීරික මානසික තත්වයන් යටතේ වුව ද නිතර සහෝදරත්වය හා සහභාගිත්වයට කැදවීමට එඬේරා වග බලාගත යුතුය.

## 7.6. නමස්කාරය තුල නායකත්වය

කිතුණු එඬේරෙක්ගේ කරන්නා වු සෑම මෙහෙවරයකම නායකත්වය සෑම විටම සමාජ සුවතාවය පිණිස යොමු විය යුතු වේ. මේ සඳහා එඬේරාට විවිධ සන්දර්භය අනුව නායකත්වය විවිධ ආකාරයෙන් යෙදවීමට සිදුවේ. තීරණ ක්ෂණිකව ගත යුතු අවස්ථාවල එඬේරාට අණකිරිමේ නායකත්වයක් ක්‍රියාත්මක කිරිමට සිදු විය හැකිය. මරණාසන්න අවස්ථාවන්, අනතුරු අවස්ථාවන් මේ සඳහා කදිම උදාහරණයි. මෙවැනි අවස්ථාවල තීරණ පමා කිරිම සැමගේ කලකිරීමට හේතු විය හැකිය. මෙවැනි බොහෝ අවස්ථා වල ගත යුතු තිරණයන් වචනයෙන් වචනයට ග්‍රන්ථ වල වාර්ථා වි නොමැත. මෙවැනි තත්වයන් තුල පරිපූර්ණ තීරණ සෑම විටම ගත නොහැකි වුවත් සිහි කල්පනාවෙන් සහ යාච්ඤාවෙන් යුක්තව ගත හැකි යහපත්ම තීරණය ගැනිම ඉතාම වැදගත් වේ.



# 8 පරිච්ඡේදය

## සමගි කිරිමේ සේවය සහ සමාජ පරිවර්තනය

ලොව ඕනෑම ස්ථානයක මෙන්ම ලාංකික සමාජය තුළ ද එඬේරාට පැවරෙන කාර්යභාරයන් අතර සමගි කිරිමේ සේවය ඉතා වැදගත් වේ. සමගි කිරිමේ සේවයෙන් තොර කිතුණු එඬේර සේවයක් නොමැත.

මෙයට මූලික හේතුව වන්නේ සෑම එඬේරකුගේම යහපත් එඬේරා එනම් ජේසුස්වහන්සේගේ මූලික කාර්යභාරය වූයේ සමගි කිරිම නිසායි. එතුමා මෙය දෙයාකාරයකින් ඉටු කරන ලදි. එනම් මනුෂ්‍යයන් දෙවියන්වහන්සේ (පරම සත්‍ය) සමග සමගි කිරිමත් මනුෂ්‍යයා මනුෂ්‍යයා සමග සමගි කිරිමත්ය. මෙහිදී ජේසුස්වහන්සේ දෘශ්‍යයමාන සමගි කිරිම එනම් මනුෂ්‍යයන් අතර සමගිකිරිම නිතර අවධාරණය කරන ලදි. උදාහරණයක් වශයෙන් නොදකින දෙවිඳුන්ට ප්‍රේම කරනවායයි පවසමින් දකින සහෝදරයාට වෛර කරන්නා "බොරු කාරයෙක්" බව ජේසුස්වහන්සේ පවසන ලදි. එසේම එතුමා නිතර ජුදෙව්වන් සහ අන්‍ය ජාතීන් අතර තිබු ආගමික හා ජාතික ගැටුම් සහ ජුදෙව්වන් හා සමාරිතයන් අතර තුල භේදයන් සමගි කිරිමට ක්‍රියා කරන ලදි. තවත් වරෙක එතුමා ප්‍රකාශ කළේ යමෙක් පූජාවක් ඔප්පු කිරිමට යන විට තම සහෝදරයා සමග ඇති අසමගිතාවයක් සිහිවුවහොත් පූජාව පූජාසනය මත තබාගොස් තම සහෝදරයා සමග සමගි වී ඇවිත් පූජාව ඔප්පු කරන්න යනුයි. සමගි කිරීමේ සේවයේ පදනම බිඳීගිය සබැඳිතාවයන් නැවත ගොඩ නැගීමයි.

මෙහිදි සමාජයේ විවිධ ජන කොටස් අතර ඇති පරතරයන් අවම කිරිමට නිතර ක්‍රියා කිරිම එඬේරා සතු කාර්‍යය භාරයකි. එඬේරාගේ ක්‍රියාකාරිත්වය තුල මෙය සමාජීය වගකිමක් මෙන්ම ආධ්‍යාත්මික කාර්යභාරයකි. මෙම සමගි කිරීමේ මෙහෙය මූලිකව ආරම්භ විය යුත්තේ මානුෂික පදනමක් මතය.

## 8.1. විවිධ කිතුණු නිකායන් අතර සමගිය.

සමාජය තුල සේවය කරන සෑම එඬේරෙක්ම යම් කිසි නිකායකට අයත් වේ. මනුෂ්‍යයන් මෙසේ කිතුණු සංඝය නිකායන්වලට බෙදා ගත්තත් ක්‍රිස්තුස්වහන්සේ ශරීරය වන සභාව ඒකත්වයකි. මෙය මනුෂ්‍යයන්ගේ වෑයමකින් සිදුවන්නක් නොව සභාවේ අනිවාර්‍යය ස්වභාවයයි. එම නිසා විවිධ නිකායන් අතර සමගිය ඇති කිරිම සඳහා ක්‍රියා කිරිම යනු සභාවේ නියම ස්වභාවය විද්‍යාමාන කිරිමයි.

මෙහිදී මෙම සමගිය ශක්තිමත් කිරිමට සෑම නිකායක්ම තමන්ගේ ශක්තින් සහ දුර්වලතාවයන් පැහැදිලිව වටහා ගැනීම වැදගත් වේ. උදාහරණයක් වශයෙන් මෙතෝදිස්ත නිකායේ පුද්ගලික පාරිශුද්ධත්වයේ අවධාරනය හා ලංකා සභා

නිකායේ නමස්කාර විධි පිළිබඳ යොමුව ගෙනහැර දැක්විය හැකිය. මෙසේ ශක්තීන් සහ දුර්වලතා අවබෝධ කර ගනිමින් ක්‍රියා කිරීමෙන් සභා සමගිය පමණක් නොව නිකායන් ශක්තිමත්වීම ද නිසැකයෙන් දැකිය හැකි වේ.

මේ ක්‍රියාකාරිත්වය තුළ සෑම නිකායක්ම නිතර ස්වයං විවේචනයේ යෙදීම තම නිකායේ සහ අනෙකුත් සහෝදර නිකායන්ගේ ගුණාත්මක ස්වභාවයේ වර්ධනයට පිටුවහලක් වේ. ලංකාව තුළ ක්‍රියාත්මක වන්නාවූ සෑම කිතුණු නිකායක්ම පාහේ යුරෝපයේ සමාජ ආර්ථික පසුබිම තුල බිය වූ ඒවාය. මෙම නිකායන් තමන්ගේ ආධ්‍යාත්මික ආරම්භයන් ජේසුන්වහන්සේගේ මෙලොව සේවය තුළ ගෙනහැර දැක්වුවත් සමාජීය ආරම්භයන් ක්‍රිස්තු වර්ෂ දෙවන තෙවන ශත වර්ෂයේ සිට අද දක්වා විහිදේ. මේ නිසා බොහෝ විට විවිධ නිකායන් එකිනෙකාගෙන් වෙන් කරන්නා වූ විවිධ අවධාරනයන්ට ලාංකික ආරම්භයක් නොමැති මෙන්ම ඒවා ලාංකිකයන්ට අර්ථවත් නොවේ. එහෙත් බොහෝ විට සෑම නිකායක්ම පාහේ තමන්ගේ බටහිර ආරම්භකයන් උගන්වන ලද ඒ අයගේ ආරවුල් තවමත් කරපින්නගෙන යති. ගැඹුරෙන් ඇගයීමේදී මේ ආරවුල් බොහෝමයකට පැහැදිලි සුභාරංචි පදනමක් නොමැති නිසා ඒවා ලාංකිකයන් තව දුරටත් අවධාරනය කිරීම ප්‍රඥා සෝචර නොවේ. මෙහිදී පැහැදිලි උදාහරණක් ලෙස සහභාගිකමේ දේව මෙහෙය ගෙනහැර දැක්විය හැකිය. මෙම නමස්කාරය තුළ රොටි සහ මිදි යුෂ ජේසුස්වහන්සේගේ ශරීරය සහ රුධිරය වන්නේ කෙසේදැයි විමර්ශනය කිරීමට මධ්‍යයතන යුගයේ සභා ප්‍රතිසංස්කරණය තුළ බිහි වූ විවිධ සභාවන් කෙසේ පාලනය වනවාද යන්න ඉදිරිපත් කරන ලදි. මෙම නිකායන් ලංකාවට හඳුන්වා දුන් යුරෝපීයන් මෙම තර්ක ලාංකිකයන්ට ද එලෙසම හඳුන්වා දුන් අතර ඒවා ඉතා වැදගත් ලෙස අවධාරණය කරන ලදි

.

මේ නයින් බලන කළ ශ්‍රී ලංකාවේ කිතුණුවන්ගේ කාර්ය භාරය විය යුත්තේ ජේසුස්වහන්සේගේ ඉගැන්වීම් මත ශ්‍රී ලාංකික කිතුණුවන් විමට මනුෂ්‍යයන් යොමු කිරීමයි. මේ සඳහා විවිධ නිකායන් තුළ මුල්බැස ඇති ශ්‍රී ලාංකික කිතුණුවන්ට නොතේරෙන අර්ථවත් නොවන තර්ක පසෙකලා ප්‍රායෝගිකව කලහැකිදේ කිරීමට වග බලාගත යුතුය.

## 8.2. විවිධ ආගම් සහ සංස්කෘතීන් කෙරෙහි කිතුණු ආකල්පය.

ලංකාව වැනි බහු ආගමික සමාජයක කිතුණුවන් විවිධ සංස්කෘතීන් තුල ඇති ආගම් මධ්‍යයේ ජීවත් වෙති. ආගම මෙම තත්ත්වය තුල විවිධ සංස්කෘතීන්ට තෙවැදෑරුම් අභාෂයක් ඇති කරයි. මෙම තෙවැදෑරුම් තත්ත්වයන් නම්,

1. ඇදහිලි, චාරිත්‍ර, ආකල්ප සහ හැසිරීම් රටාවන්, ලෝකයේ ජීවත්වීමට ආකෘතියක් සපයන අතර ජීවිතය සහ ක්‍රියාකාරිත්වය අර්ථකතනය කර දක්වයි.



2. චාරිත්‍ර වාරිත්‍ර සහ විවිධ සම්ප්‍රදායික ක්‍රියාකාරිත්වයන් ජනතාව සංස්කෘතිය තුල සහභාගිත්වයට ගෙන එන අතර මනුෂ්‍යයන් එකිනෙකාට සහ සමාජයට සම්බන්ධ කරයි.

3. ද්‍රව්‍යමය සංස්කෘතිය තුළ භාෂාව, ආහාර, ඇඳුම් පැළඳුම්, සංගීතය යනාදී අංග විවිධ සංස්කෘතීන් තුළ අනන්‍යතාවයන් ගොඩ නගයි.

පැහැදිලිව මෙම තෙවැදෑරුම් තත්වයන් තුළ ආගම ඉතා වැදගත් වෙයි. එම නිසා එඬේරා විවිධ ආගම් අතර සම්බන්ධතා ශක්තිමත් කරන විටදී මෙම අංග තුනම සැලකිල්ලට ගැනීම ඉතා වැදගත් වෙයි.

මෙවැනි තත්වයක් බාහිරෙන් බැලුවිට කිතුණු දහම පවතින ආගම් වලින් එක ආගමක් වේ. මෙසේ ජීවත්වන විට ඒ ආගම් සමඟ නොයෙකුත් ආකාරයේ සම්බන්ධතා ඇති කර ගැනීමට අනිවාර්‍යයයෙන් සිදු වේ. මේ සම්බන්ධතා හිතකර හෝ අහිතකර විය හැකිය. එක් ආගමක් අන් සියළුම ආගම් අසත්‍යයයි කල්පනා කිරීම සහ අන් ආගම් වලට ගරු නොකිරීම බොහෝ ගැටුම්වල ආරම්භය වේ.

විවිධ ආගම් සහ සංස්කෘතීන් කෙරෙහි කිතුණු ආකල්පය ගැන පැහැදිලි අවබෝධයක් එඬේරා සතුවීම ඉතා වැදගත්ය. ලංකාව වැනි බහු ආගමික සහ සංස්කෘතික රටක බහුලත්වය තුළ ජීවත් වීමට සිදුවන එඬේරාට මෙය වඩාත්ම වැදගත් වේ.

මෙහිදී කිතුණුවෝ අනෙකුත් ආගම් හෙළා දැකිම කළ යුතු නොවේ. කිතුණුවන් තම ඇදහිල්ලට ගරු කරන්නාසේ ම අනෙකුත් ආගම්වල බැතිමතුනුත් තම ඇදහිලි වලට ගරු කරයි. ඔවුන්ගේ එම ගරුත්වය කිතුණුවන් ගරු කල යුතු වේ. මෙය ජේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට දුන් රන් අණ පිලිපැදීමකි. එනම් යමෙක් තමාට යම් දෙයක් කරනවාට තමා කැමති නම් ඒ දේම අන් අයටත් කරන්න යනුයි.

අවශ්‍යතාවයෙන් පෙළෙන අයට උපකාර කිරීම සහ ධර්මදූත සේවය කිතුණු ජීවිතයේ අනිවාර්ය අංග වුවත් උපකාර නිසා කිතුණුවීමට මනුෂ්‍යයන් යොමු කිරීම කිසිම විටක නොකටයුතු දෙයකි. මෙයට මූලික හේතුව මෙය කිතුණු දහමට පටහැනි වීමයි. මෙය සනාත කිරීමට කදිම උදාහරණ දෙකක් ජේසුස්වහන්සේගේ ජීවිතයෙන් ගෙනහැර දැක්විය හැකිය. ගල් රොටි කිරීම, පන්දහසකට කන්න දීම.

එසේ නම් කිතුණුවන් කළ යුත්තේ සම්බන්ධතාවයක් හෝ ආරවුලක් නැතිව ජීවත්වීමේ ප්‍රතිපත්තිය අන් ආගම් සම්බන්ධව දැරීම ද? මෙය බැලූ බැල්මට යහපත් සේ පෙනෙන නුමුත් එය සමාජයේ එකට ජීවත් වන විට මෙවැනි ප්‍රතිපත්තියක් භායානක ද විය හැකිය. විශේෂයෙන්ම මෙවැනි ප්‍රතිපත්තියක් තුළ එකිනෙකා අතර විශ්වාසය ගොඩ නැගෙන සම්බන්ධතා ඇති නොවන නිසා ආගම් අතර ආරවුල් සහ ආතතිය ඇති වන විට ඒවා වලින් ඇති විය හැකි ප්‍රතිඵල ඉතා භායානක විය හැකිය.

එසේ නම් මත භේද වලට තුඩු නොදෙන කටයුතු ඒකත්වයකදී පමණක් එකතුවීම කිරීම ප්‍රමාණවත් ද? මෙය ආගම් අතර කිසිදු සම්බන්ධයක් නොමැති වීමට වඩා ඵලදායි වන නුමුත් එය තීරණාත්මක අවස්ථාවල කලකිරීම ගෙනදිය හැකිය.

මෙවැනි තත්වයක් තුළ ආගමික සම්මිශ්‍රණය ප්‍රයෝජනවත් යැයි කෙනෙකු කල්පනා කළ හැකිය. එනම් සෑම ආගමකම යහපත් දේ යොදා ගනිමින් යම් ආකාරයක අලුත් ආගමක් ගොඩ නැගීමය. මෙවැනි තත්වයක් බොහෝ විට ආගමික සහජීවනයකට වඩා ආරවුලක් නිර්මාණය කිරීමට සමත් විය හැකිය. මෙයට මූලික හේතුව වන්නේ මෙයාකාර නිර්මාණයක් කිසිම පවතින ආගමකට අයත් නොවන අලුත් ආගමක් වීමයි. ආගම වෙනස්කල පමණින් සංස්කෘතිය වෙනස් නොවේ.

### 8.2.1. ආගමික සහජීවනය

ආගමික සහජීවනය යනු කුමක් ද? මෙයට මූලිකව පදනම් විය යුත්තේ එකිනෙකාගෙන් පෝෂණය වෙමින්, තර්ජනයක් නොවන ආකාරයෙන් ජීවත් වීමයි. මෙහිදී සෑම ආගමක් අදහන පුද්ගලයෙකුටම තම ආගම පුද්ගලිකව හෝ සාමූහිකව ඇදහීමටත් එය ප්‍රචාරය කිරීමටත් අයිතිවාසිකමක් ඇති බව තේරුම් ගත යුතු වේ. එහෙත් මනුෂ්‍යයන්ගේ දුගිකම හෝ අනෙකුත් අමාරුකම් උපයෝගි කර ගනිමින් ඔවුන් අයත්වන ආගම් වලට ගැරහීමත්, එමගින් ඔවුන්ගේ ආගම් වෙනස් කිරීමට පෙලඹවීමත් නොකළ යුතුය. සම්ප ඥාතින්ගේ වියෝවෙන් මානසිකව හා චෛතසිකව කැලඹීමට පත් මනුෂ්‍යයන්ගේ මෙම තත්වය උපයෝගි කරගෙන එම තත්වයෙන් මිදීමට ආගම වෙනස් කිරීමට අනුබල දීම සහජීවනයට උපකාර නොවේ. මේ තත්වය තුළ සහජීවනයෙන් ජීවත්වීමේදි ධර්මදූත කාර්ය භාරය කළ හැක්කේ කෙසේද?

සහජීවනයෙන් ජීවත් වන සමාජයක ධර්මදූත කාර්යභාරය ඉටුකළ යුත්තේ සහජීවනයෙන්මය. මෙහිදි ඉතා  වැදගත් වන ප්‍රතිපත්තියක් වන්නේ කිසිම මනුෂ්‍යයෙකුට ද්‍රව්‍යමය වාසි තකා ආගම් මාරු කිරීමට අනුබල නොදීමයි. යම් මනුෂ්‍යයෙක් ජේසුස්වහන්සේගේ ධර්මය ඇදහිමට තීරණය කළ විට එම පුද්ගලයා බෞව්තිස්ම කිරීමට පෙර ඔහු තම ජීවිත මාර්ගය කර ගැනිමට යන දහම පහදා දිම එඬේරා සතු වගකිමකි.

ඉන්පසු ඔහු හෝ ඇය කිතුණු සංඝයට ඇතුලත් වීමට බලාපොරොත්තු වේ නම් එය අභියෝගාත්මක ව්‍යායාමක් බව වටහාදිම එඬේරාගේ වගකිම වෙයි. මෑත යුගයේ දී දේශපාලන මැදිහත්වීමෙන් මනුෂ්‍යයන් ආගම් වෙනස් කිරිම සම්බන්ධයෙන් පනතක් පාර්ලිමේන්තුවෙන් සම්මත කර ගැනිමට විවිධ කණ්ඩායම් නොයෙකුත් උත්සහයන් දරණ ලදි.



### 8.3. සමාජ සන්දර්භය තුළ ආගමක් ලෙස කිතු දහමේ සමාජීය කාර්යභාරය.

සමාජීය කාර්යභාරය සම්බන්ධයෙන් සමාජ විද්‍යාඥයන් විවිධ මත පල කර තිබේ. මේ අතර ඩර්කයන් නම් විශාරදයා ප්‍රධාන තැනක් ගනී. පහත සඳහන් විස්තරය රොබට්සන් විසින් ඩර්කයින්ගේ මතය විග්‍රහ කරමින් ඉදිරිපත් කළ විස්තරයක සම්පින්ඩනයක් වෙයි.

1- සමාජ ඒකාග්‍රතාවය

සමාජය ඒකරාශි කිරීමේ බදාමයක් ලෙස ආගම ක්‍රියාත්මක වෙයි. ආගම බැතිමතුන්ව නිතරම චාරිත්‍ර වාරිත්‍ර සහ වත් පිළිවෙත් තුළ ඒකරාශි කරමින් පොදු වටිනා කම් සහ ඇදහිලි තුළ ඔවුන්ව ජන සමාජයක් හැටියට එකට බැඳ තැබීමට සමත් වෙයි.

2- අර්ථ සම්පාදනය

ආගම පැවැත්ම පිළිබඳ සදාතන පැනයන්ට අර්ථවත් පිළිතුරු සපයයි. විශ්වය තුළ මානුෂික පැවැත්ම සහ පරමාර්ථ ගැන හේතු දක්වමින් මිනිස් දිවි පෙවෙත සාරවත් කරයි.

3- සමාජ පාලනය

සමාජ ජීවතයේ වැදගත් වන මනුෂ්‍ය ජීවිතය සම්බන්ධව, ලිංගික ක්‍රියාකාරිත්වයන් සම්බන්ධව සහ දේපල සම්බන්ධව සමාජයේ පවතින වටිනාකම් සහ මිනුම් දඬු  නීතියෙන් පමණක් නොව ආගමික ධර්මයන්ගෙන් ද පාලනය වෙයි. බයිබලය, කුරාණය වැනි පොත් සාමාන්‍යය පොත් හැටියට සලකනු ලැබුවෙහි නම් මනුෂ්‍යයන් කෙරෙහි මේ පොත් කරන බලපෑම අවම විය හැකිය. එහෙත් මේවා ශුද්ධ පොත් නිසා පුද්ගලයන්ගේ හැසිරීම යම් තාක් දුරට ධර්මයන් තුලින් පාලනය වෙයි.

4- සමාජ පරිවර්තනය


සමහර අවස්ථා වලදී ආගම් සමාජ විපර්යාස වලට අවශ්‍යය පසුබිම සකසා ඒ සඳහා අවශ්‍ය උද්යෝගය ලබා දෙයි. සමාජයේ පවතින්නා වූ ව්‍යුහයන් ආගම් වල ඇති වටිනා කම් සහ සදාචාරාත්මක මිණුම් දඬු වලින් ඇගයීමකට ලක් වෙයි. විශේෂයෙන් නව ආගමික ව්‍යාපාර පවතින සමාජ ක්‍රමයන් නිතර විවේචනය කරන අතර තම අනුගාමිකයන්ව සමහර සමාජ යථාර්තයන්ට අභියෝග කිරීමට යොමු කරයි.

5- මානසික ධෛර්‍යය

මේ ලෝකයේ ඇති අස්ථිර භාවය තුල පුද්ගලයන්ට අවශ්‍ය මානසික ධෛර්‍යය ආගම් විසින් සපයා දෙනු ලබයි. මෙහිදී විශේෂයෙන්ම උපත්, විවාහ සහ මරණ වලදී ආගමික දායකත්වය ගෙන හැර දැක්විය හැකිය. සමාජය තුල අර්ථවත් සහ ක්‍රියාකාරි හැම ආගමක්ම කිසියම් ප්‍රමාණයකට ඉහත කාරණා සපුරා ලනු ලැබේ.

6- මායිම් නඩත්තුව සහ පරිවර්තනය

සමගි කිරිමේ සේවය තුළදී සමාජයේ නිරන්තරයෙන් සිදුවන මායිම් නඩත්තුව සහ පරිවර්තනය ඉතා වැදගත් ස්ථානයක් ගනි. මනුෂ්‍යයන්ගේ පුද්ගලික, කණ්ඩායම් සහ සමාජීය අනන්‍යතාවයන් මේ කරුණු කෙරෙහි සෘජුවම බලපානු ලැබේ. එඬේර සේවය තුළදී මේ යථාර්තයන් ගැන පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම හා සේවය සඳහා පන්නරයක් ලැබීමට ඉතා වැදගත් වෙයි.



1. Phan, P. C. (2002), *Asian Catholics in the United States: Challenges and Opportunities for The Church*, The Catholic University of America, < http://members.cox.net/vipr/bao/asiancat.html >

(සිංහල පරිවර්ථනය කර්තෘගෙනි)

2. Robertson I. 1983- Sociology, 2nd edition, P.407, Worth Publishers Inc. New York 10016



## ආශ්‍රිත ග්‍රන්ථ සහ අන්තර්ජාල ලිපිනයන්

01. JohnMacquarrie, Principles of Christian Theology, London: SCM, 1966. < http://www.religiononline.org >

02. Paul Tillich, Systematic Theology, 3 vols., Chicago: University of Chicago Press, 1951. <http://www.religiononline.org>

03. Bond, G. D. (1988), The Buddhist revival in Sri Lanka, Motilal Banarsidass publishers private limited, Delhi.

04. Buddhism Transformed: Religious Change in Sri Lanka by Edmund Perry The Journal of the America Vol.117 No.2 April-June 1997 COPYRIGHT 1997 American Oriental Society.

05. Chandrakanthan, A.J.V. (1995), Catholic revival in post-colonial Sri Lanka. Social and economic development centre Colombo, Sri Lanka

06. Gombrich, R.F.(1988), Theravada Buddhism: A social history from ancient Benares to modern Colombo, London and New York.

07. Houtart F. (1974) Religion and ideology in Sri Lanka, Hansa Publishers Colombo-3.

08. Kolamunne T. (1985) Catholic Church in Sri Lanka ( In Sinhala), Saranga Press, Ragama, Sri Lanka.

09. Macquarrie, J. & Childress, J. (Edited)(1986) A new dictionary of Christian ethics, SCM Press Ltd. 26-30 Tottenham Road London NI 4BZ.

10. Richardson A. & Bowden J. (1987) A new dictionary of Christian Theology, SCM press Ltd.26-30, Tottenham Road, London NI 4BZ.

11. Roberts, M. ( Edited) (1979),Collective identities, nationalism and protest in modern Sri Lanka. ,(Chapter VII by Gananath Obeyesekere), Marga Institute, 61, Isipatana Mawatha, Colombo 5, Sri Lanka.

12. Somaratna G.P.V. (1982) Christian religion in Sri Lanka (In Sinhala), Deepani publisher, 464,High level road, Gangodavila, Nugegoda.

13. Somaratna, G. P. V.(1992), Sri Lankan Church History (In Sinhala) , Marga Sahodaratvaya, Nugegoda.

**14** අබේසිංහ නිහාල්, ක්‍රිස්තියානි ශාසනය හා සාමාජ ධර්මතා, සරණ මුද්‍රණාලය, දෙහිවල.

**15.** සෝමරත්න. ජී.වී.පී.2015, ක්‍රිස්තු ශාසනයට විද්‍යාවෙන් අභියෝග අලෝකන යුගය, Saeronam Presbyterian church, south koriya.+